ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1964.9.11 දින අංක 14,166 දින රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාර පොළොන්නරුව නව නගරයේ ඇති රජයේ ඉඩම් වෙළඳ කටයුතු සඳහා 1964.10.19 දින පොළොන්නරුව දිසාපතිතුමා විසින් දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ වෙන්දේසි කරන්නට යෙදුණු බව එතුමා දන්නවාද? (ආ) එකී වෙන්දේසියෙන් කිහිප දෙනෙකු නියමිත මුදල් ගෙවා අවශ්‍ය ගිවිසුම් පත් අත්සන් කර ඉඩම් කට්ටි ලබාගත් අතර, කරුණු එසේ තිබියදී 66.6.9 දින අංක 14,699 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉඩම් කොමසාරිස්තුමාගේ අංක 4/10/5/01 දරන නිවේදනය අනුව 66.7.11 දින නැවත වරක් යථෝක්ත ඉඩම් කට්ටි වෙන්දේසි කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හේමචන්ද්‍ර සිරිසේන මයා.]

නට යෙදුණු බව එතුමා දන්නවාද? (ඉ) එසේ නම්, පළමු වෙන්දේසියෙන් ඉඩම් කට්ටි මිළදී ගෙන ගිවිසුම් පත් පවා අත්සන් කර, ගොඩනැගිලි ඉදි කිරීම සඳහා ඇස්තමේන්තු සහ සැලසුම් බලාපොරොත්තුවෙන් සිටි ඒ ඒ පුද්ගලයින් වෙත කිසිදු දැන්වීමක් නොකර නැවත වරක් එම ඉඩම්ම වෙන්දේසි කිරීම යුක්ති සහගත නොවන බව එතුමා දන්නවාද? (ඊ) මේ අනුව පළමුවැනි වෙන්දේසියෙන් ඉඩම් මිළදී ගත් අයගේ අයිතිය කෙටුම්පත් වේද? (උ) එසේ නම්, ඒ කෙසේද? කවදාද? (ඌ) නොඑසේ නම්, ඒ මන්ද? (එ) ඔවුන් සඳහා එතුමා ගන්නා පියවර කුමක්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) 11.9.64 ஆம் தேதியிடப்பட்ட 14,166 ஆம் இலக்கத்தினையுடைய அரசாங்க வர்த்தமானி அறிவித்தலுக்கமைய பொலன்னறுவைப் புதிய பட்டணத்திலுள்ள முடிக்குரிய காணிகளை வர்த்தக நோக்கங்களுக்காக நீண்டகாலக் குத்தகைக்குக் கொடுப்பதற்கு பொலன்னறுவை அரசாங்க அதிபர் 19. 10. 64 ஆம் தேதியன்று ஏல விற்பனை செய்தாரென்பதை அவர் அறிவாரா? (ஆ) குறிக்கப்பட்ட பணத்தைச் செலுத்தி ஒப்பந்தங்களிற் கைச்சாத்திட்டதன் பின்னர் தமக்கு ஒதுக்கப்பட்ட காணிப் பகுதிகளைச் சிலர் பெற்றுக்கொண்டதன் பின்னர் 9. 6. 66 ஆம் தேதியிடப்பட்ட 14,699 ஆம் இலக்கத்தினையுடைய அரசாங்க வர்த்தமானியில் வெளியிடப்பட்ட காணி ஆணையாளரது 4/10/5/01 ஆம் இலக்க அறிவித்தலின் நியதிகட்கமைய அக்காணிப் பகுதிகள் 11. 7. 66 ஆம் தேதியன்று மீண்டும் ஏல விற்பனை செய்யப்பட்டன என்பதை அவர் அறிவாரா? (இ) முன்னைய ஏல விற்பனையில் தமது காணிப் பகுதிகளைப் பெற்று உடன்படிக்கைப் பத்திரங்களிற்கூடக் கைச்சாத்திட்டதன் பின்னர் அவற்றில் கட்டடங்களை நிறுவும் நோக்குடன் அவற்றிற்குரிய மதிப்பீடுகள், திட்ட அமைப்புக்கள் ஆகியவற்றை எதிர்பார்த்திருந்தவர்களுக்கு எத்தகைய அறிவித்தல்களும் இடப்படாது அதே காணிப் பகுதிகளை மீண்டும் ஏல விற்பனை செய்வது நியாயமற்றதென்பதை அவர் அறிவாரா? (ஈ) முதலாவது ஏல விற்பனையில் காணிகளை வாங்கியோரது உரிமைப்பத்திரங்கள் பதிவு செய்யப்படுமா? (உ) ஆமெனில் எப்படி? எப்பொழுது? (ஊ) இல்லையெனில் ஏன்? (எ) அவர்களது விடயத்தில் அவர் என்ன நடவடிக்கைகள் எடுப்பார்?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that the Government Agent, Polonnaruwa, auctioned for commercial purposes on 19.10.64 the Crown lands in the Polonnaruwa New Town on long lease terms in accordance with a notice in Government Gazette No. 14,166 of 11.9.1964? (*b*) Is he aware that while some people had taken possession of the allotments after having made the prescribed payments and signed the agreements, those allotments were reauctioned on 11.7.66 in terms of notice No. 4/10/5/01 of the Land Commissioner published in Government Gazette No. 14,699 of 9.6.66? (*c*) Is he aware that it is unreasonable to auction those same allotments without any intimation whatsoever to those people who were awaiting estimates and plans to put up buildings after having bought their allotments at the previous auction and even signed the agreement forms? (*d*) Hence, will the titles of those who bought the land at the first auction be registered? (*e*) If so, how and when? (*f*) If not, why? (*g*) What steps will he take in regard to them?

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. சீ. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

(අ) ඔව්. (ආ) 64.10.19 දින පැවැත්වුණු වෙන්දේසියේදී හත්දෙනෙක් සාර්ථක ලෙස ඉල්ලුම් කළහ. නැන්පත් මුදල් වශයෙන් නියම කර ඇති මුදලද ඔවුන් විසින් ගෙවා ඇත. ඉඩම් කට්ටි ඉතා කුඩා බවටත් මෙම ඉඩම් කොටස නැවත වරක් විශාල ඉඩම් කට්ටිවලට කඩා වෙන්දේසි කළ යුතු බවටත් වෙන්දේසියේදී හා ඉන් පසුවද කරුණු ඉදිරිපත් කරනු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලැබිනි. මෙසේ කට්ටි කඩා 66.7.11 වන දින නැවත වරක් වෙන්දේසි කරන ලදී. 1964 දී මිලට ගන්නා ලද ඉඩම් කට්ටි 7 ද ඇතුළත් වන මෙම විශාල ඉඩම් කට්ටි 1964 වෙන්දේසියේ සාර්ථක ඉල්ලුම් කරුවන් 7 දෙනා සඳහා වෙන් කර තබන ලදී. (ඉ) පැන නොනගී. (ඊ) අදාල පුද්ගලයින් 7 දෙනාට සහ 1966 වෙන්දේසියේදී සාර්ථක ලෙස ඉල්ලුම් කළ අනෙක් අයටද බදු නිකුත් කිරීමට යථා කාලයේදී ක්‍රියා කරනු ලැබේ. ඉහත පිළිතුරු අනුව (උ), (ඌ) සහ (එ) පැන නොනගී.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)
මුලින් වෙන්දේසියෙන් ලබාගත්ත කොටස් ඒ ආකාරයටම පළල් ලෙස ඒ ඒ උදවියටම දෙනවද? එසේ නැත්නම් ඒවා අත්හැර වෙන පළාතකින් ඉඩම් ලබා දෙන්ට කටයුතු පිළියෙළ කරනවද?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
තීරණය කර තිබෙන්නෙ, මුලින් වෙන් කරන ලද ඉඩම් කොටස් 7 තව ටිකක් පළල් කර අළුත් ඉඩනුත් ඊට එකතු කර කට්ටිකරුවන්ට බෙදා දෙන්ටයි.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)
එවිට මුල් වෙන්දේසියෙන් ඉඩම් ලබා ගත් උදවියටමද ඒවා සකස් කර දෙන්නෙ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ඒ උදවියටත් ලැබෙනව. දෙවනුව ඉල්ලන ලද කොටසටත් ලැබෙනව.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)
ඒ ඒ ස්ථානවලම, ඒ ඒ බිම් කොටස් ද?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ඔව්.

## රජයේ ඡායාරූප ශිල්පීන් : වැටුප්
### அரசாங்க படப்பிடிப்பாளர் : சம்பளம்
### GOVERNMENT PHOTOGRAPHERS : SALARIES

6. **ඩී. එස්. සමරසිංහ මයා.** (කොලොන්නාව)
*(திரு. டீ. எஸ். சமரசிங்க—கொலன்னாவ)*
(Mr. D. S. Samarasinghe—Kolonnawa)
මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රජයේ ඡායාරූප ශිල්පීන් සඳහා නියමිත වැටුප් ක්‍රමයක් සකස් කර තිබේ දැයි එතුමා සඳහන් කරනවා ද? (ආ) එම සේවකයන් ශ්‍රේණි වශයෙන් බෙදා වෙන් කිරීමේදී සොයා බැලූ සුදුසුකම් මොනවා ද? (ඉ) රජයේ ඇතැම් ඡායාරූප ශිල්පීන්ගේ ශ්‍රේණීන් දැනට එම තනතුරු දරන අයට පුද්ගල වනසේ තැබීමෙන් මේ ඡායාරූප ශිල්පීන්ට අසාධාරණයක් ඇති වී තිබෙන බැව් එතුමා දන්නවා ද? (ඊ) එම අසාධාරණය නිසා ඔවුන්ගේ විශ්‍රාම වැටුප් වලට හානියක් ඇති වන බැව් එතුමා දන්නවා ද? (උ) ඡායාරූප ශිල්පීන්ට සිදු වන එම හානිය ඉවත් කිරීමට එතුමා ගෙන තිබෙන පියවර කුමක් ද? (ඌ) ඇතැම් දෙපාර්තමේන්තුවල ඡායාරූප ශිල්පීන්ට ඔවුන්ගේ සේවය, දක්ෂකම හා කාර්යය අනුව සලකා වැටුප් ක්‍රම ඇති කර නැති බැව් එතුමා දන්නවා ද? (එ) දැනට සකස් කර ඇති 1. රු. 960—72—2,688 2. රු. 1,860—120—3,780 3. රු. 2,820 —9 × 120—8 × 180—5,340 4. රු. 3,900, —180—5,340 යන පඩි ක්‍රමය යටතේ ඉහළම පඩිය ලබා ගැනීමට සේවකයෙකුට හැකියාවක් නැති බැව් එතුමා දන්නවාද? (ඒ) මේ ගැන එතුමා ක්‍රියා කරනවා ද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) அரசாங்க படப்பிடிப்பாளர்களுக்கெனச் சம்பளத் திட்டமொன்று வகுக்கப்பட்டுள்ளதா என்பதை அவர் கூறுவாரா? (ஆ) இவ்வூழியர்களைத் தரம் வகுத்த பொழுது எத்தகைய தகைமைகள் கருத்திற்கொள்ளப்பட்டன?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එස්. සමරසිංහ මයා.]

(இ) தற்பொழுது இப்பதவியில் இருப்பவர்களுக்குத் தனிப்பட்ட சில பதவிகள் ஏற்படுத்தப்படுவதன் விளைவாய் இப்படப்பிடிப்பாளர்களுக்கு அநீதி இழைக்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா? (ஈ) இவ்வநீதியின் விளைவாய் அவர்களுக்குரிய இளைப்பாற்றுச் சம்பளம் பாதிக்கப்படுகிறதென்பதை அவர் அறிவாரா? (உ) இவ்வநீதியை அகற்றுவதற்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை? (ஊ) சில திணைக்களங்களில், படப்பிடிப்பாளர்களின் சேவை, திறமை, அவர்கள் செய்த வேலை ஆகியவற்றைக் கருத்திற்கொண்டு அவர்களது சம்பளத்திட்டங்கள் வகுக்கப்படவில்லையென்பதை அவர் அறிவாரா? (எ) 1. 960 × 72 × 2,688 2. 1,860 × 120 × 3,780 3. 2,820 × 9-120 × 8-180 × 5,340 4. 3,900 × 180 × 5,340 ஆகிய தற்பொழுதுள்ள சம்பளத் திட்டத்தின் உச்ச எல்லையை ஒரு ஊழியரால் பெற முடியாதென்பதை அவர் அறிவாரா? (ஏ) இவ்விடயம் சம்பந்தமாய் அவர் நடவடிக்கை எடுப்பாரா?

asked the Minister of Finance: (*a*) Will he state whether an appropriate scale of salary in respect of Government photographers has been drawn up? (*b*) When these employees were graded what qualifications were taken into account? (*c*) Is he aware that an injustice has been done to these photographers as a result of certain posts being made personal to the present holders? (*d*) Is he aware that by reason of this injustice their pension is affected? (*e*) What steps have been taken by him to remove this injustice? (*f*) Is he aware that in certain departments salary scales of photographers have not been drawn up considering their service, efficiency and the work done by them? (*g*) Is he aware that it is not possible for an employee to reach the maximum of the present scale, viz.,

1. Rs. 960—72—2,688
2. Rs. 1,860—120—3·780
3. Rs. 2.820—9—120—8—180—5,340
4. Rs. 3,900—180—5,340

(*h*) Will he take action regarding this matter?

**එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance)

(අ) ඔව්. ශ්‍රේණිගත කිරීමේ කාර්යය සඳහා පත් කරන ලද ශිල්පීය කමිටුවක නිර්දේශයන් අනුව රාජ්‍ය සේවයේ නියුක්ත සියළුම ඡායාරූප ශිල්පීන් මෑතකදී ශ්‍රේණිගත කරනු ලැබ සිටිති. (ආ) මේ ශ්‍රේණිගත කිරීම කර ඇත්තේ, තනතුරු සඳහා අවශ්‍ය වන සුදුසුකම් පළපුරුද්ද හා දක්ෂතාද, ඔවුන්ගේ කාර්යයන් හා වගකීම්ද පදනම් කරගෙනය. (ඉ) තනතුරුවල ශ්‍රේණිය පහත් කරන ලද අවස්ථාවල, සේවය කරමින් සිටින නිලධාරීන්ගේ වැටුප් ඔවුන්ට පෞද්ගලික වන පරිදි, තවදුරටත් තබා ගැනීමට ඉඩ දී ඇත. (ඊ) නැත. (උ) මේ ප්‍රශ්නය පැන නොනඟී. (ඌ) මේ කමිටුවේ නිර්දේශයන්ට විරුද්ධව ඉදිරිපත් කරන ලද ඇතැම් නියෝජනයන් ගැන පරීක්ෂා කරගෙන යනු ලැබේ. (එ) දැනට බලපවත්වන වැටුප් ක්‍රම මෙසේය:

(1) රු. 4,080—360×12—8,400 (2) රු. 3,900—180×8—5,340 (3) රු. 1,620—120×18—3,780 (4) රු. 960—72×24—2,688 (5) රු. 834—42×3, 72×17—2,184 (6) රු. 750—42×13—1,296 (7) රු. 660—30×9, 18×1—948 (8) රු. 540—30×8, 24×1—804 වේ. ඉහළ වැටුප් ක්‍රමයට පරිවතර්නය කිරීමේදී සාමාන්‍ය පිළිවෙතම අනුව, නිලධාරියෙකු දැනට ලබන වැටුපට ආසන්නම, ඉහළ වැටුප් ක්‍රමයේ වැටුප් පියවර ලබාදී තිබේ. අළුත් වැටුප් ක්‍රමයේ උපරිම වැටුපට ඔවුනට පැමිණිය හැකිවේද යන්න ඔවුන්ගේ වයස් මත රඳා පවතිනු ඇත. (ඒ) මෙය පැන නොනඟියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පෞද්ගලික ආරෝග්‍යශාලා හා සාත්තු නිවාස සේවක සංගමය

தனிப்பட்டவைத்தியசாலைகள் மருத்துவ மனைகள் ஊழியர் சங்கம்

## PRIVATE HOSPITALS' AND NURSING HOMES' EMPLOYEES UNION

7. **ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)*

(Mr. Lakshman Jayakody—Divulapitiya)

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පෞද්ගලික ආරෝග්‍යශාලාවල හා සාත්තු නිවාසවල සේවකයින්ගේ වැටුප් හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පෞද්ගලික ආරෝග්‍යශාලා හා සාත්තු නිවාස සේවක සංගමයේ නියෝජිත පිරිසක් 1966.2.25 වැනි දින එතුමා හමුවූයේද? (ආ) ඔවුන්ගේ දුක්ගැනවිලි ගැන සළකා බැලීම සඳහා නුදුරු අනාගතයේදී පඩි පාලක මණ්ඩලයක් පත් කරන බවට එම නියෝජිත පිරිසට එතුමා ප්‍රතිඥාවක් දුන්නේද? (ඉ) එසේ නම්, මෙතෙක් ගෙන ඇති ක්‍රියා මාර්ගය කුමක් ද? (ඊ) 1966.4.3 වැනි දින මෙම සංගමය 1966.2.25 වැනි දින ඔවුන් සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව කෙරෙහි එතුමාගේ අවධානය යොමු කරන ලද්දේද? එයට එතුමා යැවූ පිළිතුර කුමක්ද?

*தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா: (அ) சம்பளங்கள், சேவை நிபந்தனைகள் ஆதியன சம்பந்தமாய் தனிப்பட்ட வைத்தியசாலைகள், மருத்துவமனைகள் ஊழியர் சங்கத்தைச் சேர்ந்த தூதுக்குழு ஒன்றினை 25. 2. 66 ஆம் தேதியன்று அவர் சந்தித்தாரா? (ஆ) அவர்களது குறைபாடுகள் சம்பந்தமாய் ஆலோசனை செய்வதற்கென அதிவிரைவில் சம்பளச் சபையொன்றினை அவர் நியமிப்பதாக அக்குழுவிற்கு அவர் வாக்குறுதியளித்தாரா? (இ) ஆமெனில் இதுவரை எடுக்கப்பட்ட நடவடிக்கை என்ன? (ஈ) 25. 2. 66 ஆம் தேதியன்று அவரைப் பேட்டிகண்ட விடயம் சம்பந்தமாய் 3. 4. 66 ஆம் தேதியன்று மேற்படி சங்கம் அவரது கவனத்திற்குக் கொண்டு வந்ததா? அது சம்பந்தமாய் அவரனுப்பிய பதிலென்ன?*

asked the Minister of Labour, Employment and Housing: (*a*) Did he meet a deputation from the Private Hospitals and Nursing Homes Employees Union on 25.2.66 regarding their salaries and conditions of service? (*b*) Did he assure the deputation that he will appoint a wages board to consider their grievances in the near future? (*c*) If so, what action has been taken so far? (*d*) Did the union, on 3.4.66, invite his attention to their interview of 25.2.66 and what was his reply?

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. S. de S. Jayasinghe—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

(අ) ඔව්. (ආ) නැත. මෙම කරුණ පිළිබඳව සොයා බලන බව මා ඔවුන්ට දැනුම් දුන්නෙමි. (ඉ) මේ ප්‍රශ්නය පිළිබඳව දැනට පරීක්ෂා කරගෙන යයි. (ඊ) නැත.

## රජයේ ආධාර ලබන මැහුම් වැඩ පාසල්වල සේවය කරන මැහුම්වැඩ ගුරුවරියන්

அரசாங்க உதவிபெறும் தையல் வேலைப் பாடசாலைகளிலுள்ள தையல் வேலை ஆசிரியர்கள்

## NEEDLEWORK TEACHERS IN GOVT. ASSISTED NEEDLEWORK SCHOOLS

8. **ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රජයේ ආධාර ලබන මැහුම් වැඩ පාසැල්වල සේවය කරන මැහුම් වැඩ ගුරුවරියන් 46 දෙනෙකු පමණ සිටින බවත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් හා ඔවුන්ට තිබෙන අනිකුත් පහසුකම් රජයේ මධ්‍යස්ථානවල සිටින ගුරුවරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

යන්ට තිබෙන වැටුප් අයිතිවාසිකම් හා පහසුකම් සමග සම තත්ත්වයේ නැති බවත් එතුමා දන්නවා ද? (ආ) මෙම අය රජයේ ගුරුවරියන් වශයෙන් මධ්‍යස්ථාන වලට බඳවා ගෙන ඔවුන්ට හිමි සියලුම පහසුකම් දීමට එතුමා කටයුතු කරනවා ද? (ඉ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) அரசாங்க உதவியுடன் இயங்கும் தையல் வேலைப் பாடசாலைகளில் ஏறக் குறைய 45 தையல் வேலை ஆசிரியர்கள் கடமையாற்றுகின்றனர் என்பதையும் அவர் களுக்குரிய இளைப்பாற்றுச் சம்பள உரிமை களும் ஏனைய வசதிகளும் அரசாங்க தையல் நிலையங்களில் உள்ள ஆசிரியர்களின் தரத்தை ஒத்தன அல்லவென்பதையும் அவர் அறி வாரா? (ஆ) அவ்வாசிரியர்களை அரசினர் நிலையங்களில் அரசாங்க ஆசிரியர்களாக நிய மிப்பதற்கும் அவர்களுக்குரிய வசதிகளனைத் தையும் ஏற்படுத்திக்கொடுப்பதற்கும் அவர் நடவடிக்கைகள் எடுப்பாரா? (இ) இல்லை யெனில் ஏன்?

asked the Minister of Home Affairs: (*a*) Is he aware that there are about 46 needlework teachers in Government assisted needlework schools and that their pension rights and other facilities are not on par with teachers in Government centres? (*b*) Will he take steps to absorb these teachers into centres as Government teachers and grant all the facilities due to them? (*c*) If not, why?

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)**

(*கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்*)

(The Hon. Dr. W. Dahanayake—Minitser of Home Affairs)

(අ) ඔව්; රජයේ ආධාර ලබන මැහුම් පාසල්වල සේවය කරන මැහුම් වැඩ ගුරුවරියන් ගණන 44 කි. (ආ) නැත. (ඉ) මේ යෝජනාව සලකා බලනු ඇත. දැනට එවැනි වැඩ පිළිවෙලක් අවශ්‍යයයි සලකනු නොලැබේ.

## රජයේ මෝටර් රථ ලබා ඇති ඇමතිවරු හා පාර්ලිමේන්තු ලේකම්වරු

அரசாங்க கார்கள் பெற்றிருக்கும் அமைச்சர்களும் பாராளுமன்றக் காரியதரிசிகளும்

## MINISTERS AND PARLIAMENTARY SECRETARIES USING GOVERNMENT CARS

9. **නීල් ද අල්විස් මයා.** (බද්දේගම)

(*திரு. நீல் டி அல்விஸ்—பத்தேகம*)

(Mr. Neal de Alwis—Baddegama)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: එක් එක් ඇමතිවරයාට හා පාර්ලිමේන්තු ලේකම්වරයාට සිය ප්‍රයෝජනය සඳහා දී තිබෙන රජයේ මෝටර් රථයේ ලියාපදිංචි අංකය හා එම රථයේ වර්ගය ඇතුළුව කාර් ලබා දී තිබෙන ඇමතිවරුන්ගේ හා පාර්ලිමේන්තු ලේකම්වරුන්ගේ නාම ලේඛනයක් එතුමා ඉදිරිපත් කරනවාද?

நிதி அமைச்சரைக் கேட்ட வினா: பாவனைக் கென அரசாங்கத்தால் கார்கள் வழங்கப்பட் டுள்ள அமைச்சர்கள், பாராளுமன்றக் காரிய தரிசிகள் ஆகியோரது பெயர்களையும் அவர் கள் ஒவ்வொருவருக்கும் வழங்கப்பட்டுள்ள கார்களில் பதிவிலக்கம், இனம் ஆகியவற்றை யும், உள்ளடக்கிய நிரலொன்றினை அவர் சமர்ப்பிப்பாரா?

asked the Minister of Finance: Will he table a list of names of Ministers and Parliamentary Secretaries who have been allocated Government cars for their use, with the registered number and make of the vehicle allocated to the respective Minister and Parliamentary Secretary?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)
පිළිතුර මම සභා මේසය මත තබනව.

**සභා මේසය මත තබන ලද පිළිතුර මෙසේය :**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு :*
*The Answer tabled is as follows :*

ගරු අග්‍රාමාත්‍යතුමා හැරුණු විට හුදෙක් ගරු ඇමතිවරුන්ගේ සහ පාර්ලිමේන්තු ලේකම්වරුන්ගේම පාවිච්චිය සඳහා කාර් වෙන්කර දී නැත. කෙසේ වෙතත් රාජකාරී ගමන් සඳහා ගරු ඇමතිවරුන් හා පාර්ලිමේන්තු ලේකම්වරුන් විසින් ඒ ඒ අමාත්‍යාංශවලට හා දෙපාර්තමේන්තුවලට අයත් කාර් පාවිච්චි කරනු ලැබේ. පහත දක්වා ඇත්තේ අදළ ගරු ඇමතිවරුන් හා පාර්ලිමේන්තු ලේකම්වරුන් විසින් සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන කාර්ය.

(I) ඇමතිවරු

| නම | රථයේ ලියා පදිංචි කළ අංකය | වර්ගය |
|---|---|---|
| 1. ගරු ඩඩ්ලි සේනානායක මහතා, ... අග්‍රාමාත්‍ය හා රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර ඇමතිතුමා | ... 4 ශ්‍රී 8631 | ... හම්බර්හෝර්ක් |
| 2. ගරු යූ. බී. වන්නිනායක මහතා, ... මුදල් ඇමතිතුමා | ... 4 ශ්‍රී 7568 | ... පර්ජියෝ 404 |
| 3. ගරු ඇම්. තිරුචෙල්වම් මහතා, ... පළාත් පාලන ඇමතිතුමා | ... 4 ශ්‍රී 8148 | ... වෝක්ස්වැගන් |
| 4. ගරු අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල මහතා, අධ්‍යාපන හා සංස්කෘතික ඇමතිතුමා, (1966 සැප්තැම්බර් සිට මාස තුනක කාලයකට) | ... 4 ශ්‍රී 7528 | හම්බර් සුපර්ස්නයිප් |
| 5. ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක, ... ස්වදේශ කටයුතු ඇමතිතුමා (1966.8.17 වැනි දින සිට) | ... 4 ශ්‍රී 8640 | ... ෆෝර්ඩ්කොර්ටිනා |
| 6. ගරු ඇම්. ඩී. බණ්ඩා මහතා, ... කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා | ... 4 ශ්‍රී 8431 | ... පර්ජියෝ 404 |
| 7. ගරු ඇම්. ඩී. එච්. ජයවර්ධන මහතා, සෞඛ්‍ය ඇමතිතුමා | ... 4 ශ්‍රී 8865 | ... පර්ජියෝ 404 |

(II) පාර්ලිමේන්තු ලේකම්වරු

| | | |
|---|---|---|
| 1. පී. සී. ඉඹුලාන මහතා, ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම් | ... 4 ශ්‍රී 8459 | ... හෝල්ඩන් |

*கனம் பிரதம அமைச்சரைத் தவிரப் பின் அமைச்சர்களுக்கும் பாராளுமன்றச் செயலாளர்களுக்கும் அவர்களின் உபயோகத்துக்குமட்டுமென மோட்டார் வண்டிகள் ஒதுக்கப்படவில்லை. எனினும் அமைச்சர் களும் பாராளுமன்றச் செயலாளர்களும் உத்தியோக முறையான பயணங்களில் அமைச்சுக்கும் திணைக்களங் களுக்குமுரிய மோட்டார் வண்டிகளை உபயோகிப்பர். கீழே கூறப்பட்டுள்ள மோட்டார் வண்டிகள் பொதுவாக அமைச்சராலும் பாராளுமன்றச் செயலாளராலும் பொதுவாக உபயோகிக்கப்படும்.*

| அமைச்சர் பெயர் | வண்டியின் பதிவு எண் | வண்டியின் வகை |
|---|---|---|
| 1. கனம் டட்லி சேனநாயக்கா, பிரதம அமைச்சரும் பாது காப்பு வெளிநாட்டு அலுவல் அமைச்சருப | 4 சிறீ 8631 .. | அம்பர்கோக் |
| 2. கனம். உ. ப. வன்னிநாயக்கா, நிதி அமைச்சர் .. | 4 சிறீ 7568 .. | பேஜோ 404 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| அமைச்சர் பெயர் | வண்டியின் பதிவு எண் | வண்டியின் வகை |
|---|---|---|
| 3. கனம் மு. திருச்செல்வம், உள்ளூர் ஆட்சி அமைச்சர் .. | 4 சிறீ 8148 .. | வோக்சுவாகன் |
| 4. கனம் ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல, கல்வி பண்பாட்டு அலுவல்கள் அமைச்சர் (1966 செற்றம்பர் தொடங்கி 3 மாதத்துக்கு) | 4 சிறீ 7528 .. | அம்பர் சுப்பர்சினிசோ |
| 5. கலாநிதி டபிள்யு. தகநாயக்கா, கனம் உண்ணுட்டு அலுவல் அமைச்சர் '17.8.66 தொடங்கி) | 4 சிறீ 8640 .. | போட் கோல்டின் |
| 6. கனம் எம். டி. பண்டா, உணவு, விவசாய அமைச்சர் .. | 4 சிறீ 8431 .. | பேஜோ 404 |
| 7. கனம் எம். டி. எச். ஜயவர்த்தன, சௌக்கிய அமைச்சர் .. | 4 சிறீ 8865 .. | பேஜோ 404 |

(II) பாராளுமன்றச் செயலாளர்

| | | |
|---|---|---|
| 1. பி. சி. இம்புலான அவர்கள், உணவு, விவசாய அமைச்சரின் பாராளுமன்றச் செயலாளர் | 4 சிறீ 8459 .. | ஒல்டன் |

There has been no allocation of cars for the exclusive use as such of Ministers and Parliamentary Secretaries, excepting the case of the Hon. Prime Minister. However, Ministry and departmental cars are used as and when required by the Ministers and Parliamentary Secretaries concerned for official travelling, the cars stated below being generally used by the Ministers and the Parliamentary Secretary concerned.

(I) MINISTERS

| *Name* | *Registered No. of Car* | *Make of Vehicle* |
|---|---|---|
| 1. Hon. Dudley Senanayake, Prime Minister and Minister of Defence & External Affairs .. | 4 Sri 8631 .. | Humber Hawk |
| 2. Hon. U. B. Wanninayake, Minister of Finance .. | 4 Sri 7568 .. | Peugeot 404 |
| 3. Hon. M. Tiruchelvam, Minister of Local Government .. .. .. | 4 Sri 8148 .. | Volkswagen |
| 4. Hon. I. M. R. A. Iriyagolle, Minister of Education and Cultural Affairs .. .. [For 3 months since September 1966] | 4 Sri 7528 .. | Humber Supersnipe |
| 5. Hon. Dr. W. Dahanayake, Minister of Home Affairs .. .. .. [From 17th August 1966] | 4 Sri 8640 .. | Ford Cortina |
| 6. Hon. M. D. Banda, Minister of Agriculture and Food .. .. .. | 4 Sri 8431 .. | Peugeot 404 |
| 7. Hon. M. D. H. Jayawardena, Minister of Health .. | 4 Sri 8865 .. | Peugeot 404 |

(II) PARLIAMENTARY SECRETARIES

| | | |
|---|---|---|
| 1. P. C. Imbulana, Esq., Parliamentary Secretary to the Minister of Agriculture and Food .. | 4 Sri 8459 .. | Holden |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

මට දැනගන්ට ඕනැ, පාර්ලිමේන්තු ලේකම්වරුන්ටයි ඇමතිවරුන්ටයි මේ රජයේ වාහන පාවිච්චි කරන්ට දී තිබෙන වාද කියා. ඒක දැනගත්තාම මට පුළුවන්, අතුරු ප්‍රශ්න තුනක් අහන්ට.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

රාජකාරිය අනුව පාවිච්චි කරන්ට පුළුවනි.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

පාර්ලිමේන්තු ලේකම්තුමා දන්නවද, පසුගිය ආණ්ඩුවේ ඇමතිවරුන්ට රජයේ වාහන දුන් විට මේ ආණ්ඩුවේ අය ඒක වැරදියි කියා ප්‍රකාශයක් කරල, ඒ වාහන ලොතරැයි කළ බව? [බාධාකිරීම්]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! When a Question is asked the Member asking it must have an opportunity of listening to the Answer, and Members should therefore not interrupt. Supplementary Questions could be asked and answered clearly when there are no interruptions.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

මම හිතන්නෙ, රාජකාරිය අනුව පාවිච්චි කළාට විරුද්ධ වුණේ නැහැ. නමුත් ඇමතිවරුන්ගේ පෞද්ගලික පාවිච්චිය සඳහා කාර් ගෙන්නෙව්වට විරුද්ධ වුණා.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

පාර්ලිමේන්තු ලේකම්තුමා දන්නවාද, ගිය අතුරු මැතිවරණයෙදි පාර්ලිමේන්තු ලේකම්තුමන්ල ඇමතිවරුන්ගෙ කාර් පාවිච්චි කළ බව? විශේෂයෙන් මා කියන්නෙ, කම්කරු ඇමතිතුමාගෙ කාර් එක පාවිච්චි කෙරුවය කියලයි.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

නැහැ. නැහැ.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

දන්නෙ නැහැ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You have asked three supplementary Questions.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I asked only two supplementary Questions.—[*Interruption.*]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Will you take my Order and sit down? You have asked three Questions.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

He asked only two Questions.—[*Interruption.*]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Will the hon. Member for Baddegama take my Order? I have made my Order. You have asked three Questions.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I asked only two Questions. It may be very embarrassing to the Government.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Please verify from HANSARD tomorrow.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

දැන් මේ ඇමතිවරු පාවිච්චි කරන රථ වාහන ඉදිරියෙදී ලොතරැයි කිරීමට මේ ආණ්ඩුව අදහස් කරනවද? [බාධා කිරීම්]

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

ඒ ප්‍රශ්නය පැන නඟින්නෙ නැහැ. [බාධා කිරීම්]

## කෙටුම්පත් පනත් පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்
### BILLS PRESENTED

**තේ (බදු සහ අපනයන පාලන) (සංශොධන) පනත් කෙටුම්පත**

*தேயிலை (வரி விதித்தலும் ஏற்றுமதியைக் கட்டுப்படுத்தலும்) (திருத்த) மசோதா*

TEA (TAX AND CONTROL OF EXPORT) (AMENDMENT) BILL

"to amend the Tea (Tax and Control of Export) Act, No. 16 of 1959".

පිළිගන්වන ලද්දේ මුදල් ඇමති ගරු යූ. බී. වන්නිනායක විසිනි. 1966 නොවැම්බර් 7 වන සඳුද දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

நிதி அமைச்சர் கௌரவ யூ. பி. வன்னிநாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1966 நவம்பர் 7 ஆம் திகதி திங்கட்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்படவேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. U. B. Wanninayake, Minister of Finance; to be read a Second time upon Monday, 7th November 1966, and to be printed.*

**රක්ෂණ පාලන (සංශෝධන) පනත් කෙටුම්පත**

*காப்புறுதி கட்டுப்பாட்டு (திருத்த) மசோதா*

CONTROL OF INSURANCE (AMENDMENT) BILL

"to amend the Control of Insurance Act, No. 25 of 1962".

පිළිගන්වන ලද්දේ මුදල් ඇමති ගරු යූ. බී. වන්නිනායක විසිනි. 1966 නොවැම්බර් 7 වන සඳුද දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

நிதி அமைச்சர் கௌரவ யூ. பி. வன்னிநாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1966 நவம்பர் 7 ஆம் திகதி திங்கட்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்படவேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. U. B. Wanninayake Minister of Finance; to be read a Second time upon Monday, 7th November 1966, and to be printed.*

## ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජාඥා පිළිබඳ විශෙෂ කාරක සභාව

### இலங்கை (பாராளுமன்றத் தேர்தல்கள்) அரசவைக் கட்டளைமீதான தெரிகுழு

### SELECT COMMITTEE ON CEYLON (PARLIAMENTARY ELECTIONS) ORDER-IN-COUNCIL

අ. භා. 2.26

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**
*(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරමි:

"ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජාඥවේ විධිවිධාන ක්‍රියාත්මක වන අයුරු ගැන සලකා බැලීම පිණිසත් මැතිවරණ පිළිබඳව දැනට බලපවත්වන නීති සහ සම්ප්‍රදායයන් සම්බන්ධයෙන් අවශ්‍යයයිද යෝග්‍යයයිද සලකනු ලැබූ වෙනස්කම් ගැන, පසුගිය මහා මැතිවරණය තුළදී ලබාගත් අත්දැකීම් අනුව නිර්දේශ කිරීම පිණිසත් විශේෂ කාරක සභාවක් පත් කළ යුතුය; කාරක සභාවට මන්ත්‍රීන් නම් කිරීම හා එහි ගණපූරණය නියම කිරීම කථානායකතුමා විසින් කළ යුතුය; අවශ්‍ය ලිපිලේඛනාදිය ගෙන්වා ගැනීමේ සහ අවශ්‍ය පුද්ගලයින් කැඳවීමේ බලය කාරක සභාවට තිබිය යුතුය; වරින්වර වාර්තා කිරීමටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රී මණ්ඩලය කල් තබනු ලැබුවත් රැස්වීම් පවත්වාගෙන යැමටත් කාරක සභාවට බලය තිබිය යුතුය."

හැම මහා මැතිවරණයකටම පසු මැතිවරණ කොමසාරිස්වරයා විසින් එම මැතිවරණය පිළිබඳව රපෝර්තුවක් ඉදිරිපත් කිරීම සිරිතයි. ඒ අනුව පසුගිය මහා මැතිවරණය පිළිබඳ රපෝර්තුව ගිය මාසයේදී අච්චු ගසා ප්‍රසිද්ධ කර තිබෙනව. ඒ බව ප්‍රකාශ කරන ගමන්ම මෙම යෝජනාව සභාව ඉදිරියෙහි තබන බව සඳහන් කරන්ට කැමතියි.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

வினா எடுத்தியம்பப் பெற்றது.

*Question proposed.*

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරන්ට යෙදුණු යෝජනාව පිළිබඳව විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් අතුරු සංශෝධනයක් ඉදිරිපත් කරන්ට අපි අදහස් කරනව. එම සංශෝධනය ඉදිරිපත් කරන්ට ප්‍රථමයෙන් ඒ පිළිබඳව අදහස් සවල්පයක් කෙටියෙන් මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්ට මා කල්පනා කරනව. සිරිතක් වශයෙන් හැම මහා මැතිවරණයකටම පසු ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන බව සභානායකතුමා විසින් කියන්ට යෙදුණා. ඒක සත්‍යයක්. එය අපි පිළිගන්නව. නමුත් කනගාටුව නම් පසුගිය මහා මැතිවරණයෙන් පසු ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්ට හුඟ කලක් ගත වී තිබීමයි. ඊට පසු අතුරු මැතිවරණ තුනකුත් පවත්වා තිබෙනව, මේ රටේ. මෙම කාරණය පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස්වරයාගේ වාතීාවට සීමා කිරීම වැරදිය යන්නයි අපේ අදහස. පසුගිය අවධියෙ මැතිවරණ නඩු කීපයකුත් පවත්වා තිබෙනව. ඒවායෙහි තීන්දුවල හරි වැරදි ගැන කතා කිරීමෙන් වැඩක් නැහැ. නමුත් අපේ නීති රීතිවල පවතින යම් යම් දුර්වලතාවයන් පිළිබඳව නඩුකාරවරුන් විසින් සඳහන් කර තිබෙන බව අපි දන්නව.



පොලිස් වාර්තාවලට අනුව නඩු පැවරීම ගැන සමහර නඩුකාරවරුන් තම අදහස් ප්‍රකාශ කර තිබෙනව. විශෙෂ නඩුවක් ගැන සඳහන් කරන්ට යනවා නොවෙයි මේ. නමුත් මෙම ක්‍රමය හොඳ මදි බව නඩුකාරවරුන් ප්‍රකාශ කර තිබෙනව. පොලිස් වාර්තා උඩ නඩු ගෙනියන ක්‍රමයෙහි දුර්වලතා තිබෙනව. අපි සිතමු පොලිස් කොස්තාපල් මහත්මයෙක් මැතිවරණ රැස්වීමකට ගියාය කියා. ඔහු එම රැස්වීමට ගොස් කඩදාසි කැබෙල්ලක මොකක් හරි ලියාගෙන පොලිස් මධ්‍යස්ථානයට ඇවිත් ඒ කඩදාසි කැබෙල්ල ඉරා දමා මොකක් හරි වාර්තා කරනව එම පොලිස් මධ්‍යස්ථානය භාරව සිටින පොලිස් ස්ථානාධිපතිවරයාට. නමුත් එම මැතිවරණයට තරඟ කරන අපේක්ෂක මහත්වරු ඒ පිළිබඳව කිසිවක් දන්නෙ නැහැ. එතන අපහාස කතාවක් කෙරුණාද නැද්ද යන්න ගැන කවුරුවත් දන්නෙ නැහැ. ඊළඟට ආණ්ඩු බලය ලබා ගන්නා පැත්තට මාස කීපයකින් පසු මේවා ගැන විස්තර ටිකක් සොයා බලන්ට පුළුවන් කමක් තිබෙනව. ඒ මාර්ගයෙන් ඔවුන්ට පුළුවනි යම් යම් ප්‍රයෝජන භුක්ති විඳින්ට. ඒ අයට නොයෙකුත් ආකාරයෙන් ප්‍රයෝජන භුක්ති විඳීම පිණිස එම පොලිස් වාර්තා අනුව නඩු දමන්ට පුළුවනි. නඩුකාරවරුන් නඩු තීන්දු දෙමින් ප්‍රකාශ කර තිබෙනව, මේ ක්‍රමය හොඳ මදි බව. එපමණක් නොවෙයි. මැතිවරණ නඩු තීන්දු අනුව තවත් කරුණක් පෙනෙන්නට තිබෙනව. මැතිවරණ සමයක දී කොයි විධියේ වරදක් කළත් ඒ පිළිබඳව වගකීම අපේක්ෂකයා පිට පැවරෙනවා. ගරු කථානායකතුමනි, එය මහ පුදුම නීතියක්. මා හොඳහැටි දන්නා ඔප්පු වී තිබෙන කරුණක් මම කියන්නම්. ඒ පිළිබඳ නඩුවත් ඉවරයි; ඇපෑලත් ඉවරයි; ප්‍රිවි කවුන්සලයට කළ ඉල්ලීමත් ඉවරයි. ඒ නිසා ඒ ගැන කථා කරන්න මට පුළුවන්කම තිබෙනව. මැතිවරණ සමයේදී යම්කිසි තරුණයකු විසින් එක්තරා තරුණියකට හිරිහැර කරන ලදැයි කියන කරුණත් ඒ ආසනය ජය ගත් මන්ත්‍රීවරයාගේ වගකීම හැටියට පිළිගෙන ඒ ආසනය ඔහුට අහිමි වී තිබෙනව. මා කියන්නේ බලංගොඩ ඡන්ද නඩුවට අදාළ වූ කරුණක්. ඒ නඩුවත් ඉවරයි; ඇපෑලත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

ඉවරයි; අතුරු මැතිවරණයත් ඉවරයි. මා මේ කථා කරන්නේ ඒ නඩු තීන්දුව ගැන නොවෙයි. ඒ නිසා, මෙවැනි දේවල් සම්බන්ධව නීතියේ සීමාවක් තිබිය යුතුයි. එබැවින් විශේෂ කාරක සභාවක මාර්ග යෙන් ඒවා පිළිබඳව අපේ කල්පනාව යොමු කරන විට අපේ මැතිවරණ නීති රීතිවල තිබෙන දුර්වලතාවන් ගැනත් අපි කල්පනා කර බැලිය යුතුයි. එසේ නැතිව ඒ කාරක සභාවේ වැඩ කටයුතු මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාවට පමණක් සීමා කරන්න හොඳ නැහැ. ඒ නිසා මැතිවරණ නීති රීති සංශෝධනය කරන අවස්ථාවේදී ඡන්ද නඩුවලින් ලැබී තිබෙන අත්දැකීම් පිළිබඳවත් අපේ අවධානය යොමු කරන්නට ඕනෑ. එපමණක් නොවෙයි. පසුගිය අතුරු මැතිවරණවලදී ලැබුණු අත්දැකීම් ආදියත් ප්‍රතික්ෂේප කිරීම නුවණට හුරු නැහැ. මැතිවරණ නීති රීතිවල හරි වැරදි මැනීමට යම්කිසි අවස්ථාවක් පසුගිය මහා මැතිවරණයේදී අපට ලැබුණා පසුගිය අතුරු මැතිවරණවලදීත් අපට එවැනිම අවස්ථාවක් ලැබුණා. එහෙනම් අපි අතුරු මැතිවරණ පැත්තකට කරන්නේ ඇයි?

ගරු කථානායකතුමනි, අතුරු මැතිවරණවලදීත් පෝස්ටර් ඇලවීම තහනම් කර අපි නීතියක් පනවා තිබෙනවා. මේ මන්ත්‍රී මණ්ඩලය මගින් විශේෂ කාරක සභාවක් පත් කර ඒ මගින් ගත් තීරණ යක් අනුව ඇති කළ නීතියක් ඒක. කොඩි එල්ලීමත් තහනම් කළා. මේ මන්ත්‍රී මණ්ඩලය මගින් නීතිය සම්මත කළේ ඒ ආකාරයටයි. එහෙත් එය මැතිවරණ නීති යට ඇතුළත් වුණේ කොහොමද? අපේ දැනීමේ හැටියට නම් පෝස්ටර් ඇලවීම තහනම්. පසුගිය මහ මැතිවරණ සමයේදී අත් බිලක් මුද්‍රණය කළත් අපි කිව්ව කරුණාකර ඒ බිල කොහේවත් අලවන්න නම් එපා කියල. එහෙත්, පසුගිය අතුරු මැතිවරණ කාලයේදී බෙන්තර-ඇල්පිටිය ඡන්ද කොට්ඨාශයේ පාරවල් දිගේ යන විට ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ විශාල කොළපාට පින්තූර හැම තැනම අලවා තිබෙනවා අපට දකින්නට ලැබුණා. එපමණක් නොවෙයි, අපේක්ෂකයාගේ පින්තූරයත් එතුමාගේ සාක්කුවේ. හැබැයි නීතිය අනුව නම් පෝස්ටර් ඇලවීම තහ නම්. එහෙත්, මේ පත් කරන්නට යන විශේෂ කාරක සභාව එක දේකට පමණක් සීමා කර තිබෙන නිසා ඒවා ගැන කියන්න වත් අපට ඉඩක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

සීමාවක් නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

ඇයි නැත්තෙ? සීමාවක් තිබෙනව. මෙහි තිබෙන්නෙ "in the light of the experience gained in the last General Election" කියලයි. ඇයි අපි පරණ දේවල් කථාකරන්නෙ අලුත් දේවල් තිබියදී? විශේෂයෙන්ම ඡන්ද නඩුවලදී ලැබුණු අත්දැකීම් ඇතුළත් කර ගෙන මේ විශේෂ කාරක සභාවේ කටයුතු ගෙන යන්නට අදහස් නොකරන්නේ ඇයි? [බාධා කිරීමක්] එය හොඳ දෙයක් වන්න ටත් පුළුවන්. එයත් අපි නීතියට අඩංගු කරමුද? අගමැතිතුමා ඡන්දපොලින් ඡන්ද පොලට යා යුතුයි කියා අපි නීතියට ඇතු ළත් කරමු.

ගරු කථානායකතුමනි, පසුගිය අතුරු මැතිවරණවලදී ලත් අත්දැකීම් හා ඡන්ද නඩුවලදී ලත් අත්දැකීම් උඩ අපේ නීති රීති සකස් කර ගත යුතුයි කියන එකයි මා කියන්නේ. ඔය විධියට පින්තූර ඇල වීමට ඉඩ දෙනවා නම් අපටත් එය කරන්න පුළුවන්. හොඳයි අපිත් බලමු. එය එක පැත්තකට පමණක් නොවෙයි, දෙපැත්ත ටම කරන්න පුළුවන්. මැතිවරණ නීති සකස් කිරීමේදී විරුද්ධ පාර්ශ්වය වශයෙන් අපි කියා සිටින්නේ මෙයයි: සාමාන්‍ය මහ ජනයාගේ ප්‍රයෝජනය පිණිස නීතිය සකස් කරන්නට බලාපොරොත්තු වෙනවා නම් මැතිවරණ වියදම් සීමා කර ගම්බද ආසන යක් තරඟ කිරීමට සාමාන්‍ය අයටත් ශක්ති යක් ඇති කළ යුතුයි. ඒක කරන්නට පුළු වන් වන්නේ නීතිරීතිවලින් පමණයි. විය දම සීමා කිරීම සඳහා අප නීතිරීති පන වනවා. මේ අතර පසුගියදා උසාවියෙන් ලැබුණු තීන්දුවක් ගැන මතක් කරන්නට කැමතියි. පක්ෂයෙන් වියදම් කරන මුදල අපේක්ෂකයා වියදම් කරන මුදලක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොවන බව ඒ තීන්දුවේ සඳහන් වුණා. එය හරිද වැරදිදැයි මා කියන්නේ නැහැ. කෙසේ වෙතත් මේ අන්දමට කල්පනා කළ විට මෙය ලොකු කාරණයක්. අපේක්ෂකයා සතයක්වත් වියදම් කරන්නේ නැහැ. එහෙත් පක්ෂයෙන් වියදම් කරනවා. හැම තැනම තිබෙන්නේ කොළ පාට තොප්පියි. අපේක්ෂකයාගේ වියදම රුපියල් 5,000 ට වැඩි නොවිය යුතුය කියන නීතිය තවම තිබෙනවා. එසේ හෙයින් අප මේ කරුණු සියල්ලම කල්පනාවට ගෙන හරියාකාර අන්දමට නීතිය සංශෝධනය කරන්නට ඕනෑ. කොඩි තහනම් කිරීම ගැන කල්පනා කර බලමු. පෙරදී කොළ පාට කොඩි වැනූ අය සහ නිල් පාට කොඩි වැනූ අය දැන් වනන්නේ බෞද්ධ කොඩියි. අප මෙහි පැමිණ සිටින්නේ මෙවැනි විකාර කරන්න නොවෙයි. අප කවුරුනුත් බලාපොරොත්තු වන්නේ නීතිය තුලටම පිළිපැදීමටයි. ඒ සඳහා අපට අවශ්‍ය නීතිය හරියාකාර ලෙස සකස් කර ගන්න ඕනෑ. අපේ වර්තමාන අත්දැකීම් අනුව නීතිය හරියාකාර ලෙස සංශෝධනය කර මහජන කැමැත්ත අනුව නිදහස්ව "නෙස්ප්‍රේද සහිතව" අපේ මැතිවරණ සටන් ගෙන යන්නටයි, අප බලාපොරොත්තු වන්නේ.

ගරු කථානායකතුමනි, මා ළඟදී වෑන් රථයකින් බලංගොඩට ගියා. වෑන් එක කුත් අරගෙන ආවේ අපේ නෙස්ප්‍රේ ටික දොම්පෙට ගෙන යන්නදැයි එහි සිටි මිනිසුන් මගෙන් ප්‍රශ්න කළා. අප මේවා ගැනත් කල්පනා කරන්න ඕනෑ.

ඡන්දදායකයන් ඡන්ද පොළ වෙත වාහනයකින් ගෙන යෑම තහනම් කොට තිබෙනවා. මේ තහනම ලොකු සහනයක් යයි අප කල්පනා කළා. මේ නිසා ඡන්දාපේක්ෂකයන්ගේ වියදම් අඩුවෙතැයි අප හිතුවා. ළඟ ළඟම ඡන්ද පොළවල්ද පවත්වන නිසා වියදම අඩු වන බව කල්පනා කළා. කාටත් පහසුවෙන් ඡන්දය පාවිච්චි කරන්නට ඉඩ ලැබෙනවායයි අප කවුරුනුත් සැනසුම් සුසුම් හෙළුවා. රථවාහන වලින් ඡන්ද පොළ කරා ඡන්දදායකයන් ගෙන යන්නට වුවමනාවක් නැති නිසා මුලදී ඒ සඳහා වැය වූ මුදල දැන් ඉතිරි වෙනවා. හොඳයි, දැන් මොකද වෙලා තිබෙන්නේ ? පසුගිය අතුරු මැතිවරණ සමයේදී ගාලු පළාතේ තිබුණු ලොරි සියල්ලක්ම වාගේ උඩරට කඳුකරයේදී දකින්නට ලැබුණා. මේ ලොරි කඳුකර ප්‍රදේශය කරා ගියේ මැතිවරණ දිනයේ සෙනඟ ඇදීම සඳහා නොවෙයි. ඒවා යොදවා තිබුණේ රැස්වීම් සඳහා සෙනඟ ගෙන ඒමටයි. මේක අපේ ජනසතු සේවා ඇමතිතුමාගේ ජනසතු සේවාවටත් අගෞරවයක් බව කියන්නට කැමතියි. එක්සත් ජාතික පක්ෂයේ රැස්වීම් සඳහා මිනිසුන් අදින්නට සිදු වුණේ ලොරිවලිනුයි. අප මේ කරුණුත් කල්පනාවට ගත යුතුයි. සාමාන්‍ය නීතිය අනුවත් ලොරිවලින් මිනිසුන් ඇදීම තහනම්ව ඇතත් ඒ සඳහා පොලීසියෙන් බලපත්‍ර දී තිබුණා. මිනිසුන් ඕනෑ තරමක් ලොරිවල පටවාගෙන රැස්වීම් කරා ගෙන යන්නට පුළුවනි. එහෙත් මෙවැනි වැඩවලට මේ රටේ පොදු ජනතාව රැවටෙන්නේ නැහැ. ඒ බව ඡන්ද ප්‍රතිඵලවලින් පෙනී යනවා ඇති. මේ කාරණා ගැන කල්පනා කර බලන විට මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව මේ අන්දමට ඉදිරිපත් කිරීම නුවණට හුරු නොවන බව මට පෙනී ගිය නිසා මේ යෝජනාවේ පස්වැනි පේළියට මා මේ අන්දමට සංශෝධනයක් ඉදිරිපත් කරනවා :

> "පසුගිය මහා මැතිවරණවලදී ලබා ගත් අත්දැකීම්ද, මැතිවරණ නඩුවලින් ලැබුණු අත්දැකීම්ද, ළඟදී පැවැත්වුණු අතුරු මැතිවරණවලදී ලබා ගත් අත්දැකීම්ද අනුව නිර්දේශ කිරීම පිණිසත් විශේෂ කාරක සභාවක් පත් කළ යුතුය."

විශෙෂයෙන් දින නියමයක් කරන්න වුවමනාවක් නෑ. මේ කාරක සභාව පිහිටුවන්න කලින් තවත් අතුරු මැතිවරණ ඇති වුණොත් ඒවත් මීට ඇතුළත් වන විධියට ඒවයින් ලැබෙන අත් දැකීම්ද මීට බල පාන විධියට මේ කාරක සභාව පත් කළ යුතුයි. කථානායකතුමනි, තවත් ආසන දෙකක්—දොඩම්ගස්ලන්දත්, වැලිමඩත්—අපට එන්න තියෙනව. ඒ මන්ත්‍රීවරුන් දෙදෙනාටත් ළඟදීම තමුන්නාන්සේ ඉදිරියෙ දිවුරුම් දෙන්න සිදුවෙනවා. ඒ නිසා මා මේ අවස්ථාවේදී විශෙෂ දින සීමාවක් කරන්නෙ නෑ. සෑම අතුරු මැතිවරණයකින්ම ලැබුණු අත්දැකීම් අනුව නීතිය හදා ගත යුතුය යන අදහසයි මා ඉදිරිපත් කරන්නෙ. ස්තුතියි.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

අ. භා. 2.41

**ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)**

*(கலாநிதி என்· எம்· பெரேரா—யட்டியாந்தோட்டை)*

(Dr. N. M. Perera—Yatiyantota)

ගරු කථානායකතුමනි, මාත් මේ අවසථාවෙදී වචන ස්වල්පයක් කථා කළ යුතුව තියෙනව. මැතිවරණ නීති සම්බන්ධ සංශෝධන පණතක් සම්මත කර තිබෙන්නෙ එය ක්‍රියාත්මක කරන්න මිස ක්‍රියාවේ නොයොදවන්න නොවෙයි. ඒ පණතට කිසිවෙක් විරුද්ධ වුණේ නෑ. ප්‍රජාතන්ත්‍රවාදය අනුව කිසිවකුගෙ බලපෑමක් නැතිව නිදහසේ තම ඡන්දය පාවිච්චි කිරීමේ බලය මේ රටේ මහජනතාවට තිබිය යුතු බව එදා අපි සියලු දෙනාම පිළිගත්ත. මහජනය කොයි පැත්තට ඡන්දය දුන්නත් ප්‍රශ්නයක් නෑ. මෙවැනි අදහසක් උඩ සම්මත කළ නීති රීති හරි හැටි ක්‍රියාවෙ යෙදෙන්නෙ නැත්නම්, ඒ නීති රීති උල්ලංඝණය කෙරෙනව නම් මෙවැනි කාරක සභා පත්කිරීමේ තේරුම මොකක්ද? සම්මත කරනලද නීති, ක්‍රියාවෙ යෙදවීමේදී ඒව උල්ලංඝණය කරනව නම් කාරක සභා පත්කිරීමෙ අර්ථයක් තියෙනවද? පසුගිය අතුරු මැතිවරණ සම්බන්ධව කරුණු එකක් දෙකක් මා මේ අවස්ථාවෙදි ගරු අගමැතිතුමාට මතක් කරන්න සතුටුයි.

මැතිවරණ කාලය තුළදී නොව, මැතිවරණයෙ අන්තිම දවසෙදී සිදුවුණු දේවල් ගැනයි මා කියන්නෙ. බණ්ඩාරවෙල ඡන්ද කොට්ඨාශයේ හල්පෙ ඡන්ද පොළට උදේ පාන්දර මා යන විට, අපේ උදවියට තර්ජනයකර, ඒ උදවියගෙ කාර් කඩාදමා, ටයර් කපාදමා, ඔවුන් සැහෙන බයකින් සිටි බව මට දකින්න ලැබුණ. කොළ පාට තොප්පි පැළඳගෙන, කොළ පාට කමිස ඇඳගත් පිරිසක් ඡන්ද පොළ ඉදිරි පිට පාර දිගටම සිටියා. [බාධා කිරීම්] ඇත්ත වශයෙන්ම මේ වැඩේ සිදුවී තිබෙන්නෙ ඊට කලින් දවසෙ රාත්‍රියෙයි.

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කම්කාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு· டீ· செல்ற்றன் ஜயசிங்க—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளு மன்றக் காரியதரிசி)*

(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

එහෙනම් උදේ පාන්දරෙයි කිව්වෙ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා.**

*(கலாநிதி என்· எம்· பெரேரா)*

(Dr. N. M. Perera)

උදේ පාන්දර මම යන විට දැක්ක බවයි මම කිව්වෙ. ගරු උප ඇමතිතුමාට සිංහල තේරෙන්නෙ නැත්නම් මට ඒ ගැන කරන දෙයක් නෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

ඒ ගොල්ලන්ට සිංහල තේරෙන්නෙ නෑ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என்· எம்· பெரேரா)*

(Dr. N. M. Perera)

මම පොලීසියට මේ ගැන දැනුම් දී "එන්ට්‍රියක්" දැම්ම. පොලීසිය ඒ සම්බන්ධව කොයිතරම් දුරට ක්‍රියා කර තිබෙනවදැයි මම දන්නෙ නෑ. හොඳයි, ඒ කරුණ පැත්තකින් තිබුණාවෙ. ඔය තරම් විශාල සෙනගක් කොළ පාට තොප්පි පැළඳගෙන කොළ පාට කමිස ඇඳගෙන ඡන්ද පොළේ එහාට මෙහාට සක්මන් කරමින් අලියට ඡන්දය දෙන ලෙස ඡන්ද දායකයින්ට ආරාධනා කරන්නෙ කොහොමද මැතිවරණ නීතිරීති අනුව? බණ්ඩාරවෙල ඡන්ද කොට්ඨාශයෙ ඡන්ද පොළවල් 26 ක් තිබුණා. එයින් එකක හැර අනෙක් විසිපහෙම මේ තත්ත්වය පැවතුණා.

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා මේ අවස්ථාවේදි මෙහි සිටිය නම් මා බොහොම සන්තෝෂ වෙනව. ඇල්ල ඡන්ද පොළට මා යන විට එතුමත් එහි සිටිය. ඒ ඡන්ද පොළේ පැවතුණු නීති විරෝධි තත්ත්වය දැකල, තමුන්නාන්සේල නීතිය කඩ කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නවා නේද කියා මම එතුමගෙන් ඇහුව. මගේ ප්‍රශ්නයට එතුමා දුන් පිළිතුර මේ කයි: "මම මොකද කරන්නෙ? මේව කරන්නෙ ගම්මු." උප ඇමති කෙනෙක් නීතිය නොදැන, ගම්මු එසේ කරනවයි කියා ඒ වරදෙන් මගහරින්න පුළුවන්ද? නීතියට විරුද්ධව තමන්ගෙ බලය පාවිච්චි කර අසුවලාට ඡන්දය දෙන්නයයි ඡන්ද දායකයන්ට කීම හරිද? මා කීප විටක්ම මේ ගැන පොලීසියටත් දැනුම් දුන්න. පොලීසිය කිව්ව අපි කිව්වත් අහන්නෙ නැත කියා. පොලීසිය කියලත් ඇයි ඇහුවෙ නැත්තෙ? මේ සම්බන්ධයෙන් ලොකු මිනිසුන් මුල්වී වැඩ කළ නිසයි. අවශේෂ මිනිසුන් මේක කළා නම් කමක් නැහැ. නමුත් මැති ඇමතිවරුන්ගේ දැනීම ඇතිව මේක කළාය කියා අපට කියන්ට සිද්ධ වී තිබෙනව.

අපේ රාජ්‍ය ඇමතිතුමා කාර් එකකින් ගියා මා දුටුව. රජයේ වැඩ, තැපැල් සහ විදුලි සන්දේශ අමාත්‍යාංශය භාර මොන්ටේගු ජයවික්‍රම මහත්මයාත් සමග කාර් එකක ගියා. මා අසන ප්‍රශ්න මේකයි: රාජ්‍ය ඇමතිතුමා මේ සිද්ධීන් දැක්ක. ඇයි කාර් එක නවත්වා එතුමා කිව්වෙ නැත්තෙ ඒ මිනිසුන්ට එතන ඉන්න පුළුවන්කමක් නැත කියා.? මේ පිළිබඳව සෙනෙවිරත්න මහත්මය මට කිව්වෙ මොකක්ද? "අයි සෙ, තමුසෙගෙ මිනිසුන්ටත් එන්න කිය නව මෙහාට" කියායි එතුමා කිව්වෙ. එවිට මං කීවා, නීති කඩන්න මා ලෑස්ති නැත කියා. [බාධා කිරීමක්] ගල් වැදුණ නම් ඔය කාර් පාවිච්චි වෙන්නෙ නැහැ. ඒකයි මගෙ කණගාටුව. මේ කාර් සම්බන්ධව බණ්ඩාරවෙල පොලීසියෙ එන්ට්‍රියකුත් දමා තිබෙනව. මගේ ඇස්වලින්ම මා කාර් හතරක් දැක්ක. ඒවයෙ නොම්මරත් සමග මා එන්ට්‍රියක් දමා තිබෙනව. මේ නීති තිබෙන්නෙ සාධාරණ අන්දමට ක්‍රියාවෙ යොදවන්නයි. මේ නීති සාධාරණ අන්දමට ක්‍රියාත්මක කරන්න පොලීසියට ශක්තියක් නැත්නම් මැති ඇමතිවරුන් ඒකට උල් පන්දම්, අනුබල දෙනව නම් අපි මොකටද මේ කාරක සභා පත් කරල නීති සංශෝධනය කරන්නෙ? මෙවැනි තත්ත්වයක් නම් තිබෙන්නෙ අළුතෙන් නීති සම්පාදනය කිරීමෙන් ඇති වන ප්‍රයෝජනය කුමක්ද?

මා ඉල්ලා සිටින්නෙ මෙයයි. අපි සාධාරණ වැඩ පිළිවෙළක් සම්මත කර ගෙන සාධාරණ විධියට එය ක්‍රියාත්මක කරමු. කොයි පැත්තට ඡන්දය දුන්නත් ඒක ප්‍රශ්නයක් නොවෙයි. තමුන්නාන්සේලාගේ පැත්තට වැඩි දෙනෙකු ඡන්දය දුන්නොත් අපේ විරුද්ධත්වයක් නැහැ. ඒක ප්‍රජාතන්ත්‍රවාදය අනුව සිදුවන දෙයක්. ගරු අගමැතිතුමනි, ඇත්ත වශයෙන්ම තමුන්නාන්සෙ එදා මුලු දවසම බලන්ගොඩ ගත කළා. එම දවස තමුන්නාන්සෙ ගත කළේ දේශපාලන පක්ෂයක නායකයකු වශයෙන්ද නැත්නම් පොලිස් දෙපාතීමේන්තුවෙ නායකයා වශයෙන්ද? ඒකයි මට දැනගන්න වුවමනා කරන්නෙ. ඒ මක්නිසාද? නිකම් පාරෙ හිටපු උදවිය පොලීසියට ඇද ගෙන ගිය බව මා දන්නව. කෑම කකා හිටපු උදවිය පොලීසියට ඇද ගෙන ගිහින් තිබෙනව. මොකක්ද ඒ අය කළ වැරද්ද? පිට පළාතකින් පැමිණි මිනිසුන් නිසයි. ඔය කාරණය උඩ මිනිසුන් 64 දෙනෙකුද කොහෙද පොලීසියට අල්ලා ගෙන ගිහින් තිබෙනව. ඒකයි මා අගමැතිතුමාගෙන් ප්‍රශ්න කරන්නෙ, අගමැතිතුමා එදා බලන්ගොඩ දවස ගත කළේ දේශපාලන පක්ෂයක නායකයකු වශයෙන්ද කියා. ඇත්ත වශයෙන්ම අගමැතිතුමා දේශපාලන පක්ෂයක නායකයකු වශයෙන් වැඩ කළා නම් මගේ විරුද්ධත්වයක් නැහැ. එතුමාට ඒ විධියට වැඩ කරන්ට අයිතියක් තිබෙනව. නමුත් තමන්ගෙ නිල බලය පාවිච්චි කරන්ට බැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය සහ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, and Minister of Planning & Economic Affairs)

මම පාවිච්චි කළේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

අගමැතිතුමා නිල බලය පාවිච්චි නොකළාය කියනව නම් මා එය පිළිගන්න ලෑස්තියි. නමුත් අපට ලැබුණු ආරංචි ඊට වෙනස්. ඒ කියන්නෙ පොලීසිය මිනිසුන් අල්ලා ගෙන ගිහින් රිමාන්ඩ් කර තිබෙන්නෙ තමුන්නාන්සෙ ඉදිරිපිටදීයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

තමුන්නාන්සේ නැත කියනව නම් මා ඒකත් පිළිගන්න ලෑස්තියි. නමුත් මට කණගාටුවෙන් කිවයුතු කාරණයක් තිබෙනව. බෙන්තර-ඇල්පිටිය අතුරු මැතිවරණය සම්බන්ධයෙන් පොලීසිය කෙසේ ක්‍රියා කළාද කියා මා දන්නෙ නැහැ. මා එදා ඒ ප්‍රදේශයෙ හිටියෙ නැහැ. නමුත් බලන්ගොඩ, බණ්ඩාරවෙල සම්බන්ධව මා දන්නව. මම කියන්නෙ නැහැ හැම එක්කෙනාම වැරදි කළාය කියා. නමුත් පොලීසියේ සෑහෙන පිරිසක් අවංකව, අපක්ෂපාතව වැඩ කළාය කියා කියන්ට බොහොම අමාරුයි. මහවල සෑහෙන ඡන්දදායකයින් කොටසකට ඡන්දය දෙන්න නොලැබුණු බව මා දන්නව. ඇල්පිටිය බස් ඩිපෝ එක සම්පූර්ණයෙන්ම කොළ පාටින් සරසා තිබුණ. පසුව අපේ මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් රාජපක්ෂ මයා.) ටෙලිග්‍රෑම් එකක් ගහලයි ඒක වෙනස් කළේ. මේව හරිද? මේව යුක්තිසහගතද? බණ්ඩාරනායක මහත්මයගෙ පින්තූර බස්වල තිබුණාය කියා තමුන්නාන්සේල දොස් කිව්ව.

එපමණක් නොවෙයි. දිවිතුර වත්තෙ කම්කරුවන් සම්පූර්ණයෙන්ම ගමනාගමන මණ්ඩලයෙ බස්වලින් ඡන්ද පොළවලට ගෙනාව. ඒක බස් ධාවන මාර්ගයක් වත් නොවෙයි. හැබැයි, ඉන්දියන් කම්කරුවො තමයි ඇද්දෙ. මා මේ සිද්ධි කියන්නෙ ආසාවකින් නොවෙයි; අගමැතිතුමාට මතක් කරන්නයි. සාධාරණ අන්දමට යුතුකම් ඉෂ්ට කරන්ට අපි දෙගොල්ලම එකඟ වෙමු. මේ තිබෙන නීති රීතිවල අඩුපාඩුකම් හරිගස්සා ගනිමු. නීති හදන්නෙ අපේ වාසියටවත් තමුන්නාන්සේලාගෙ වාසියටවත් නොවෙයි. ලංකාවේ සියලු දෙනාටම තමන්ගේ ඡන්ද බලය නිදහසේ පාවිච්චි කිරීමේ වරප්‍රසාදය, කාටවත් යට නොවී ආත්ම ගෞරවයක් ඇතිව නිදහසේ ඡන්දය පාවිච්චි කිරීමේ වරප්‍රසාදය ලබා දෙන්නට අපට යුතුකමක් තිබෙනව. අන්න ඒකයි, මම තමුන්නාන්සේගෙන් ඉල්ලුම් කරන්නෙ. පක්ෂ සම්බන්ධයෙන් තිබෙන්නාවූ වෙන වෙන සටන අපි බේරා ගනිමු. ඒක වෙනම වැඩක්. මේ කාරණය සාධාරණව ඉටු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

අ. භා. 2.50

**ස්ටැන්ලි තිලකරත්න මයා.** (කෝට්ටේ)
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)*
(Mr. Stanley Tillekeratne—Kotte)

ගරු කථානායකතුමනි, ඔක්කොම සෙල්ලම් මේ ආණ්ඩුව කළත් අන්තිම සෙල්ලමින් ජය ගත්තෙ අපියි. මේ අතුරු මැතිවරණ තුන ගැන කල්පනා කරන විට වැදගත් කාරණයක් ගැන මට තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න සිදු වෙනවා. මම නම් අතුරු මැතිවරණ ගණනාවක් දැක්කා; නමුත් මේ විධියෙ අතුරු මැතිවරණ 3 ක් දැක්කෙ නැහැ.

ගරු කථානායකතුමනි, රටේ වගකීමක් ඇති පක්ෂයක නායකයෙක් පමණක් නොවෙයි අගමැති වරයෙක් පසුගිය 24 වැනිදා බලන්ගොඩ කුඩාරම් ගසාගෙන ඡන්ද පොළෙන් ඡන්ද පොළට ගමන් කරමින් ජනතාවට අයුතු බලපෑමේ වැඩ පිළිවෙළක් ගෙන ගියා. එවැනි අයුතු වැඩ මේ රටේ තියෙනවා නම් ඒවා නැවැත්වීම සඳහා වහාම දැනට තිබෙන නීතිය වෙනස් කරන්න ඕනෑ. මගේ පියා කළ වැඩ මිස වෙන වැඩ කරන්නෙ නැත කියා ප්‍රකාශ කළ අගමැතිවරයෙක් එදා ඡන්ද පොළෙන් ඡන්ද පොළට ගමන් කළා නම් අපි ඒ ගැන කණගාටු වන්නට ඕනෑ. එතුමාගේ පියා ජීවත්ව සිටි කාලයේදී නම් මේ වගේ වැඩ කළේ නැති බව මම කියන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විරුද්ධ පාර්ශ්වය මේ ගරු සභාවෙන් නැගිටලා ගිය හැටි, තමුන්නාන්සේ එදා මේ ගරු සභාවෙ නොසිටියත්, ගරු නියෝජ්‍ය කථානායකතුමා දන්නවා. අප ගෙන ආ විශ්වාස භංග යෝජනාව සාකච්ඡා කිරීමට විරුද්ධව ගරු නියෝජ්‍ය කථානායකතුමා දුන් තීරණයට විරුද්ධ වෙමින් එදා විරුද්ධ පාර්ශ්වය මේ සභා ගර්භයෙන් නැගිට ගියා. නමුත් ගරු අගමැතිතුමා බලන්ගොඩදිත්, බණ්ඩාර වෙලදිත් කළ කථාවලදි සඳහන් කර තිබෙනවා, විරුද්ධ පාර්ශ්වය මේ සභා ගර්භයෙන් නැගිටලා ගියේ නින්දගම් පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන නිසාය කියා. ගරු අගමැතිතුමාගේ ඒ ප්‍රකාශය ගැන මම කණගාටු වෙනවා. එතුමා එවැනි ප්‍රකාශයක් කළේ නැත් නම් මම මේ විධියේ දෙයක් කීවේ නැත කියා වහාම ප්‍රවෘත්ති පත්‍රවලට ප්‍රකාශයක් කරන්න රටේ අගමැති හැටියට එතුමාට යුතුකමක් තියෙනවා. අද අපි මේ ගරු සභාවට ආවෙ නින්දගම් පනත සම්මත කරන්න පමණක් නොවෙයි, මොල මුරේ පවුලට අයිති සෑම නින්දගමක්ම ඒවායේ පදිංචි වී සිටින අයට බෙදා දෙන්නයි. ගරු කථානායකතුමනි, අග මැතිවරයකුත් මේ ගරු සභාවට නිග්‍රහ කරමින්, වැදගත් විරුද්ධ පාර්ශවයකට—හෙට අනිද්දාම මේ රට පාලනය කරන්නට සිටින විරුද්ධ පාර්ශ්වයට—නිග්‍රහ කරමින් මේ විධියේ අසත්‍ය ප්‍රචාර කරනවා නම් ඒක සාධාරණ නැත කියන දුක්ගැනවිල්ල තමුන්නාන්සේ ඉදිරියෙහි තැබීම මගේ යුතුකමක් බව මම ප්‍රකාශ කරනවා.

සෝල්බරි සාමිවරයා ලංකාවට ඇවිත් ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සකස් කරන විට කල්පනා කළා, මහජන මන්ත්‍රී මණ්ඩලයෙන් අධිකරණ ඇමතිවරයකු පත් කිරීම සුදුසු නැත කියා. නොයෙකුත් දේශපාලන බලපෑම්වලට, මහජන බල පෑම්වලට යටත් වීමෙන් නොයෙකුත් අයුතු වැඩ කෙරෙන්නට ඉඩ තිබෙන නිසයි, එවැනි ව්‍යවස්ථාවක් සකස් කළේ. නමුත් අපේ ගරු අධිකරණ ඇමතිතුමා මේ ඡන්ද ව්‍යාපාරයේදි මොනවද කළේ කියා මම අහන්න කැමතියි. නොයෙකුත් අයට සමාදාන විනිශ්චයකාරකම් පොරොන්දු වෙමින්, මේ මේ වැඩ කරන අයට මේ මේ දේ දෙනවාය කියා පොරොන්දු වෙමින් බෙන්තර-ඇල්පිටියේ නොයෙක් ප්‍රදේශවල ඡන්ද වැඩ කළේ නැද්ද කියා මම අහන්න කැමතියි.

දේශපාලන ව්‍යාපාරය තමාට විරුද්ධව යන බව දැන ගත්තම අවසානයෙදි ගරු අගමැතිතුමා තමාගේ ලේ පවා උරගා බලන්න සූදානම් වුනා. අපට ඒක වුව මනා නැහැ. අපට මෙතැන "බ්ලඩ් ටෙස්ට්" කරන්න වුවමනාවක් නැහැ. අපි කව්රුත් දන්නව, එතුමා හොඳ වැදගත් පියකුගේ පුතෙක් බව. නමුත් තාත්තා ගිය අඩි පාරේවත් ගමන් කරන්නට පුතා ලෑස්ති නැති නිසා තමයි, එතුමා මහනුවර ගිය වෙලාවේ පෙරකදෝරු මහත්මයෙක්—මීට කලින් ගලගෙදර ආසනයට තරඟ කළ එක්සත් ජාතික පක්ෂයේ පෙරකදෝරු මහත්මයෙක්—පාර හරහා පෙරළිලා කිව්වේ ඔය ගමන යන්න එපාය, තමුන්නාන්සෙගෙ තාත්තා නම් ඔහොම ගියේ නැත කියා.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා කරුණා කර මා කියන දේ අහන්න. මේ ප්‍රශ්නයට අදාළව කථා කරන්න.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**

*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*

(Mr. Stanley Tillekeratne)

ගරු කථානායකතුමනි, දැන් අපි මේ සංශෝධනය ගැන කල්පනා කර බලමු. මේ සංශෝධනය ඉතාමත් වැදගත් එකක් ලෙස සලකන්න ඕනෑ. අපේ ඡන්දය මීට වඩා පරිශුද්ධ ලෙස පාවිච්චි කළ හැකි තත්ත්වයක් ඇතිකර ගැනීම සඳහා එය අවශ්‍යයි. අපේ හිටපු අගමැතිතුමකු—වන ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා මාස තුනේ අගමැතිතුමා—එතුමගෙ කාල යෙදි මොන මොන දේවල් කළත් කළ එක් හොඳ දෙයක් ගැන කියන්න ඕනෑ. එතුමා 1960 මාර්තු මාසයේ මැතිවරණය ඇත්ත වශයෙන්ම හොඳට පැවැත්වූ බවයි මා කියන්නෙ. එය පිළිගත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යුතුව තිබෙනවා. එතුමා කොයි තරම් හොඳට ඒ කාර්යය ඉෂ්ට කර ඇද්දැයි කිය තොත් අන්තිමේදී එතුමට එතුමා එතෙක් නියෝජනය කළ ආසනයත් නැති වුණා. ජනසම්මතවාදයේ ජයග්‍රහණය—triumph of democracy—එයින් පෙනෙනවා.

මා කලින් කීවාක් මෙන් තොප්පි බෙදා දීම නම් හැම තැනම වාගේ සිදු වුණා. කොළ පාට තොප්පි හැම තැනකම වාගේ දකින්න ලැබුණා. එහි නියම තත්ත්වය දැක බලා ගැනීමට තමුන්නාන්සෙ හිටියෙ නැහැ. තමුන්නාන්සෙ හිටියා නම් සියා සින්ම බලාගන්න තිබුණා, මේ සම්බන්ධ යෙන් වුණු අපරාධ මොනවාද කියා. මේ හේතුන් නිසා මේ නීති සංශෝධනය කරන්න ඕනෑ බව අප කියා සිටිනවා.

ගරු කථානායකතුමනි, සමහර තැන් වල පෝස්ටර් අලවා තිබුණා. සමහර තැන් වල අලවා තිබුණු පෝස්ටර් සම්බන්ධ යෙන් පොලීසිය ක්‍රියා කළේ නැහැ. මා බණ්ඩාරවෙල සිටි අවස්ථාවේ ලංකා ගමනාගමන මණ්ඩලයේ—සී. ටී. බී. එකේ —1 ශ්‍රී 1177 දරණ ජීප් රථය දකින්න ලැබුණා. ලෑන්ඩ් රෝවර් එක බණ්ඩාර වෙලට ගෙනාවා. බණ්ඩාරවෙල සංවිධායක වශයෙන් හිටියෙ ලංගමයේ වැඩ කරන ඔස්කා ද ලිවේරා උන්නැහේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
නැහැ, වස්කෝදගාමා.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)
ගරු කථානායකතුමනි, බණ්ඩාරවෙල අන්තිම මැතිවරණ රැස්වීම පැවැත්වුණු දවසේ අපත් එහි සිටියා. අපට ගමන් කරන්නත් අපහසු තත්ත්වයක් ඇති වුණා. ගරු අගමැතිතුමා අපේ කාර් අයින් කර දමා ගියා. ඒ ගොල්ලන්ගෙ උඩරට ප්‍රදේශයේ ලොකු වතු හිමියන්ගෙ ලොරිවලින් තමයි රැස්වීම්වලට මිනිසුන් ඇද්දෙව්වෙ. ඇති වන තුරු කාර් තිබුණා. වැඩ කළ ඒවා එක්සත් ජාතික පක්ෂයට වැඩ කරන ඒවා බව දැන ගැනීමට සලකුණක් වශයෙන් කොළ පාට මල් මාලා යොදා තිබුණා. යූ. එන්. පී. කාර් බව පෙන්වන්න ඒ විධියට වැඩ පිළිවෙළ යොදා තිබුණා. රාජ්‍ය බලය පාවිච්චි කර මැතිවරණ කටයුතු සඳහා ඇමතිවරුන්ට නිල ගමන් යාමට තිබෙන රථ වාහනවල උප ඇමතිවරුනුත් ගමන් කර ඉවර කළ නමුත් ඒ මගිනුත් මෙවැනි අතුරු මැතිවරණයකින් ජයග්‍රහණය කරන්නට බැරි වීම මේ ආණ්ඩුවට ලජ්ජාවක් බව මා කියන්න ඕනෑ. එම නිසා මේ නීතිය සෑහෙන ප්‍රමාණයකට වෙනස් කරන්න ඕනෑ.

පොලිස්කාරයන් අල්ලාගෙන මොනවද කරන්නෙ? රුපියල් පහට යට වන අය ඉන්නවා; බෝතලයට යට වන අය ඉන්නවා සමහර තැන්වල. කට උත්තරයක් ගත්තා; උසාවියට ගියා. මොකක්ද වෙන්නෙ? නඩුකාරයින් ආසනය අහිමි කර තීන්දුව දෙනවා. ඒ තීන්දුවට විරුද්ධව ඇපැල් උසාවියේ තීන්දුව දී තිබෙනවා. තමන් උසස් තත්ත්වයක සිට ගෙන තමන් ඉදිරියේ අසත්‍ය ප්‍රකාශ කර නවා නම් නඩුකාරවරුන්ටත් යම් යුතුකමක් තිබෙනවා ඒ ගැන කියන්න. මෙවැනි ප්‍රශ්නයක් උඩ මේ ගරු සභාවේ මන්ත්‍රීවරයෙකුට විරුද්ධව දුන් මැතිවරණ නඩු තීන්දුවක් ඇපැල් උසාවියෙන් නිෂ්ප්‍රභ කළා. ඒ මගින් කටුගම්පල ගරු මන්ත්‍රීතුමාගේ (වී. බී. සුබසිංහ මයා.) ගෞරවය ආරක්ෂා කර ගන්නට පුළුවන් වුණා. ජනසම්මතවාදය ආරක්ෂා වෙන්නට නම් අපටත් සෑහෙන තත්ත්වයක් දෙන්නට ඕනෑ. එතකොට තමයි අපට ඔය පැත්තෙ පුටුවලට නැවත වරක් යන්නත් තමුන්නාන්සෙලාට මේ පැත්තේ පුටුවලට නැවත වරක් එන්නත් පුළුවන් වන්නෙ.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)
ප්‍රාර්ථනයක් වගෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலகரத்ன)*
(Mr. Stanley Tillekeratne)

දොඩම්ගස්ලන්ද සහ වැලිමඩ යන මැතිවරණ කොට්ඨාශවල අතුරු මැතිවරණ දෙකක් තිබෙනවා. මේ දැනගත් පාඩම් වලින් ඒ අතුරු මැතිවරණ දෙක ජනසම්මත ලෙස මේ රටේ පැවැත්වීමට මේ රජය අපට සහාය දෙනවා ඇත කියන විශ්වාසය උඩ දොම්පේ ගරු මන්ත්‍රීතුමාගේ අතුරු යෝජනාව මා ස්ථිර කරනවා.

අ. භා. 3.00

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)
*(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய)*
(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවට පැමිණි අලුත් මන්ත්‍රීවරයෙක් හැටියට මේ පිළිබඳව වචන කීපයක් කථා කරන්ට අදහස් කරනවා. පසුගිය අතුරු මැතිවරණයට පමණක් නොව පසු ගිය මහා මැතිවරණයටත් මුහුණ දුන් මන්ත්‍රීධුරාපේක්ෂකයෙක් මේ ගරු සභාවේ සිටිනවා නම් සිටින්නෙ මා පමණක් බව මතක් කරන්ට කැමතියි. මහා මැතිවරණයෙන් පැරදුණු මා මේ එක්සත් ජාතික පක්ෂය විසින් ඒ මැතිවරණයේ දී ගෙන ගිය දූෂණ ව්‍යාපාරයන් සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියට ගියා.

කථානායකතුමනි, අපි සාමාන්‍යයෙන් ධනවාදී පක්ෂයක්වත් ධනය ඇති පක්ෂයක්වත් නොවෙයි. එම නිසා අධිකරණය ඉදිරියට යන්ට අපට ඒ තරම් පහසුකම් නැහැ. කරුණු මෙහෙම නිසා එක්සත් ජාතික පක්ෂය වැනි ධනවාදී පක්ෂයක් විසින් ගෙන යනු ලබන දූෂණ ක්‍රියා අධිකරණයක් ඉදිරියේ ඔප්පු කිරීම අපට බොහොම අමාරු දෙයක්. මන්ද? එක්සත් ජාතික පක්ෂය මැතිවරණ ව්‍යාපාරවලදී දූෂණ කටයුතු සඳහා විශාල මුදලක් යොදවනවා. එපමණක් නොවෙයි, මැතිවරණයෙන් පසුවත් විරුද්ධ පක්ෂයට හිමි වුණු ආසන අහිමි කරන්ට විශාල මුදලක් වියදම් කර මහා නීතිඥයන් අල්ලා අධිකරණය ඉදිරියට යාමට පවා එක්සත් ජාතික පක්ෂය කටයුතු කරන බව මා මතක් කරන්ට කැමතියි. අපි දුප්පත් නිසා මහා නීතිඥයන් අල්ලාගෙන නීතිය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්ට පොහොසත්කමක් අපට නැහැ.

එහෙත්, බෙන්තර-ඇල්පිටිය ආසනයට තරඟ කොට 1965 මාර්තු මැතිවරණයේදී මා පරාජය වීමෙන් පසු අධිකරණය ඉදිරියට ගියා. එසේ අධිකරණය ඉදිරියට යන්ට හේතු වුණේ එක්සත් ජාතික පක්ෂය ඒ මැතිවරණයේ දී ගෙන ගිය දූෂණ වැඩ පිළිවෙළයි. රාජ්‍ය නායකයා වශයෙන් ගරු අගමැතිතුමාට මා ඉතාමත් ආදරය කරනවා. එහෙත්, එක්සත් ජාතික පක්ෂය ඉතාමත් නිහීන නින්දිත අන්දමට 1965 මාර්තු මැතිවරණ සටන ගෙන ගිය බව මා කියන්ට ඕනෑ. එකල ඇල්පිටිය පොලීසියෙ හිටපු පොලිස් පරීක්ෂකවරයා වාම පාක්ෂික ජනතාවට තිරිසනකු වගේ පහර දුන් හැටි මැතිවරණයෙන් පසු අගමැතිතුමාට මා විදුලි පුවත් මගින් දැනුම් දුන්නා. ඒවා ගැන කිසිම සැලකිල්ලක් දැක්කුවෙ නැහැ. පිස්සු බල්ලන් එළව එළවා කන්න වගේ ඇල්පිටිය පොලීසියේ එදා සිටි පොලිස් පරීක්ෂකවරයා ඡන්ද දායකයින්ට පහර දුන් හැටි සිහි වන විට මට අදත් කඳුළු එනවා.

ගරු කථානායකතුමනි, මා මේ කරුණු ඉදිරිපත් කරන්නෙ මා මැතිවරණ දෙකකින් ලබාගත් අත්දැකීම් මේ ගරු සභාවේ ඉදිරිපත් කළයුතු නිසයි. කලින් කථා කළ දොම්පේ ගරු මන්ත්‍රීතුමා කිව්ව වගේ, බෙන්තර-ඇල්පිටිය අතුරු මැතිවරණයේදී ගෙන ගිය දූෂණ විශාලයි. පින්තූර කොළ ඇලවීම; පෝස්ටර් ප්‍රදර්ශනය ඉතා විශාල අන්දමට මේ බෙන්තර-ඇල්පිටිය ආසනයේ පැවතුණු බව කියන්ට ඕනෑ. එය නීති විරෝධී බවක් එක්සත් ජාතික පක්ෂය කිසිම අවස්ථාවක සැලකුවෙ නැති බව පෙනුණා. එක්සත් ජාතික පක්ෂයේ නායකයාගේ හෙවත් මේ රටේ අගමැතිතුමාගේ ඡායාරූප ඉතා විශාල ප්‍රමාණයට මුද්‍රණය කර—මේ ඡායාරූප ගෙන තිබුණේ එක්සත් ජාතික පක්ෂයෙන් තරඟ කළ මහත්මයා අගමැතිතුමාගේ සාක්කුවෙ සිටින අන්දම දැක්වෙන විදියටයි—බෙන්තර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

පාලමේ පටන් බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයේ හැම පාරක් ගානෙම, හැම ගෙයක් ගානෙම වගේ අළවා තිබුණා. ගෙවල් 10,000 කට වැඩි තරමක ඒ පින්තූර ගසා තිබුණ. ඒ ගෙවල් හිමියන් එපා කියද්දිත් බලෙන් ඒ පින්තූර ඒ ගෙවල ගහල මෙම අතුරු මැතිවරණ ව්‍යාපාරය ගෙන ගිය බව මේ ගරු සභාවේ දැනගැනීම පිණිස ප්‍රකාශ කරන්ට ඕනැ. මේ වගෙ නීති විරෝධි වැඩ කරන්නෙ ඇයිද කියන එක අපට ප්‍රශ්නයක්. ආණ්ඩු බලය පාවිච්චි කරල මේ විදියට කරන්ට පුළුවන්.

මගේ කොට්ඨාශයෙ මැතිවරණ ව්‍යාපාරය මෙහෙයවූයෙ මහා යෝධයෙක් වගේ ඉන්න සෞඛ්‍ය ඇමතිතුමා බව මා දන්නව. අපේ මැතිවරණ සටන ගෙන යන අවස්ථාවෙදි අපි එතුමට කිව්වෙ දීග ජන්තු මහා යෝධයා කියලයි. අපේ අග මැතිතුමාගෙ විසි මහ යෝධයන්ගෙන් එක් කෙනෙක් කියලයි තැන්-තැන්වල කියැවුණේ. කෙසේ හෝ වේවා මහා යෝධයෙක් වැනි සෞඛ්‍ය ඇමතිතුමා, රජයේ වැඩ ඇමතිතුමා, ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා, ලංගම කටයුතු භාර ජනසතු සේවා ඇමතිතුමා ආදි ඇමතිවරු ඒ ප්‍රදේශයේ සැරිසැරුවා, මැතිවරණ කටයුතු කරමින්. අපේ අධ්‍යාපන උප ඇමතිතුමාත් ගෙයින් ගෙට සංචාරය කළා. කලින් සඳහන් කළ නීති විරෝධි වැඩ කෙරෙද්දි මෙතුමන්ලා දැක්ක. එතුමන්ලාම ඒ විදියෙ නීති විරෝධි කටයුතු කළාය කියා සමහර අවස්ථාවලදි ගැමියො අපට පැමිණිලි කළා. "එතුමන්ලා මේ විදියෙ අයුක්තියක් කරනවා, තමුන්නාන්සෙ තරහ වෙන්ට එපා, අපේ ගෙවල බලෙන් පින්තූර ඇලෙව්වා" කියා ඒ අය අපට පැමිණිලි කළා. මෙන්න මේ අන්දමටයි, මේ කටයුතු කෙරීගෙන ගියේ. ප්‍රජාතන්ත්‍රවාදය රකිනවායයි කියන පක්ෂයෙ උදවිය—ප්‍රජාතන්ත්‍රවාදය රකිනවායයි මහ හයියෙන් කියන කෙනෙකුගෙ නායකත්වයෙන් යුත් පක්ෂයක උදවිය—මෙහෙම නීති විරෝධි වැඩ කරනවා නම් මේක ප්‍රජාතාන්ත්‍රවාදයක්ද කියා මා අහන්ට කැමතියි.

අතුරු මැතිවරණ කාලෙ සිදුවුණු වැඩ ගැන මතක් වනකොට මට හිනා යනව. අපේ ප්‍රදේශයේ තරුණයන් දහස් ගණනක් මේ කාලය තුළ, ලංගමයේ රක්ෂා දීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට කැඳවා තිබෙනවා. එසේ කැඳවා තිබෙන්නෙ 24 වන දායින් පස්සෙ රක්ෂා දීම සඳහායි. සමහර විට අගමැතිතුමා මේව නොදන්නවා වෙන්ට පුළුවනි. 24 වන දායින් පස්සෙ රක්ෂා දීම සඳහා බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයේ තරුණයන් රාශියක් සම්මුඛ පරීක්ෂණය සඳහා මැතිවරණ කාලය තුළ ලංගම කාර්යාලයට ගෙන්නල තිබෙනව. 24 වන දායින් පස්සෙ රක්ෂා දෙනවාය කියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිතවත්ව සිටි තරුණයන් තමන්ගෙ පක්ෂයට හරවාගෙන ඒ අයගෙ ගෙවල කාර්යාල දමන්නට පොළඹවාගත් බව විශේෂයෙන් මේ අවස්ථාවෙදි මතක් කළ යුතුයි.

රජයේ වැඩ අමාත්‍යාංශයෙ උප ඇමතිතුමා ගිහින් ගිංගඟ එගොඩ-මෙගොඩ මැන්න, වැලිවිටිය ප්‍රදේශයේ මහා පාලමක් දමන්නට. ගම්සභා පාරවල ඉතුරු හරිය සේරම තාර දාල පාරවල් හදන්නට අපේ පළාත් පාලන උප ඇමතිතුමා ගියා. එපමණක් නොවෙයි, 1965 මාර්තුවලට පෙර ඇල්පිටිය ආරෝග්‍යශාලාවේ මාතෘ වාට්ටුවක් තැනීම සඳහා මුදල් වෙන් කර, ඒ සඳහා එකල හිටපු අගමැතිනිය අතින් මුල් ගලකුත් තබා තිබුණ. මේ මුල් ගල වෙනස් කරල, අපේ මේ මහා යෝධ සෞඛ්‍ය ඇමතිතුමා ගිහින්—[බාධා කිරීමක්]

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (සෞඛ්‍ය ඇමති)**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—சுகாதார அமைச்சர்)*

(The Hon. M. D. H. Jayawardena—Minister of Health)

මුල් ගල එතැනම තිබෙනව.

**කාරියවසම් මයා.**

*(திரு. காரியவசம்)*

(Mr. Kariyawasam)

එතැන මුල් ගල තිබෙන බව ඇත්ත. වෙනින් මුල් ගලක් තබල අමුතු වැඩක් හැටියට මේ වැඩේ පටන් ගත්ත. දැන් ගල් මුල් දෙකක් වෙලා, කථානායකතුමනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලංකා ගමනාගමන මණ්ඩලයේ ඇල්පිටිය ඩිපෝව පිළිබඳව මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමත් සඳහන් කළා. එම ඩිපෝවෙ මැනේජර්වරයා—කළමනාකාරවරයා—ඇමති වරයගෙ පිටිපසින් කැඳවගෙන ගිහින් ඡන්ද වැඩ කටයුතුවල යෙදෙව්ව. ඒ අනුව එම ලංගම කාර්යාලය සම්පූර්ණයෙන්ම කොළපාට තිරවලින් වැසුව. එපමණක් නොවෙයි, වැඩ තහනම් කරනව නම් එවෙලේම වැඩ තහනම් කළයුතු තරමට ඔහු කටයුතු කර තිබෙනව. වේදිකාවලට නැගී එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන්න යයි කියමින් ඇමතිවරු ඉදිරිපිට සිටගෙන කතා කර තිබෙනව.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සෙ සොයා බැලුවොත් පෙනේවි, මෙම කාලය අතරතුර බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශය පමණක් දෙසිය ගණනකට ලංගමයෙ රක්ෂා දී තිබෙන බව. මේක ඇත්තක්ද බොරුවක්ද දන්නෙ නැහැ ; මා කියන්නෙ අසා තිබෙන ආරංචිය අනුවයි. ඇපැල් තීන්දුව අනුව ආසනය අහිමි වූ දිනත් ඊ ළඟට නාම යෝජනා පත්‍ර භාර දෙන දිනත් අතරතුර කාලයෙ එම ප්‍රදේශයෙ තරුණයන් 270 ගණනකට ලංගමයෙ රැකීරක්ෂා දුන්නාය යන්න තමුන්නාන්සෙ ඉදිරිපිටදී මම ප්‍රකාශ කරනව, මුළු රටේම ජනතාවගෙ දැනගැනීම පිණිස. මේව පගා දීම් නොවෙයිද, මේව අල්ලස් දීම් නොවෙයිද, කියා මා අහනව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිසා ගම් සභාපතිකම ගත්ත තැනැත්තකුට සංයුක්ත මණ්ඩලයක තැනක් දෙනවය කියන පොරොන්දුව දී—අපේ මෙම සෞඛ්‍ය ඇමතිතුමා එහෙම නොවෙයිද මම දන්නෙ නැහැ, මේව කළේ—ඔහුව සම්පූර්ණයෙන්ම එක්සත් ජාතික පක්ෂයෙ අනුගාමිකයකු කර ගත්ත පමණක් නොවෙයි, නාම යෝජනා පත්‍ර අත්සන් කරන්න පවා පොළඹවා ගත්ත. මේව දූෂණ ක්‍රියා නොවෙයිද කියා මා අහනව. මෙවැනි දූෂණ ක්‍රියා සිදු වෙනව නම් තමුන්නාන්සෙල පනවන නීති රීතිවලින් ඇති ඵලය කුමක්ද කියා මා ප්‍රශ්න කරනව.

දෙද්දුව බැම්ම පටන් ගත්තෙ මා මීට ප්‍රථම මන්ත්‍රීවරයකු වශයෙන් සිටිය කාල යෙදියි. එදා ගරු ඉඩම් ඇමතිතුමා ගොස් දෙද්දුව ව්‍යාපාරය පටන් ගත්ත. බලපිටියෙ ගරු මන්ත්‍රීතුමත් ගියා, එම අවස්ථාවෙදි. නමුත් මේ සැරෙත් ඉඩම් ඇමතිතුමා ගිහින් කියනව, "තමුන්නාන්සෙලාට මේ වතුර පාරෙ දොර ඇරෙන්නෙ බෙන්තර-ඇල්පිටිය ආසනයෙන් එක්සත් ජාතික පක්ෂය දිනෙව්වොත් පමණයි" කියා. එසේ නැති නම් දොර වැහෙනව. දැන් ඒ දොර වැහිල. උන්නැහෙ ඒ දොර වහන්න තවම ගියෙ නැහැ. 1960 වර්ෂයෙ රාජාසන කතා විවාදය පැවති අවස්ථාවෙදිත් මම යෝජනා කළ දිවිතුර වෙල්යාය ඇස්වැද්දීම පිළිබඳව මේ ඉඩම් ඇමතිතුමා ගිහින් මහජනතාව මුළාකර ඔවුන්ගෙ ඡන්දය ලබා ගැනීමට තිබෙන වුවමනාව නිසා නැවත වරක් පොරොන්දු දී අවුත් තිබෙනව, එම ව්‍යාපාරය කර ගෙන යන බවට. එපමණක් නොවෙයි, මැතිවරණයට නාම යෝජනා පත්‍ර භාර දී දින හතරකින් එම ප්‍රදේශයෙ ඉඩම් කච්චේරියක් පවත්වන්න අණ කළා. දැන් ඉඩම් කච්චේරි පවත්වනව. ඉඩම් කච්චේරි 10 ක් 12 ක් පවත්වා තවම ඉඩම් දීගෙන යනව. මේව අල්ලස් දීම් නොවෙයිද කියා මා අහනව. එක්සත් ජාතික පක්ෂයෙ අපේක්ෂකයට ඡන්දය දුන්න පමණින් මේ ඉඩම් ලැබෙනවය කියා එම අවස්ථාවෙදි කීව. මේ ඡන්ද ව්‍යාපාරය කළේ මෙන්න මේ වගේ දූෂණ ක්‍රියාවලින් මුළු ප්‍රදේශයම ගඳගස්සවලාය කියා මා තමුන්නාන්සේට කියන්න ඕනෑ. හැබැයි, බෙන්තර-ඇල්පිටිය ආසනය රුහුණු ප්‍රදේශයේ රුහුණු බල මණ්ඩලයේ ප්‍රධාන පෙරමුණ හැටියට එක්සත් ජාතික පක්ෂයට හොඳ පාඩමක් ඉගැන්නුව. එක්සත් ජාතික පක්ෂය එක ගමක කාර්යාල හතර පහ දමා තිබියදීත්, ජාතියේ මහා නායකයන්ගේ සාක්කුවල අපේක්ෂකයාගේ පින්තූර දමා ගෙන සිටියදීත්, හැම ගෙදරකම සිටින තරුණ තරුණියන්ට රක්ෂා දෙන බවට පොරොන්දු දී තිබියදීත්, නියතපාලගේ මැරවර හමුදාව ගොස් ඇල්පිටිය නගරයේ වාඩිලාගෙන මිනිසුන්ට හිරිහැර කරද්දීත්, එකම කාර්යාලයක්වත් නැතිව, එකම කොඩියක්වත් නැතිව, එකම පෝස්ටරයක්වත් නැතිව, එකම ලකුණක්වත් නැතිව, එකම තොප්පියක්වත් නැතිව, සිංහල සේනා නායක කෙනෙකුගේ නායකත්වයෙන් බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශයේ මහ ජනතාව ඉදිරියටම ගමන් කළ බව මා කියන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

ගරු කථානායකතුමනි, අපේ ගරු අග මැතිතුමාගේ පින්තූර ඇලවීමේදී ඇති වූ දුෂ්කරතාවයන් ගැනත් විශේෂයෙන් කල්පනා කළ යුතුව තිබෙනව. හැම ගෙයකටම ගොස් ආණ්ඩු බලය පා පෝස්ටර් ඇලෙව්වා. එපමණක් නොවෙයි; එසේ පෝස්ටර් ඇලවීමට බැරිය කී ගෙවල අයගේ නම් වෙනම ලියා ගෙන ඇවිත් තිබෙනව. එසේ කර තිබෙන්නේ ඒ අයගෙන් පළිගැනීමේ ව්‍යාපාරයකටද කියා මා දන්නෙ නැහැ.

ඊළඟට වතුවල ඡන්ද ව්‍යාපාරය ගෙන ගියේ කොහොමද කියා බලමු. වතුවල ඡන්ද ව්‍යාපාරය ගෙන ගියේ වතු සුපිරින්ටෙන්ඩන්ට්ලා අල්ලා ගෙන ඔවුන් ලවා කම්කරුවන්ට කොළපාට කමිස අන්දවලයි. මේ කරුණු ගැන මා තමුන්නාන්සේට මතක් කරන්නේ මැතිවරණවලදී ඇතිවන අක්‍රමිකතාවයන් පෙන්වා දීම සඳහායි. යම් විධියකින් ඒවා නැති කරන්න පුළුවන් නම් ඒ අනුව නීතිය සංශෝධනය කරන්නටය කියා මා ඉල්ලා සිටිනව.

ගරු කථානායකතුමනි, මැතිවරණ කටයුත්තක් නිසා යම් කෙනෙක් වත්තක රක්ෂාවෙන් අස් කළොත් එසේ කළ තැනැත්තා 6 මාසයකට හිරේ යවන්නට පුළුවන්ය කියා අද තිබෙන නීතියේ සඳහන්ව තිබෙනව. එහෙත්, කිතුල්විටිගල වත්තේ ගුණවර්ධන කියන වතු පාලකයා කළේ මොකක්ද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඡන්දය දුන්නාය යන විශ්වාසය උඩ අද කම්කරුවන් සිය ගණනක් වත්තෙන් අස් කර තිබෙනව. ඒ ගැන පොලිසියට පැමිණිලි කළ විට ඔවුන් කියන්නේ "අපට කරන්න දෙයක් නැහැ, පැමිණිල්ල බාර ගන්න බැහැ" කියලයි. එවැනි දේ සම්බන්ධයෙන් මාස 6 කට හිරේ යැවීමට නීතියක් තිබෙනවා නම්, ඒවා ගැන පොලීසිය ක්‍රියා නොකරන්නේ ඇයි කියා මා අහනව. මේවාට තමුන්නාන්සේලා විසින් පිළිතුරු දිය යුතුව තිබෙනව.

බෙන්තර-ඇල්පිටිය ඡන්ද කොට්ඨාශයේදී මට දක්නට ලැබුණු තවත් දෙයක් නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පක්ෂ බොහෝ දෙනෙකුගේ නම් ඡන්ද ලැයිස්තුවලින් කපා හැර තිබෙන බවයි. සමහරවිට අපටම දොස් පැවරෙන අන්දමින්, 6 මාසයකට කලින් නැත්නම් ජනවාරිවලදී ඒ ගැන සොයා නොබැලුවේ ඇයි කියා අහන්නට පුළුවන්. එසේ පරීක්ෂා කරන්න අපට අවස්ථාවක් නොලැබුණත් අපේ ආධාරකරුවන් දහස් ගණනකගේ නම් ඡන්ද ලැයිස්තුවලින් කපාහැර තිබෙන බව නම් මේ ගරු සභාවේදී මා විසින් මතක් කළ යුතුව තිබෙනව. මේ ගැන පරීක්ෂණයක් පවත්වන ලෙස මා ඉල්ලා සිටිනව. 1965 මාර්තු මහා මැතිවරණයේදී ඒ නම් ඡන්ද ලැයිස්තුවල තිබුණා. එහෙත් 1966 අතුරු මැතිවරණයේදී ඒ නම් කපා හැර දමලා. මගේ ගෙදර දෙදෙනකුගේ නම් කපා දමලා. මෙන්න මේ අන්දමටයි, මේ රටේ කටයුතු සිදු වීගෙන යන්නෙ.

මූලික ඡන්ද ලැයිස්තුව හැටියට දනට ගණන් ගන්නේ ඉංග්‍රීසියෙන් තිබෙන ඡන්ද ලැයිස්තුවයි. ගෘහ මූලික ලැයිස්තු ලියන්නෙත් ඒ ප්‍රදේශවල ගම්මුන්ගේ සියලුම වැඩ කරගෙන යන්නෙත් සිංහලෙන් නිසා රාජ්‍ය භාෂාව වූ සිංහලෙන්ම මූලික ඡන්ද ලැයිස්තුව පිළියෙල කළ යුතුයි.

කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා කීවා වගේ, මධ්‍යස්ථව සිටිය යුතු නිසා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට පත් කොට ඇති අධිකරණ ඇමතිතුමා බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයේ සාම මණ්ඩල සභාපතිවරුන් එකතු කරගෙන ගොස් ඉතාමත්ම නින්දිතීය අන්දමට කථා පවත්වා මැතිවරණ කටයුතුවල යෙදුණා. මේ අන්දමට වැඩ කරලත් බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශය ජය ගන්නට ආණ්ඩුවට බැරි වුණා. 1965 මාර්තු මාසයේදී නම් නොයෙකුත් දූෂණ ක්‍රියාවල යෙදීම නිසා වැඩි ඡන්ද 1001 කින් ඒ කොට්ඨාශය ජය ගන්නට ආණ්ඩු පක්ෂයට පුළුවන් වුණා. මේ වර අතුරු මැතිවරණ සටනේදී ආණ්ඩු කරන පක්ෂය හැටියට කලින් කළාටත් වඩා නොයෙකුත් දූෂණ ක්‍රියාවල යෙදෙමින් මහ ජනයා මුළා කර ගන්නට උත්සාහ කළත්, මේ ආණ්ඩුව මෙතෙක් මේ රටේ ගෙන ගොස් ඇති ජාති විරෝධී ව්‍යාපාරය නිසා මේ ආණ්ඩුවට විරුද්ධව ඒ මහජනයා නැඟී සිටි බව කියන්නට ඕනැ. තමා තුළ ඇත් කේ. බී. එස්. සේනානායක මහතාගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලේ බවත්, එහෙයින් තමා ජාති විරෝධි ක්‍රියාවක් නොකරන බවත් අපේ ගරු අගමැතිතුමා මැතිවරණ සමයේදී ප්‍රකාශ කළත්, බෙන්තර-ඇල්පිටියේ ජනතාව නම් එතුමාගේ ඒ ලේ පිළිබඳ කථාව විශ්වාස කෙළේ නැහැ. ඉදිරි අනාගතයේ වැඩ කටයුතු ගැන කල්පනා කරන විට මේ රටේ වැඩි ජනතාවගේ ප්‍රශ්න ගැන ප්‍රමුඛ සැලකිල්ලක් දක්විය යුතු බව පෙන්වා දීමටයි, මේ කාරණය මෙහිදී සඳහන් කෙළේ.

මැතිවරණ ව්‍යාපාරයේදී අප කොතරම් දුරට මැතිවරණ නීතිය රැකීමට ක්‍රියා කළත් එය අපට පමණක් තනිව කළ නොහැකියි. සියලුම දේශපාලන පක්ෂ ඒ සඳහා උනන්දුවක් දක්වා ක්‍රියා කළ යුතුයි. එක පක්ෂයක් නීතිය රකින විට අනික් පක්ෂය නීතිය කඩනවා නම් එයින් වැඩක් නැහැ. එහෙයින් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කීවා වගේ දෙපක්ෂයේම සහයෝගයෙන් මේ කටයුත්ත කළ යුතු බව මාද මතක් කරනවා.

ගරු කථානායකතුමනි, අලුත් මුහුණක් ඇතිව මෙම ගරු සභාවේදී අද දින පෙනී සිටින අතරම මේ මැතිවරණ නීති රීති ගැන කථා කරන්නට අවස්ථාවක් ලැබීම ගැන මා සතුටු වෙනවා. ගරු කථානායකතුමා මේ යෝජනාව අදටම නියම කොට න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමෙන් කර ඇත්තේ අලුතෙන් පෙනී සිටින අපට අවස්ථාවක් ලබා දීමක් බව කියන්නට කැමතියි.

1965 මාර්තු මැතිවරණය පැවැත්වූ ආකාරය අපට කවදාවත් අමතක වන්නේ නැහැ. රැකීරක්ෂා නැති තරුණි යන්ට රක්ෂා දෙන්න පොරොන්දු වී ඔවුන් වේදිකාවලට නංවා, විරුද්ධ පක්ෂයේ අපේක්ෂකයා දූෂකයකු හැටියට ඔවුන් ලවා ප්‍රකාශ කරවීම එක්සත් ජාතික පක්ෂය විසින් අපේ ප්‍රදේශවල පමණක් නොව මුළු රට පුරාම ගෙන ගිය ව්‍යාපාරයක්. බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශයෙ තරුණියන් සිය ගණනක් ඒ විධියට වේදිකාවලට නංවා ඔවුන් අල්ලසින් මුළා කොට ඔවුන් ලවා නොයෙක් විධියේ විශේෂ ප්‍රකාශනයන් කරවූ බව මට දකින්න ලැබුණා. රැකීරක්ෂා දෙන්න බවට පොරොන්දු වී මේ තරුණියන්ට කරන ලද අපරාධය නිසා අද ඔවුන් එක්සත් ජාතික පක්ෂය සමග ද්වේෂ සහගත කෝපයකින් පසු වන බව අපට පෙනෙනව. එදා කළ නින්දනීය ප්‍රකාශයන් ගැන අද ඔවුන් පසුතැවිලි වෙනව, පශ්චාත්තාප වෙනව. මේ අන්දමේ මඩ ගැසීමේ ව්‍යාපාර ගෙන ගොස් මේ රටේ ජනතාව මුළා කරන්න හැමදාමත් නොලැබෙන බව මා මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

මැතිවරණ සම්බන්ධ නීති රීති නිසි අන්දමට හැදුවොත්, මැතිවරණ කටයුතු වලදී අධිකරණය ඉදිරියට යන්නට සිදු වන්නෙ බොහොම කලාතුරකින් කෙනකුට පමණයි. මැතිවරණ නඩුවක් සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියට යාමට කොපමණ වස්තුවක් වැය කළ යුතු ද යන කරුණ තමුන්නාන්සෙ හොඳ හැටි දන්නව. ඒ සඳහා ඉදිරිපත් විය හැක්කේ බොහොම ටික දෙනකුට පමණයි. මැතිවරණවලදී සිදුවන දූෂණ සම්බන්ධව අධිකරණය ඉදිරියට යන්න විශේෂයෙන්ම විරුද්ධ පක්ෂයෙ මන්ත්‍රීවරුන්ට මුදල් නැති නිසා එබඳු දූෂණයන් එළි කරන්න අවස්ථාවක් ලැබෙන්නෙ නෑ. එම නිසා එවැනි දූෂණයන් වැළැක්වීමට කවුරුනුත් එකතු වී කටයුතු කළ යුතු බව මා විශේෂයෙන් සඳහන් කරනව.

මා මේ සම්බන්ධයෙන් වැඩිදුර කථා කරන්න අදහස් කරන්නෙ නෑ. මට ලැබුණු මේ මුල් අවස්ථාවෙදීම මම බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයෙ පමණක් නොව මුළු ලංකාවෙම ප්‍රගතිශීලී ඡන්දදායකයින්ට ස්තුති කළ යුතුව තිබෙනව. සාමකාමී මැතිවරණයක් පැවැත්වීමට බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශයෙ ඡන්දදායකයින් ගත් උත්සාහය ගැන විශේෂයෙන්ම මම ඔවුන්ට ස්තුතිවන්ත වෙනව. එක්සත් ජාතික පක්ෂයෙ බල කොටුවක් වශයෙන් පෙන්නගෙන හිටි මේ ප්‍රදේශයේ රුහුණු ගැටවුන් වියට්නාමයෙ ගරිල්ලා භටයින් මෙන් එක්සත් ජාතික පක්ෂයට පහර දුන්නා. එපමණක් නොවෙයි, මැතිවරණය පැවැත්වුණු දිනය වූ 24 වැනිදා නියතපාලගෙ මැරවර හමුදාවට එළව එළවා පහර දුන්නෙත් මේ රුහුණු ගැටවුන්ම බව මම මතක් කරන්න ඕනෑ. අයුක්තියට

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

ඉඩ නොදීමත් බොරු පොරොන්දුවලට නොරැවටීමත් මේ රුහුණු ගැටවුන්ගෙ හොඳ සිංහල ගතියක්. ජාතිය පාවා දෙන්න මේ රුහුණු ගැටවුන් ඉඩ නොදෙන බව ජාතියෙ පියාගෙ පුතාට කෙලින්ම පෙන්වා දෙන්නට තරම් ඔවුන් එඩිතර වුණා.

එපමණක් නොවෙයි. බෙන්තර-ඇල්පිටිය අතුරු මැතිවරණයේදී අපි දෙපක්ෂය අතර එක්තරා වෙනසක් කැපී පෙනුණා. මේ ප්‍රදේශයෙ සාමය පැවැත්තුවෙ අප බව සමහර පොලිස් නිලධාරීන් මා සමගම කියා තිබෙනව. සාමය පැවැත්වීමට උත්සාහ ගැනීම ගැන ඒ නිලධාරීන් මට ස්තුති කළා. සමහරවිට ඒ පොලිස් නිලධාරීන් අපට විරුද්ධ අය වෙන්න පුළුවන්. නමුත් අප සමග කලහ කරන්න ඔවුන්ට අවස්ථාවක් ලැබුණෙ නෑ. අපට අඩන්තේට්ටම් කරන්න ඔවුන්ට ඉඩක් ලැබුණෙ නෑ. එම නිසා මා මේ අවස්ථාවෙදි බෙන්තර-ඇල්පිටිය ඡන්දදායකයින්ටත් විශෙෂයෙන්ම ගාල්ලෙ දිසාපතිවරයටත් ස්තුති වන්ත විය යුතුයි. ගරු කථානායකතුමනි, මෙතන ගරු අධ්‍යාපන ඇමතිතුමා හිටිය. මා දන්නෙ නැහැ, මේ කාරණය ඇත්තද කියා. දැනටමත් මගේ ප්‍රදේශයෙන් පළිගැනීමේ නාම ලේඛන කීපයක් ගරු ඇමතිතුමාට ඉදිරිපත් කර තිබෙනවාය කියා මට ආරංචියි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඒ කාරණය මේකට අදාළ නැහැ.

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

මේක දැනගන්නට වුවමනා කරනව, ගරු කථානායකතුමනි. මැතිවරණයක් අවසාන වූ හැටියෙ පළිගැනීම් කරනව. ලංකා ගමනාගමන මණ්ඩලයෙ 27 දෙනෙකු පුත්තලම ආදී ප්‍රදේශවලට මාරු කිරීමටත් කටයුතු යොදා ගෙන යනවාය කියා මට ආරංචියි. මා දන්නෙ නැහැ, ඒක ඇත්තද කියා. පළිගැනීම සඳහා මුලින්ුත් කීප දෙනෙකුම මාරු කර තිබෙනව. බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශයෙ විසි දෙනෙකු පමණ මාරු කර තිබෙනව.

**ගරු වී. ඒ. සුගතදාස (ජනසතු සේවා ඇමති)**
*(கௌரவ வி. ஏ. சுகததாச—தேசியமய சேவைகள் அமைச்சர்)*
(The Hon. V. A. Sugathadasa—Minister of Nationalized Services)

කව්ද ඔව කරගෙන යනවාය කිව්වෙ ?

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

තමුන්නාන්සෙ තමයි ඒකට වගකිව යුත්තෙ. ලංකා ගමනාගමන මණ්ඩලයෙ සේවකයන් මේ විධියට ඉත්තො වගෙ මාරු කිරීම ගැන තමුන්නාන්සෙ කෙලින්ම වගකියන්න ඕනෑ. මේක වහාම නවත්වන්නය කියා නියෝග කරන මෙන් මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. මේ අයුතුකම් නොකරන මෙන් මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. පසුගිය කාලයේ තමුන්නාන්සේලා කළ පළිගැනීම් නිසා දෙවියොත් කෝපවී, මහජනතාවත් කෝපවී එක පිට එක හෙණ ගසන බව මා තමුන්නාන්සේලාට කියන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, තවත් කාරණයක් තිබෙනව. මේ නීති වෙනස් කරන්ට ඕනෑ. පසුගිය කාලයේදී අනුරාධපුර මැතිවරණයට අප කුණු කරවල යැව්වාය කියා තමුන්නාන්සේලා කිව්ව. මේ වතාවෙ තමුන්නාන්සෙල බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයට යවා තිබුණු කුණු කරවලවලින් මුලු ප්‍රදේශයම ඉවසිය නොහැකි තරමට ගඳ ගැසූ බව මා කිය යුතුයි. එපමණක් නොවෙයි. තවත් කාරණයක් ගැන අප සොයා බැලුව. අගමැතිතුමාගෙ කොට්ඨාශයෙ කිරි දරුවන් කිරි නැතිව අඩනව. ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගෙ කොට්ඨාශයෙ කිරි දරුවන් කිරි නැතිව අඩනව. ඉඩම් ඇමතිතුමාගෙ කොට්ඨාශයෙත් කිරිදරුවන් "නෙස්ප්‍රේ" නැතිව අඩනව. මේ තිදෙනාටම දරුවන් නැති නිසා එවැනි තත්ත්වයක් පවතින්නට ඉඩ හරිනවාද කියා මා දන්නෙ නැහැ. ඒ කෙසේ වෙතත් පසුගිය දිනවල බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශයෙ නම් කිරි උතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රන්න පටන් ගත් බව මා සඳහන් කළ යුතුයි. "නෙස්ප්‍රේ" පමණක් නොවෙයි, නොයෙක් නොයෙක් බඩු වර්ගවලින්, අරු මෝසම් බඩුවර්ගවලින් බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශයෙ සතොසේ ගබඩා පිරී ඉතිරී යන්නට පටන් ගත්තා.

ටී. බී. තෙන්නකෝන් මයා. (දඹුල්ල)
(திரு. ரீ. பி. தென்னகோன்—தம்புளை)
(Mr. T. B. Tennekoon—Dambulla)
දුන් කිරි වරල ඇති !

කාරියවසම් මයා.
(திரு. காரியவசம்)
(Mr. Kariyawasam)
නමුත් අද මිරිස් ගන්න විධියක් නැතිව මහජනතාව ලතවෙනව. ඊයෙ පෙරේදා මිරිස් යැව්වද කියා මා දන්නෙ නැහැ. එපමණක් නොවෙයි. පාලම් හදනවාය කිව්ව. පාරවල් හදනවාය කිව්ව. පාරවල් වල වැඩ කරනවාය කියා බොරුවට මිනිසුන් යැව්ව. නමුත් දුන් ඒ මිනිසුන් ආපසු ගෙන්වා තිබෙනවා. දුන් ඒව සියල්ලම දොඩන්ගස්ලන්ද පැත්තට හරවා තිබෙන වාලු. මෙන්න මේව නැති කරන්න නීති සම්පාදනය කළ යුතුයි.

ගරු කථානායකතුමනි, පසුගිය සභාග රජය පැවති කාලයේදී ඡන්දයට ගමනා ගමන මණ්ඩලයෙ බස් පාවිච්චි කළාය කිව්ව. මේ අවස්ථාවේදී මම තමුන් නාන්සේට කාරණයක් පෙන්වන්නම්. ලංකා ගමනාගමන මණ්ඩලයෙ සාමාජික යෙකු වූ නියතපාල කියන මහත්මයා—මා හඳුනන්නෙ නැහැ; ඒ මහත්මයා එක්සත් ජාතික පක්ෂයෙ තරුණ සංගමයෙ ලේකම් ද සභාපතිද කියාත් මා දන්නෙ නැහැ—මේ එක්සත් ජාතික පක්ෂයෙ සංවිධායක වරයා, ඇල්පිටියෙ සිනමා ශාලාවකට ගිහින් ආනන්ද, සාන්ත මරියා ආදී විද්‍යාලවල ඉහල පන්තිවල ඉගෙන ගන්නා ළමයින් බස් යවා ගෙන්වා ගෙන එක්සත් ජාතික පක්ෂයට මෙන්න මේ මේ අන්දමට ඡන්ද කටයුතු කරන්නය කියා උපදෙස් දී තිබෙන බව මට ආරංචියි. ඒ පාසැල් ළමයින් එක්සත් ජාතික පක්ෂයෙ තරුණ සංගම යෙ හටයින්ය කියා කල්පනා කර කටයුතු කළ හැකි මා තමුන්නාන්සේට කියන්ට ඕනෑ. එපමණක් නොවෙයි. මේ රටේ ලියා පදිංචි වූ ද්‍රවිඩ ජනතාව වැඩි ගණනක් සිටින වත්ත, මගේ කොට්ඨාශයේ තිබෙන දිවිතුරේ වත්තයි. ඡන්දදායකයන් හාරසිය ගණනක් එහි ඉන්නවා. ගිය වතාවේ ඒ අය පිටරට යවන්නෙ නැත කියන පොරොන්දුව පිට ඒ ද්‍රවිඩ මහත්වරුන්ගේ ඡන්දය ලබා ගෙන ඔවුන් විශාල හිරිහැරය කට පත් කළා. ඡන්දයෙන් පසු ඔවුන්ගේ හිරිහැර කරදර කිසි දෙයක් ගැන බලන්නෙ නැතිව හිටියා. නමුත් මේ අතුරු මැතිවරණයේදී මොකද කළේ ? කවදාවත් බස් එකක් නොගිය ඒ වත්තට පසුගිය 24 වැනිදා නියතපාල උන්නැහේම බස් රථවලින් ගොස්—මේ ප්‍රදේශයෙන් මොකක්ද හමුදා වකුත් අරගෙන ගොස්—ඒ ද්‍රවිඩ ජනතාව බලෙන් බස්වලට පටවාගෙන ගොස් නින් දිත අන්දමින් එක්සත් ජාතික පක්ෂයට ඔවුන්ගේ ඡන්දය ලබා ගන්නට කටයුතු කළා.

මේ වතාවේ බෙන්තර-ඇල්පිටියේ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය කළ වැඩවලින් මා ඉතාමත් තදින් හෙළාදකින එකක් තමයි, ගරු අධිකරණ ඇමතිතුමා ඉදිරිපිට සාම මණ්ඩලයේ සභාපති වරයකු ලවා නින්දිත අන්දමට කථා කරවන්නට සැලැස්වීම. පිටිගල ප්‍රදේශයේ සාම මණ්ඩලයේ සභාපතිවරයා එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන්නය කියා ඉල්ලා සිටියා. ගරු කථානායකතුමනි, එවැනි සභාපතිවරයකු සිටින සාම මණ්ඩලයකින් පක්ෂපාතීත්වයක් නැතිව කටයුතු කෙරෙනවාද කියා මම අහන්න කැමතියි. මේ ආණ්ඩුවේ අධිකරණ ඇමතිවරයා කට යුතු කරන්නේ මේ විධියට නම් මේ ආණ්ඩු වට නීතියක් තියෙනවද කියා මම අහන්න කැමතියි. නීතිය හදන්නට, නීතිය රකින් නට, නීතිය ක්‍රියාවේ යොදන්නට සිටින අධිකරණ ඇමතිවරයා නීතිය අපහාසයට ලක් වන අන්දමට පක්ෂපාතීත්වය පෙන් වමින්, පාක්ෂික හැඟීම ඇති කරමින් සාම මණ්ඩලයක සභාපතිවරයකු තමන්ගේ වේදිකාවට අරගෙන කථා කරවන්නට තරම් අයුක්ති සහගත වෙනවා නම්, එවැනි අධිකරණ ඇමතිවරයකු සිටින ආණ්ඩුවක් මොන නීති පැනෙව්වත් ඒවා ගරු කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

වාද යන්න සැක සහිත බව මම ප්‍රකාශ කරන්න කැමතියි. ඒ නිසා මේ හත් හවුල් ආණ්ඩුවේ මළගමට අත්සන් කළ බෙන්තර-ඇල්පිටියේ ජනතාව වෙනුවෙන් මම කියන්න කැමතියි, මේ මැතිවරණ නීති ගෙනෙන්නට මේ ආණ්ඩුව අද කථා කිරීමෙන් කරන්නේ ප්‍රෝඩාවක් බව. අද මේ නීති පනවන්නට ඒ අය කථා කළත් ඔවුන් කටයුතු කර තියෙන්නේ මේ රටේ නීතියක් නොදන්න, නීතියක් ගරු නොකරන පිරිසක් හැටියටයි. නව මන්ත්‍රීවරයකු හැටියට බෙන්තර-ඇල්පිටියෙන් ඇවිත් මා තමුන්නාන්සේට මේ කරුණු ඉදිරිපත් කරන්නේ අනාගතයේදීවත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැකෙන්නට, අනාගතයේදීවත් නීත්‍යනුකූලව මහජන ඡන්දයක් විමසන්නට කටයුතු සැලසේවිය යන බලාපොරොත්තුවෙන් බව ප්‍රකාශ කරමින් මෙතෙක් වේලා කථා කිරීමට මට ඉඩ දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 3.39

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ගරු කථානායකතුමනි, මීට ප්‍රථම කථා කළ ගරු යටියන්තොට මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මගෙන් පිළිතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නට යෙදුනා. එසේම දැන් ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකු විසින්ම මගේ පෞද්ගලික ක්‍රියා පටිපාටිය ගැනත්, ආණ්ඩුවේ ක්‍රියා පටිපාටිය ගැනත් කථා කරන්නට යෙදුනා. එම නිසා ඒ සමහර කරුණුවලට පිළිතුරු දීමට මට යුතුකමක් තියෙනවා. ඊට ප්‍රථමයෙන් මා ප්‍රකාශ කරන්න සතුටුයි, ගරු දොම්පේ මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) සංශෝධනයක් ඇති කිරීම පිණිස ඉදිරිපත් කළ අදහසට අපේ කිසිම විරුද්ධත්වයක් නැති බව. පිළිතුරු කථාවේදී ගරු සභානායකතුමා ඒ ගැන තව දුරටත් කරුණු පැහැදිලි කර දෙනවා ඇති.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා පුදුම අදහසක් ඉදිරිපත් කළා. ඡන්දය විමසන දිනයේ මා සංචාරයෙහි යෙදීම වරදැයි එතුමා කියා සිටියා. එය පුදුම කථාවක්.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

මා එහෙම කිව්වෙ නැහැ. [බාධා කිරීම්]

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මගෙන් ඇහුව මා ගියේ අගමැති වශයෙන් ද පුද්ගලයෙකු වශයෙන් ද කියා. [බාධා කිරීම්.] එහෙම නම් මට සිදු වන්නෙ බෝඩ් ලෑලි ගහගෙන අගමැති වශයෙන් යනවය පුද්ගලයෙකු වශයෙන් යනවය ආදි වශයෙන් යන්නයි. මෙය පුදුම කථාවක් නොවෙයි ද? එහෙම නම් කියාවි මා අගමැති වශයෙන් කථා කිරීමත් වැරදියි කියා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

එහෙම කිව්වෙ නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මොකක්ද මේ කථාවෙ තේරුම? ඡන්දය විමසන දිනයේ මා ගියා. එය සම්පූර්ණයෙන්ම ඇත්ත. බලංගොඩ කොට්ඨාශයේ රථවාහන යන්න පුළුවන් හැම ස්ථානයකටම වාගේ ගියා.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

ඒත් වැඩක් වුණේ නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

වැඩක් වුණේ නැතෙයි කියනවා. මා පොලීසියට ගිය බවක් හිටපු අගමැතිනියගෙ ප්‍රකාශයක මා දුටුවා. ඔව්, මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පොලීසියට ගියා. එය සම්පූර්ණ ඇත්තක්. මම කියන්නම්, මා පොලීසියට ගියෙ මොන හේතුවක් උඩද කියා. එක් ඡන්දපොළකට මා යන විට කෝලාහල සහිත තත්ත්වයක් තිබුණු බව මා දුටුවා. පොලීසිය පසු කරගෙන යන විට සාමකාමී ලෙස කටයුතු කරගෙන යා හැකි වන තත්ත්වයක් ඇති කිරීම සඳහා එතැනට තවත් පොලිස්කාරයන් කීප දෙනකු යවන ලෙස ඉල්ලීමක් කළා. එපමණයි මා කිව්වෙ. තමුන්නාන්සෙලාගෙනුත් ඕනෑම කෙනකුට පොලීසියෙන් එවැනි ඉල්ලීමක් කරන්න පුළුවන්කම තිබෙනවා. එයයි තත්ත්වය. එහෙත් මා එවැන්නක් කිරීම වරදක්ද. ඒ මොකද? මා අගමැතිවරයා නිසා ද? තමන් යම් කොට්ඨාශයක කටයුතු සතුටු දායක අන්දමට පාලනය කරගෙන යාමට එහි සිටින පොලිස් පිරිස මදි යයි සිත තොත් වැඩිපුර යවන ලෙස ඉල්ලන්න ඕනෑම කෙනකුට බලය තිබෙනවා. අන්න අර ඡන්ද පොළේ අසුවල් දේවල් වෙන වාය යනුවෙන් පොලීසියට ප්‍රකාශ කරන්නට ඕනෑම කෙනකුට පුළුවන්කම තිබෙනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

You gave orders.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Of course, I gave orders.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

You gave orders to arrest people.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

I never gave any orders to arrest people. You can question any police officer you like. You are entirely free—

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I accept that.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

I sent a message to the Aluthnuwara Police Station stating that there is going to be trouble as both sides had got worked up and therefore to please send some people to see that nothing happens.

**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)
*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)*
(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

But was that an order given by you in your capacity as Prime Minister?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

No, I did not even give an order, I sent the police officer who was with me to mention this fact to the police station. I did not even talk to any police officer.

මෙය පුදුම ප්‍රකාශයක්. මා අගමැති නිසා මා හැංගිලා ඉන්න ඕනෑද? මා අගමැති නිසා මා සැඟවී සිටිය යුතුය යන අදහසක් ඉදිරිපත් කිරීම පුදුම දෙයක් නොවෙයිද?

තවත් පුදුම කථාවක් ගැන සඳහන් කරන්න තිබෙනවා. බෙන්තර-ඇල්පිටිය ගරු මන්ත්‍රීතුමා (කාරියවසම් මයා.) කී කථාව ගැනයි මා කියන්නෙ. ඉන්දියානු කම්කරුවන් ආපසු යවන්නෙ නැති බවට පොරොන්දු වී ගෙන්නුවය කියනවා ඡන්දය ගන්න. අගමැති කොහොමද ඡන්දදායකයින් ඉන්දියාවට යවන්නෙ? සිරිමා-ශාස්ත්‍රී ගිවිසුමෙන් ඉන්දියාවට ඡන්දදායකයන් යවන්න එකඟ වී ඇද් දැයි අහන්න කැමතියි. මෙය මොන තරම් පුදුම කථාවක්ද? මොන මොන දේවල්ද අහන්නෙ යන්න මෙයින් පැහැදිලි වෙනවා නේද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

ඡන්දය දීමට සුදුසුකම් ලබා සිටින උදවිය ගෙ නම් කපා තිබෙනවය යනුවෙන් යම් කෙනෙක් තර්කයක් ඉදිරිපත් කළා. ඒ චෝදනාවම මගේ පක්ෂය වෙනුවෙන් වැඩ කළ අයගෙනුත් මට ආව. මම අදත් පොරොන්දු වෙනව, ඒ ගැන විශේෂ පරීක්ෂණයක් ඇති කරන බවට. ඒ කථා වලින් උත්සාහ දැරුවෙ මේවා අප කළ වැඩ හැටියට පෙන්වා දෙන්ටයි. මේ ඡන්ද විමසීම පැවැත්තුවෙ තමුන්නාන්සේලා ගේ කාලයේ ඇති කළ ඡන්ද ලැයිස්තු අනුවයි.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**

*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*

(Mr. Stanley Tillekeratne)

නැහැ. [බාධාකිරීම්]

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்லி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

1964—[බාධාකිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

නැහැ, 1965.

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்லி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

කෙසේ වෙතත් ඒ ගැන විභාගයක් ඇති කරනවාමයි. අනික් කාරණය, අපි අයුතු ලෙස ක්‍රියා කරමින් මේ අතුරු මැතිවරණය පැවැත්තුවලු. මා අහන්ට කැමතියි මොන හේතු උඩද බලංගොඩ අතුරු මැතිවරණයක් පවත්වන්ට සිද්ධ වුණේ කියා. බොහොම සාධාරණ ලෙස, ලස්සණට—[බාධාකිරීමක්]

**ස්ටැන්ලි තිලකරත්න මයා.**

*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*

(Mr. Stanley Tillekeratne)

1936දී, ඇදිගම කීර්තිරත්නට ඡන්දය දෙන්ට ආව ගැණුන්ගෙ හැට්ට ඉරා දැම්ම එක අමතකද? [බාධාකිරීම්]

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்லி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

මමයි, කථා කරන්නෙ. මට කථා කරන්ට ඉඩ දෙන්ට. තමුසෙ කථා කරල ඉවරයි.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Order, please! I want to address hon. Members. Will the Hon. Prime Minister please sit down?

**ස්ටැන්ලි තිලකරත්න මයා.**

*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*

(Mr Stanley Tillekeratne)

I am sorry.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I have to call hon. Members to Order.—[*Interruption*]. If hon. Members do not listen without interruption I may have to send some of them, from both sides of the House, out of the Chamber. Debates must be conducted with dignity. Hon. Members are the representatives of the people and should listen to the particular Member holding the Floor at a given time.

They know the Standing Orders. When a Member is on his feet and in Order no other Member should interrupt him. If any Member is grossly disorderly I shall order such Member to withdraw immediately from the House. I am not exercising that right because I am patient, but they must not interpret that for weakness. I can take steps to send any hon. Member out of the House, if his conduct warrants such a step. Hon. Members must set standards here for the country to follow.

Therefore, please keep Order in the House; otherwise I shall have to be very strict.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ගරු කථානායකතුමනි, මේ අයුතු බල පෑම් ගැන අපට චෝදනා කරන අයට අමතක වෙලා තිබෙනවා, මොන හේතුවක් උඩද බලංගොඩ අතුරු මැතිවරණයක් ඇති වුණේ කියන කාරණය. අයුතු බල පෑම් අනන්තවත් සිදු වුණු නිසා ඒ ආසනය හිස් වුණු බව මා මතක් කරන්ට කැමතියි.

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.**
(අත්තනගල්ල)
*(திருமதி சிறிமாவோ ஆர் . டீ . பண்டாரநாயக்க—அத்தனகல்ல)*
(Mrs. Sirimavo Bandaranaike)
ස්කන්ධරාජා—

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
දඹදෙනියෙ මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) මෙතැන හිටිය නම් සාක්ෂි දරයි. එතුමාගෙ මල්ලිට—මගේ ඥාති සහෝදරයෙකුට—බලංගොඩදි පිහියෙන් ඇන්න.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
එයානෙ, ඉස්සරවෙලා ගැහැව්වෙ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
එයා ගැහැව්ව? එයා ගැහැව්ව? [බාධා කිරීමක්]

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
එයාට හොඳයි, ගහන්ට.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඒ විත්තිකාරයින් නඩුවෙන් වැරදිකාරයින් වුණා.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
ඔව්, ඒක හරි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඔව්. ඒව අයුතු බලපෑම් නොවෙයි. ඒව තමයි, ලස්සණට, සාධාරණ ලෙස, යුක්ති සහගතව පැවැත්වුන මැතිවරණ! [බාධා කිරීමක්] මොනව දොඩවනවදැයි මා දන්නෙ නැහැ.

කථානායකතුමනි, එපමණක් නොවෙයි. මම දන්නව මගේ කොට්ඨාශයේ පසුගිය මහා මැතිවරණය පැවැත්වූ ආකාරය. මම හොඳින් දන්නව. [බාධාකිරීම්] අපොයි ඔව්! වරකාපොල පොලීසියේ පොලිස්කාරයන් කී වතාවක් මාරු කළාද කියා මම දන්නව. [බාධා කිරීම්.]

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)
අපොයි ඔව්!

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
මොකද අපොයි ඔව් කියන්නෙ? [බාධා කිරීම්] මේ ගොල්ල දැන් බොහොම පිරිසිදුයි. මම බලන්ගොඩ හිටිය. මම දන්නෙ නැහැ, අනිත් තැන්වල කටයුතු කරපු හැටි. ඡන්දය විමසන දිනයෙදි මම බලන්ගොඩ හිටිය. කිසි කලබලයක් නැතිව, ඉතාම සාමකාමීව, සාධාරණ ලෙස ඒ අතුරු මැතිවරණය පැවැත්වූ බව මම ආඩම්බරයෙන් කියන්ට කැමතියි. [බාධා කිරීම්]

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)
ලෙඩා මළත් බඩ සුද්ධවුණා! [බාධා කිරීම්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
තමුන්නාන්සෙගෙ බඩ තියෙන තැන මම දන්නව. දැන් පුදුම විදියට මේ අය අයුතු බලපෑම් ගැන කථා කරනව.

නියතපාල ගැන කිව්ව. හිටපු අගමැතිණියට මතක නැද්ද, රත්න දේශප්‍රිය නටපු නැටුම්? එයා ස.තො.ස. සභාපති වශයෙන් ඉන්න කාලෙ නටපු නැටුම් මතක නැද්ද? දැන් රක්ෂා දීම ගැන කථා කරනව. [බාධා කිරීම්] සී. ඩබ්ලියු. ඊ. එකේ රක්ෂා දීපු හැටි ගැන දැන් සාක්ෂි ඕනෑ හැටියට තිබෙනව. 700 කට විතර රක්ෂා දීපු හැටි දන්නව. හේවාහැට ආසනයෙ ගණනාවකට ස. තො. සෙ. රක්ෂා දුන් ආකාරය දන්නව. දැන් තමන් පිරිසිදුවෙලා කථා කරනව. [බාධා කිරීම්.] දැන් මේ "උපාසකයො" රහත් වෙන්ට ලෑස්තියි. [බාධා කිරීම්] මොනවද, මේ කථා කරන්නෙ? අපේ මහජනයා ඕව ගැන දන්නව. ඔය ගොල්ල නටපු නැටුම් ඔක්කොම අපේ මහ ජනයා දන්නව. [බාධා කිරීම්] ඉක්මණ ටම ඒව ඔක්කොම අමතක වෙලා; නේද? [බාධා කිරීම්]

**ජෝර්ජ් රාජපක්ෂ මයා.** (මුල්කිරිගල)
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ—முல்கிரிகல)*
(Mr. George Rajapaksa—Mulkirigala)
බෙන්තර-ඇල්පිටියෙ 500 කට රක්ෂා දෙන්ට පොරොන්දුවුණා නේද කියලයි, අහන්නෙ. [බාධා කිරීම්]

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
මම දන්නෙ නැහැ, ඒ ගැන. කවුද, පොරොන්දු වුණේ?

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කිව්ව, ඡන්ද පොළ කිට්ටුව ඡන්දදායකයන්ට කථා කළාය කියල. ඒක නීති විරෝධියි. ඒ බව මම දන්නව. ඒකට විරුද්ධව පැමිණිල්ලක්—[බාධා කිරීම්]. මම බලන් ගොඩට යනකොට එක ස්ථානයකින් පැමිණිල්ලක් ලැබුණ, අනිත් පැත්තෙ උදවිය ඔක කරනවය කියල. [බාධා කිරීම්]

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)
ඇයි, තමුන්නාන්සෙ ගියේ? [බාධා කිරීම්]

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
මට යන්ට බැරි ඇයි? [බාධා කිරීම්] කෝට්ටේ ගරු මන්ත්‍රීවරයා ගියත් පෙනෙන්නෙ නැහැ. [බාධා කිරීම්] මම පෙනෙන්ට ගියා නොවෙයි. මේ පුද්ගලයා ගියත් පෙනෙන්නෙ නැහැ. මට කලින් කිව්ව විදියෙ පැමිණිලි කළා. මම කිව්ව, එහෙම එකක් නම් ගිහින් පොලීසියට කියන්න කියල.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
I complained to the police.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඒක මම දන්නව. ඔය ගොල්ල අයුතු බලපෑම් ගැන කථා කරන්ට එන්න එපා. අපි කියන්නෙ නැහැ, ඒ උදවිය අයුතු බලපෑම්වලින් දිනාගත්තය කියා. අපි එහෙම කියන්නෙ නැහැ. අපි ඉතාමත් සාධාරණ ලෙස මේ අතුරු මැතිවරණ තුන පැවැත්වූ බව මේ අවස්ථාවෙදී ඉතාමත් සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්ට කැමතියි.

අ. භා. 3.53

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)
I must say I do not blame the Hon. Prime Minister for being upset. Undoubtedly, there was a very big upset in his apple-cart on 24th October, and apparently the Government is still trying to find out what went wrong.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. බී. රණතුංග මයා. (කොත්මලේ)**
*(திரு. டீ. பி. ரணதுங்க—கொத்மலே)*
(Mr. D. B. Ranatunga—Kotmale)

You are sadly mistaken.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

I would advise my hon. Friend to consider the criticism in his own Government group. Some people want a reshuffling ; some people want other people's heads. What we want is not a reshuffle. We want a dismissal of the whole Government. It is useless reshuffling a pack if you have only got jokers and no aces in it.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

You forget your jokers.—[*Interruption*].

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

It is the same trouble. Unfortunately, this Government follows one or two things for which the previous Government was open to criticism. All good things the previous Government did they repudiate.

My hon. Friend was talking about people being promised jobs, that the S. L. F. P. in their days promised jobs.

**වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන් (නල්ලූර්)**
*(டொக்டர் ஈ. எம். வி. நாகநாதன்—நல்லூர்)*
(Dr. E. M. V. Naganathan—Nallur)

And gave jobs !

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

I do not know whether they did it or not. Now the hon. Member for Nallur (Dr. Naganathan) says they promised jobs and gave jobs. The U. N. P. promises jobs and does not give jobs.

I would not normally have intervened in this matter if not for the fact that the Hon. Prime Minister referred to certain matters within my personal knowledge.

For instance, he spoke about the situation in the Balangoda electorate in the last by-election. I was also working there. In fact, the Hon. Prime Minister and I were both working from the same headquarters, the Belihul-oya Resthouse.

The Hon. Prime Minister just told us that it is very difficult for him, when he goes about in a constituency, to have a board saying either that he is the Prime Minister or that he is Mr. Dudley Senanayake, the leader of the U. N. P. It is the same dfficulty that we have. He issues press statements as Prime Minister, denying that he has an agreement with the Federal Party.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

If the hon. Member would give way, I did not issue a press statement denying any agreement.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Why not ?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Let me explain. Please listen to me because you are accusing me of lying.

I issued a statement in Sinhala to the press in which I said that I have not entered into any agreement to divide the country, and I am not responsible for the press translator dropping the words " divide the country " in the English version and putting a headline. Please look at the original in Sinhala.—[*Interruption*].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

It appeared on the 18th.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

We have a new Ministry of Information and a new Permanent Secretary. Through the radio, even in regard to very slight matters like the distribution of dried chillies, false statements in newspapers are immediately corrected. Here is a statement by the Prime Minister of the country. He had been misrepresented by the very press that supports him. Unfortunately, this statement was not issued to us either in Sinhala, Tamil or English. So, we went by what appeared in the newspapers.

The Hon. Prime Minister now admits that he had an agreement with the Federal Party, and that only confirms what we have said all along and what the people themselves believed and expressed on October 24th. Anyway, I hope that in Dodangaslanda this problem will not arise. It is now accepted that Mr. Dudley Senanayake, whether as President of the United National Party or as Prime Minister of this country, or both, has an agreement with the Federal Party. As least that matter is now cleared up.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Member is coming to a new point, I believe. Will hon. leaders of parties please come to my room? The Sitting is suspended for half an hour.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.**

*இதன்படி அமர்வு பி.ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 4.30* P.M., *and then resumed.*

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Mr. Speaker, when we adjourned for tea, I was dealing with the question of how difficult it is to distinguish between the various aspects of the Hon. Prime Minister's split public personality. He himself referred to the fact that he cannot go about the country in reversible roles indicating in what capacity he may be acting at any particular moment. But from his own explanation of his conduct during the Balangoda by-election, it is quite clear that the Hon. Prime Minister was acting in two capacities at the same time.

As leader of the United National Party, he was going from polling booth to polling booth—in fact he admitted he went to every polling booth that could be reached by vehicle. As a matter of fact, he went to some of them more than once, but that did not seem to impress the voters at all.

Then he went on to describe the incident in which he went to the Balangoda Police Station. When he went to the Balangoda Police Station he apparently acted in both capacities. As he was the Prime Minister, that is to say, the Minister in charge of the police, it was not necessary for him to go to the police station at all. He was accompanied by S.Ps., security officers and various other police personnel. As Minister in charge of the police and Prime Minister of the country he could have issued any order. He was travelling in his private car on that day. I saw him on several days but on the day of the election he was travelling in his private car. On the other days he was travelling in his official car.

He went to the Balangoda Police Station, I presume, as leader of the United National Party. Then, according to his own statement—you will remember, Sir, I interrupted him and asked him for clarification—he proceeded to instruct the police officers who were accompanying him that

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

they should go and inform the Balangoda Police that the Prime Minister anticipated a breach of the peace at some polling station and it was necessary to send reinforcements.

Now, Sir, it is very difficult, as I said, to try to split hairs. I remember the Hon. Prime Minister was at the Belihul-oya Resthouse. So was I. The Belihul-oya Resthouse was like an armed camp, there were so many security police. In fact my poor driver who came to give me a torch in the night was taken into custody by the security police because they suspected that he was an unauthorized person there to assassinate either the Hon. Prime Minister or the leader of the United National Party, Mr. Dudley Senanayake. I do not know in what capacity he was going to be assassinated! All I know is, this split personality was sleeping in a room near mine.—[*Interruption*]. Eventually we had to come and establish his identity and get him released.

I want to contest very strongly the Hon. Prime Minister's statement that everything was lovely, peaceful, legal and orderly at Balangoda. On the contrary, because of the presence of the Prime Minister and the leader of the United National Party in one person acting in two capacities, I would like to say, the police at Balangoda acted in a thoroughly partial manner. And I am making that statement responsibly.

The hon. Member for Yatiyantota referred to the fact that about sixty-four persons working for Mrs. Ratwatte, the S.L.F.P. candidate, were taken to the Balangoda Police Station. The police in Balangoda appeared to be working on the following premise: that if any complaint, however frivolous, was made against a person suspected of working for Mrs. Ratwatte that person should be put into a police vehicle, taken to the Balangoda Police Station, and kept there until 5 o'clock. Of these sixty-four people, a large number of persons have not even been charged. Some of them were taken very early in the morning, merely kept at the police station and told to go away after the polling was over. Was that or was that not an attempt to use police power to prevent persons working for the S.L.F.P. candidate?

I am sorry the Parliamentary Secretary to the Minister of Nationalized Services is not here. Incidentally, he owes me a bet that he lost on the elections. He has to pay me that bet. There are so many promises that are broken from the other side that I am not complaining. But he knows this: I should like to tell you that on the night before the election, at Belihul-oya, two young men who were working for Mrs. Ratwatte were taken to the Balangoda Police Station and locked up in the station. I went there quite late at night to try and find out what was the charge against these persons. Eventually, after great difficulty I located a police officer who told me what the alleged charge was: they were supposed to have spoken in a rough manner to a supporter of the United National Party. I managed to get hold of the A.S.P. of the area. He went into the matter and he enlarged these two young men on bail. But they had been several hours in the police station without any person being prepared to look into the matter.

I want to say that during the course of that action one of the most prominent supporters of the United National Party in Behihul-oya tried to threaten me personally. I made a statement to the police about this, and I was supported by an advocate of the Supreme Court who was with me, and by two other persons. I also spoke of how I saw him threaten people near the police station.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

Was he arrested?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

As far as I know he has not been arrested. I waited to see whether the police would even ask him any questions. I gave my statement to the police round about 12.30 or 1. I saw this man marching up and down in front of the police station and going into the Belihul-oya Resthouse in front of the very officers to whom I had made the complaint. Nothing was done.

I saw him organizing the hooting of the supporters of the S. L. F. P. at the Belihul-oya bazaar, and at 5 o'clock in the evening I saw him with the hon. Parliamentary Secretary to the Minister of Nationalized Services (Mr. Welagedera) at the Belihul-oya Resthouse in the presence of the police.

As a Member of Parliament I made a complaint, and it is for the police to investigate complaints, but as far as I know that complaint was never investigated. But the most frivolous complaints resulted in persons working for the S. L. F. P. candidate being taken into custody and being kept in a police station several miles away from the places where they were working till the voting was over.

I make the charge against the Prime Minister that his special interest in Balangoda was one of the main reasons why the police acted in the thoroughly high-handed way in which they did.

I had not intended to get involved in this post-mortem on the elections. We have had statements on the matter both from the Prime Minister and from the Leader of the Opposition.

The Prime Minister made a statement which only showed that he did not know the wisdom of the old saying that silence is golden. He certainly opened his mouth only to put his foot into it.

The Leader of the Opposition showed by her statement not only that the Prime Minister was not prepared to accept the verdict of the people but also that his mathematics is undoubtedly very weak. I think that statement disposed of that question.

But the Prime Minister was spluttering and threatening and was extremely upset; he was not himself; he was not what he used to be; and I hope that now, before the Dodangaslanda by-election, he will have a little peace of mind, because obviously he is not going to have peace of mind after the Dodangaslanda by-election.

But basically what I want to stress is the importance of the amendment suggested by the hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike). The Prime Minister has accepted it, but whether the Government also accepts it, I do not know, because there have been occasions previously when the Prime Minister agreed to something and the Government thought differently. It was only recently that the Prime Minister agreed to debate a "No Confidence" Motion but when the day arrived we were not allowed to do so.

Be that as it may, I want to say this. I was a Member of both Select Committees that revised the election law. By and large all those revisions have proved in practice to be very salutary and have assisted the process of democracy in this country.

However, we are up against one important question which is beyond the capacity of a Select Committee or of this House to influence. We set up a Select Committee to make recommendations in regard to the desirable changes in election law and practice. This House can in fact change election law and it has done so.

But practice is always in the hands of the Government, and that is why many of the changes that this House considers necessary become null and void when they are put into practice.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

One such matter was referred to here. The last Select Committee amended the law to state that no election poster or any printed matter in relation to an election should be displayed in any place to which the public have a right of access. We passed that law. Who is going to enforce that law? It must be enforced by the police.

But I want to say that in these by-elections, particularly at Bentara-Elpitiya, that law was not enforced, and the police took no notice whatsoever of the open breach of that law.—[*Interruption*]. My hon. Friend says that the police must have pasted them. I did not see that myself but I personally saw several boutiques which are places to which the public have the right of access where only posters in favour of the United National Party candidate were prominently and rather permanently displayed. I even mentioned it to a police officer and asked him what he has to do. He said, they have no instructions on that matter. Now, which is to prevail—the law passed by this House or the instructions given to the police? In Bandarawela too the same offence was committed and posters were displayed on letter boxes, at public places and on C. T. B. buses. The C. T. B. does not give us the right to carry "Aththa" and "Jana Dina." Today they have taken upon themselves the right to search passengers' baggage to find out if they are carrying this contraband, "Aththa" and "Jana Dina"! But the C. T. B. did not take any steps to remove election posters of the U. N. P. which were displayed not only in certain depots but even on its vehicles. So, what we have to do is not only to revise the law, but change the Government. If we want pure elections we have to change the Government, and the voters at the three by-elections have shown that they realize that.

Then, take another question—the use of transport. We have banned the transport of voters to and from the polls during the pendency of an election, that is, on election day. Who will prevent this? Who takes any action about it? I have had, several times, entries made to policemen in regard to certain vehicles which I not only suspected but which I knew were transporting voters either to or from the polls. Sometimes, the police refused to take down entries. The policeman I complained to did take down the entries, but I have not known one case where the police have followed it up. What is the use of passing a law if it is deliberately being flouted?

The purpose of the law was to prevent those with money getting undue advantage in the elections. Those with money rule the country: they rule the police and they undermine the laws passed by this House. So, you see, it is not only a question of amending the law but the question of changing the Government and of being able to ensure decent, honourable and equal treatment to all parties in an election. And that is being more and more disregarded by the Government or, rather, by a section of it, because though they are supposed to be a U. N. P.-Federal Party Government, we did not see the Federal Party at the elections. Whenever the Government is in a jam in this House, the President of the Federal Party, the hon. Member for Nallur (Dr. E. M. V. Naganathan), is the first to rise in its defence. But we did not have the privilege of hearing the hon. Member for Nallur explain to the voters the enormous benefits brought upon them in these "fortunate 18 months"—මේ වාසනාවන්ත දහඅට මාසයේදී—in which we have had this U. N. P.-Federal Party Government.

Now, the law obviously needs a lot of amendments and a lot of clarification. I like to make some comments on some of the decided election petitions without mentioning any single one of them, on matters which are of a general nature and affect the law—not on the individual decisions even though they are final.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

Unfortunately, the law which was recommended by the Select Committee and adopted by this House is now being interpreted in different ways by different election judges. It has become necessary for the new Committee to bring its mind to bear on the thoroughly confusing situation that has been created by different election judges holding in different ways in different election petitions.

Take the question of general intimidation, or bribery. In certain cases it has been held by judges—and, in my opinion, correctly—that in order to establish general intimidation one has got to prove not one or other incident that may or may not have taken place, but that the intimidation was of such a nature that it would have or could have affected the outcome of the election. Obviously, that must be the intention. Even at the best conducted elections there is always some incident. The voters get so enthusiastic or antagonistic that they come to blows or abuse each other. We have had at least one case decided recently, and I want to mention it by name. I think everybody in the House knows the case in which, on one incident of intimidation, the learned election judge held that intimidation had taken place, and, therefore, that was the ground for holding the election void. Whether the purpose of the intimidation was to influence the voter to vote or to refrain from voting was not taken into consideration. Whether the offence was of such a nature that the outcome of the election became spurious was not taken into consideration. Whether the person who was assaulted was in fact a voter or not was not taken into consideration. I am not here arguing the rights or wrongs of a particular case, but I say that it is necessary for the Committee to be very careful to see that it is clear and precise about what it means. It should not leave the questions of interpretation of the election laws to the whims and fancies of individual judges. The will of the elected representatives of this country should be clearly and precisely stated on all these matters.

We brought these laws making it an election offence for a person to utter a false statement about the character or conduct of a candidate. I think that matter should be gone into a little further. It should be obvious that the false statement must be of such a nature that it has an influence on the election. It is possible to make a false statement about a person which has no influence on the election. For instance, if I came and spoke at an election and said that you are 16 years old or 21 years old. that undoubtedly would be a false statement.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I do not think that the people will believe it.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

A large number of people may well believe it ; you look so young. But even though it is a credible statement, it is still false. I just gave you that as an extreme example. We must tighten up that law regarding false statements.

Then I come to the question of agency. Where does agency start and where does it end ? There must be some definition of agency. Some judges have held that agency is a matter of direct agency. Some judges seem to think that agency can continue all along the line and you can have sub-agents and various other agents. I do not want to comment on any matter under appeal, but only on the general question of agency.

These are matters to which quite frankly the previous Select Committees did not address their minds. To put the matter in the kindest

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

form, we thought election judges would function efficiently. Now, in the light of experience, it would be better without the interpretation of any judges; better that what is judicial should not be left to the whims and fancies of a particular election judge, but should be made clear by the Select Committee which makes the recommendations.

Reference has already been made to the question of election expenses. In fact, there is a decision now that expenditure by a political party on behalf of a candidate need not be declared or taken into account in the statement of election expenditure that has to be furnished under the election law. I must say, as a Member of the Select Committee that drew up that law—as a matter of fact, I think this restriction to Rs. 5,000 was moved by the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) and seconded by me; we were the two people who brought it up in that Committee—that none of us had any idea that expenditure by political parties on candidates should not be included in the statment of election expenditure. In that case, why should expenditure by any other person on behalf of a candidate be included? All that the candidate has got to do is, not to spend anything on his own behalf but get his party and his friends to spend millions. Of course, if they are members of the U. N. P. that can be done. So, the very intention of the House and our last Select Committee has been, shall I say, misrepresented or misinterpreted by the learned election judges.

All these matters only go to show that the amendment of the hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike) is a salutary one. I think that the Select Committee should bring its mind to bear on the desirability of recommending an election commission, consisting of Members of the Government and of the Opposition, which will be responsible for issuing administrative instructions in regard to the interpretation and enforcement of election laws.

I was not present, but I read in the newspapers that the Hon. Minister of State had told the electors in more than one place that it was advisable for them to vote for the Government candidate because they were going to be the Government for three and a half years. The obvious inference is that if they did not vote for the Government candidate they would not receive any benefits. [*Interruption*]. What other inference can you draw?

Anyway, the voters were educated enough to know that what this Government has already done to them for eighteen months is enough, and they did not want any further benefits for the next three and a half years! And that is why the candidates of the Hon. Minister's party were not elected.—[*Interruption*]. They have a right to listen to the Ministers. They can reshuffle Ministers as long as they are in power, but certainly they have no right to threaten the voters or offer them inducements in this way. I want to say that this alone shows that we cannot be satisfied that the law adopted by this House will be impartially enforced when it is in the hands of one man.

The Hon. Minister of State is a great man for developing theories out of the exigencies of the moment. We remember his developing a theory of a nine-year cycle of Government. It has been disproved as far as this Government is concerned. He also, during the election, developed the theory that governments always win by-elections. The fact that a Government has advantages in a by-election is true, but this Government did not win any one of the seats at the by-elections in spite of the advantages it had. I must say that we had to fight not only the U.N.P. but also the big power of capital and the entire resources of the State which were thrown into the by-elections. And that was quite a fight. I have fought a lot of elections in my time but this was one of the elections where you had to fight, particularly in Balangoda, against the total resources of the State. In fact,



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

I would like to say that, according to my judgment, the real U.N.P. candidate at Balangoda was the Prime Minister of this country and not Mr. Aboosally. He was really the candidate. I think the U.N.P. might have done a bit better if they had put forward Mr. Aboosally rather than the Prime Minister. They put forward the Prime Minister and wanted to know the result.

Be that as it may, I want to make a suggestion that the Select Committee do consider this matter of the enforcement and administration of the law. We have got an Elections Department with a Commissioner of Elections. On a recommendation of the previous Select Committee, we made the commissioner an independent person with constitutional guarantees of his independence and put him on a par with the Auditor-General. But the Commissioner of Elections looks after only one aspect of elections, that is the arrangements which are necessary for polling booths and for the casting and counting of votes. But as for other aspects of the law that this House and this country have accepted there is nobody in charge. I think there must be some type of bi-partisan control over these matters to see that the voters, without any form of undue influence, are able to make a choice as to which person and which party they consider more suitable to represent them in this distinguished House.

Those are all the observations I want to make on this matter. It is really not a case now of changing the law. In fact, I think the basic necessary amendments have been made by the two previous Select Committees. There are, of course, much more fundamental questions that have to be considered. Last time the question of proportional representation was raised and various other suggestions were made. The Hon. Minister of Home Affairs proposed last time that we should have compulsory voting. Even with compulsory voting it would be much difficult for him next time. Important matters of this sort might be considered, but basically as far as the conducting of elections are concerned we have already taken important decisions. Now what is needed is to have impartiality in the enforcement of the law. That is the matter on which we are not satisfied.

I read in the " Siyarata " paper that the U. N. P. is contemplating bringing election petitions against those elected at the three by-elections. I do not know whether this is so or not. I do not know whether it is essential or not. All I am trying to say is that in one way I am sorry that they lost the elections. If you win the elections you cannot bring election petitions ; otherwise there are many incidents which we could very easily have taken to a court of law and established. We are denied that because the voters decided to elect the S. L. F. P. candidates and thereafter it is impossible for us to bring election petitions even though so many election offences were committed against us.

අ. භා. 5.4

**ඩී. පී. ආර්. වීරසේකර මයා.** (දෙහිඕවිට)

*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெகியோவிற்ற)*

(Mr. D. P. R. Weerasekera—Dehiowita)

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා මේ අවස්ථාවේදී මෙහි නොසිටීම ගැන කණගාටුයි. 1960 සිටම ගරු අගමැතිතුමාගේ කථා මා අසා තිබෙනවා. එතුමා අද කළ කථාව ගැන මා නම් පුදුම වන්නේ නැහැ. ක්‍රම ක්‍රමයෙන් පහර වදින විට එතුමා කියන්නේ මොනවාද කියා එතුමාවත් දන්නවාද කියා මා දන්නෙ නැහැ. එතුමා අද කථා කරද්දී මේ පැත්තෙන් පිකක් කලබල සහිත තත්ත්වයක් ඇති වුණා. ඒ ගැන එතුමාටත් දෙස් කියන්න ඕනැ. එතුමා පිකක් තැන්පත්ව තර්කානුකූලව කථා කළා නම් එවැනි තත්වයකට මුහුණ දෙන්නට සිදු වන්නෙ නැහැ. ඒ තත්ත්වය එතුමා තුළ ඉස්සර සිටම පවතින්නක් බව ඉතිහාසය දෙස බැලුවත් පෙනෙනවා. ඒ තත්ත්වය ඇති වී තිබෙන්නෙ මොන හේතුවක් නිසාද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියල නම් මා දන්නෙ නැහැ. ඒ නිසා මේ ගරු සභාවේ ගෞරවය රැක ගැනීමට අප පමණක් කල්පනා කළාට මදි. විශේෂයෙන්ම නායකයා ටිකක් තැන්පත්ව තර්කානුකූලව කථා කරනවා නම් එවැනි තත්ත්වයක් ඇති වන්නේ නැහැ.

ගරු අගමැතිතුමාගේ ගණිත් ශාස්ත්‍රය අදත් ටිකක් වෙනස් වුණා. බලංගොඩ කොට්ඨාශයේ පසුගිය මහ මැතිවරණය සමයේදී මැරවරකම් ඇති වූ නිසා යළිත් වරක් අතුරු මැතිවරණයකට මුහුණ දෙන්න සිදු වුණා යයි එතුමා කිව්ව. එමෙන්ම බෙන්තර—ඇල්පිටිය ඡන්ද කොට්ඨාශයේත් එවැනි තත්ත්වයක් ඇති වූ නිසයි, එහිත් අතුරු මැතිවරණයක් ඇති වුණේ. පසුගිය මහා මැතිවරණයට කලින් ඒ ආසනය නියෝජනය කළ මන්ත්‍රීතුමා නැවත වරක් මෙහි පැමිණ සිටින්නේ ඒ නිසයි. එහෙත්, ගරු අගමැතිතුමා මතක් කළේ බලංගොඩ පමණයි. එමෙන්ම අධිකරණය කෙරෙහි මගේ විශ්වාසයක් නැත කියන එක මා එදත් කිව්ව ; අදත් කියනව. එසේ කියන්නට මා ලජ්ජා වන්නේ නැහැ. නීති විරෝධි ක්‍රියා කළ නිසාය බලංගොඩ ආසනය අහිමි වුණේ කියා අගමැතිතුමා කිව්ව. එමෙන්ම, බෙන්තර—ඇල්පිටිය ආසනය එක්සත් ජාතික පක්ෂයට අහිමි වුණේ එම පක්ෂයේ මැරවරකම් නිසාය කියා මා කියන්න ඕනැ.

එපමණක් නොවෙයි, තවත් ප්‍රශ්නයක් තිබෙනව. රක්ෂා ප්‍රශ්නය ගැනත් එතුමා මතක් කළා. අපේ කාලයේදී අපි ඕනැ තරම් රක්ෂා දී තිබෙනව. එහෙත්, පට්ට පල් හොරුන් හැටියට ඔප්පු වූ අයට අපි රක්ෂාව දුන්නේ නැත කියා එදත් කිව්ව ; අදත් කියනව. පාත්තර හොරාට රක්ෂාව දී ඔහු ආරක්ෂා කළා පමණක් නොවෙයි ; එය මේ ගරු සභාවේදී පෙන්වා දුන්නාට පසුව ඔහු තත්ත්වයෙනුත් උසස් කර තිබෙනව. ඒ ඩබ්ලිව්. ඒ. අබේගුණසේකර උන්නැහේ පාත්තර හොරෙක් පමණක් නොවෙයි, කපුරු බෝල හොරෙක් හා දත් බුරුසු හොරෙක් බවටත් මේ ගරු සභාවේදී ඔප්පු වුණාට පසුවත් තවමත් රක්ෂාවේ තබා ගෙන සිටිනව. එවැනි තත්ත්වයක් තබාගෙන අපේ කාලයේදී රක්ෂා දුන්නාය කිව්වා. මගේ ප්‍රධාන චෝදනාව මෙයයි නඩු පොත් වැහුවේ නැත්නම්, ඒ හා සම්බන්ධ ඇඟිලි සලකුණු වැහුවෙ නැත්නම්, ඔහුට විරුද්ධව නඩු පවරා නැත්තේ ඇයි? හැබැයි, එය කරන්නෙ නම් නැහැ. ඇයි? ඔහුට නඩු දැම්මොත් ඔහුත් අසු වෙනව ; ඔහුව ආරක්ෂා කළ අයත් අසු වෙනව ; ඒ පිළිබඳව සාක්ෂි දුන් අයත් අසු වෙනව.

ගරු කථානායකතුමනි, මැතිවරණ කොමසාරිස්තුමාට මා එදත් ප්‍රශංසා කළා ; අදත් ප්‍රශංසා කරනව. මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් වරදක් සිදු වී නැහැ. පවතින නීතිය අනුව ඒ දෙපාර්තමේන්තුව නියම විධියට කටයුතු කර තිබෙනව. නීතිය කොතෙක් සංශෝධනය කළත් පැනනඟින ප්‍රශ්නය මේකයි : ප්‍රශ්න මතු වන්නේ ඒ නීතිය ක්‍රියාත්මක වන ආකාරය ගැනයි. අගමැතිතුමා කොතරම් බෙරිහන් දුන්නත් නීතිය ක්‍රියාත්මක කිරීමේදී පොලිසිය අපක්ෂපාතව කටයුතු නොකරනවා නම්, මේ රටේ කවදාවත් සාධාරණ මැතිවරණයක් පවත්වන්නට බැහැ. අපක්ෂපාතව කටයුතු කළ පොලිස් නිලධාරීන් පක්ෂපාතව කටයුතු කරන්නට පටන් ගත්තේ අගමැතිතුමා පොලිසියට ගියාට පසුවයි. පසුගිය ඔක්තෝබර් මාසයේ 7 වැනිදායින් පසුව මා බලංගොඩ කොට්ඨාශයෙහි වැඩ කළා. මා දවසකට වරක් පොලීසියට ගොස් තොරතුරු විමසා බැලුවා. නෙවිල් ප්‍රනාන්දු නමැති පොලිස් නිලධාරි මහතා ඉතා හොඳින් තම සේවය කළ බව මතක් කරන්නට කැමතියි. මේ ආණ්ඩුව ඇඟිලි ගසන තුරු ඔහු අපක්ෂපාතව වැඩ කළා. මා මෙසේ කීම නිසා ඔහු වෙන තැනකට මාරු කරනු ලබද්දැයි මට කියන්නට බැහැ. මේ කාරණය කී පලියට ඔහු මාරු කරනු ලබන්නට එපා. ආරියසිංහ නමැති ඒ. එස්. පී. මහත්මයා ගැනත් වරදක් කියන්නට නැහැ.

මා දවසකට වරක් පොලීසියට ගොස් සාකච්ඡා කළා. යම් ප්‍රශ්නයක් ඇත්නම් දන්වන ලෙස සඳහන් කළා. අපේ ආධාරකරුවන් සාමයෙන් සිටින බවටත් කලබල ඇති නොකරන බවටත් මා පොරොන්දු වුණා. ඒ පොරොන්දුව උඩ අප ඉතා හොඳින් අපේ වැඩ කරගෙන ගියා. බලංගොඩ මැතිවරණය බොහොම සාමකාමී අන්දමට පැවැත්වෙන බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසේකර මයා.]

ධනපති පත්‍ර විසින්ද කියන්නට යෙදුණා. එයින් පෙනෙන්නේ අප අතින් වරදක් නොවුණු බවයි. අපෙන් සුළු හෝ වරදක් සිදු වුණා නම් ඒ ගැන බොහොම ලොකු වට රටට ප්‍රකාශ කරනවාට සැකයක් නැහැ. "රතු මැරවරයන් ඇවිත් බෝම්බ ගැසුවා, කෝලාහල කළා" ආදී වශයෙන් සඳහන් කරමින් අපෙන් සුළු වරදක් හෝ සිදු වුණා නම් එය බොහොම ලොකු වට හුවා දක්වනවාට සැකයක් නැහැ. අපෙන් වරදක් සිදු නොවුණු නිසා බලන් ගොඩ මැතිවරණය සාමකාමී අන්දමට පැවැත්වුණු බව ධනපති පත්‍රවලින්ද ප්‍රකාශ වුණා. අප අපේ සටන සාමකාමී අන්දමින් ගෙන ගිය බව අගමැතිතුමාගේ කථාවෙන්ද පැහැදිලි වුණා. එහෙත් එතුමා ගේ කථාවෙන් කියැවුණු යම් යම් කාරණා ගැන මා පුදුම වෙනවා. මැතිවරණ සටන් කීපයකට මුහුණ පෑම නිසාද මැතිවරණ කීපයකදී වැඩ කිරීම නිසාද මට සැහෙන අත්දැකීමක් තිබෙනවා. පසුගියදා බලන් ගොඩ පැවති අතුරු මැතිවරණයේදී තරම් නීච නින්දිත අන්දමට අනික් මැතිවරණ වලදී කටයුතු නොසිදු වුණු බව ඒ අත් දැකීම අනුව මට කියන්නට පුළුවනි. ඒ තරම් නින්දිත මැතිවරණයක් තවත් නැහැ. පළමුවැනි වරට ඡන්ද නියෝජිත මහතුන්ට තළා ගස්වල බැඳ ඡන්ද ලැයිස්තු හා සීල් හොරකම් කළ මැතිවර ණයකුයි පසුගියදා බලංගොඩ පැවැත් වුණේ. අපේ අගමැතිතුමා මේ කාරණා නොදන්නවා විය හැකියි. අපේ ඡන්ද නියෝජිතයන්ට හිරිහැර කිරීමට අදහ සක් තිබෙන බව මැතිවරණයට දින කීපය කට පෙර අපට දැන ගන්නට ලැබුණු නිසා අප කල් ඇතිව අපේ නියෝජිත මහතුන් ගෙන්වා අවශ්‍ය උපදෙස් දී ආරක්ෂා සංවිධාන ඇතිව ඒ ඒ ස්ථාන කරා යන්නට කටයුතු යෙදුවා. බලංගොඩ කොට්ඨාශ යෙහි සැතපුම් තුනක් හතරක් තරම් වූ දුර ප්‍රමාණයක් පයින් ගමන් කළ යුතුව ඇති ඡන්ද පොළවලුත් තිබෙනවා. ඒ වගේම යා යුතුව ඇත්තේ කැළෑ හරහායි. පසුගිය මහා මැතිවරණයෙන් පසුව නැව තත් දාමරිකකම් ඇති වේදැයි ඒ මිනිසුන් තුළ බියක් ඇති වුණු නිසා අප සංවිධා නාත්මකව ඒ අයට ආරක්ෂාව සැලසීමට ක්‍රියා කළා. කෙසේ වෙතත් [illegible] ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේදී දාමරික ක්‍රියා සිදු වෙතැයි අප කල්පනා කෙළේ නැහැ. එසේ හෙයින් ඒ ස්ථාන වෙත යා යුතු ඡන්ද නියෝජිතයා යැව්වේ ශිෂ්‍යයන් තිදෙනකු සමඟයි. ජීප් රථයෙන් සැතපුම් තුනක් ගොස් ඒ ඡන්ද පොළ වෙත තව ටික දුරක් පයින්ද ගමන් කළ යුතුයි. අපේ ඡන්ද නියෝජිතයා ඇතුළු පිරිස ජීප් රථයෙන් ගොස් බසිනවාත් සමඟම ඔවුන්ට ගල් මුගුරුවලින් පහර දෙන්නට පටන් ගත්තා. ජීප් රථයේ රියැදුරා පණ බේරා ගෙන ආවා. අනික් අය දාමරිකකම් වලට ගොදුරු වුණා. ඡන්ද නියෝජිතයා කැළේට ගෙන ගොස් ගසක බැඳ ඔහුගේ සපත්තු දෙක හා ඔර්ලෝසුව පමණක් නොව ඡන්ද ලැයිස්තුව සහ සීල් එකද හොරකම් කරගෙන තිබෙනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

සපත්තු හොරාත් එහි ගිහින් හිටියාද?

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

ඔහු ගොස් හිටියා නම් ජීප් එකත් හොර කම් කරගෙන එනවාට සැකයක් නැහැ.

අප "කුකුළා" නමින් හඳුන්වන අබුසාලි මහතාගේ ප්‍රධාන හෙංචයියකු සිටිනව. ඒ "කුකුළාගේ" සහෝදරයකු පොලීසියේ සිටිනවා. ඔහු ඉන්ස්පැක්ටර් මහත්මයකු වශයෙන් පෙනී සිට අර සිද්ධිය වූ ස්ථාන යට ගොස් ඒ ළඟ ඇති වයසක මාතාවක ගේ ගෙදරක් කොල්ල කෑමට මේ පිරිස ගිය බවට ඒ මාතාවගෙන් ලියවිල්ලක් අර ගෙන පොලීසියට ආවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මෙම ප්‍රශ්නයට ඔය කාරණය අදාල වෙන්නෙ කොහොමද කියන එක පෙන් වන්න.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

මම පෙන්වන්නම්. කොච්චර නීති පැනෙව්වත් පොලීසිය හරියාකාර ක්‍රියා නො කරනවා නම් එම නීතිවලින් වැඩක් සිදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොවන බවයි මම කියන්නෙ. කරුණා කර තද නීති රීති සකස් කරන්න. ඕනෑම කෙනෙකු මැතිවරණ නීතිරීති කඩ කළොත් ඔහුට නිසි දඬුවම් දෙන්ට ඕනැ. එම වැරදි ක්‍රියා නැවැත්වීමට හේතු වන පරිද්දෙන් සුදුසු විධිවිධාන යෙදුවෙ නැතිනම් මෙම නීති රීතිවලින් වැඩක් වන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සෙ දන්නව නීතියෙ හැටියට කාටත් නිදහස්ව තම ඡන්දය පාවිච්චි කරන්ට පුළුවන් විය යුතු බව. ඒ නිසා තමයි හොර ඡන්ද දැමීම වැනි ක්‍රියා නැති කරන්ට ඒ ඒ ස්ථාන වලට ඡන්ද කටයුතු සඳහා නියෝජිතයන් පත් කර යවන්නෙ. ඒ අයගෙ ලියවිලි කඩා ගන්නව නම්, ඒ අයගෙ සිල් කඩා ගන්නව නම්, එවැනි ක්‍රියා නිසා ඡන්ද පොළවල ඡන්ද නියෝජිතයින් නැතිව කට යුතු කරන්ට සිදු වෙනව නම් තමන්ගෙ ඡන්දය නිදහස්ව පාවිච්චි කරන්ට කාට වත් ඉඩ ලැබෙන්නෙ නැහැ.

ඊළඟට මම කාරණයට බසින්නම්. ඊට පසුව මම පොලීසියට ගිය විට-ඒකියන්නෙ ඉන්ස්පෙක්ටර් මහතා අපක්ෂපාතීව සිටි වෙලාවෙ තවත් විධියකින් කියනව නම් අගමැතිතුමා එහි එන්න පෙර—මම පොලී සියට ගිය විට උන්නැහෙ කීවෙ කුමක්ද? "දන් පුදුම දෙයක් සිදු වෙලා තියෙනව; මේ කුකුළ ඇවිත් පැමිණිල්ලක් කර තිබෙ නව." කීව. මම ඒ මහත්මයගෙ නම හරි යට දන්නෙ නැහැ. ඒකයි කුකුළා යයි කියන්නෙ, ඔහුට කවුරුත් කියන්නෙ කුකුළාය කියායි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කුකුල් මහත්මය.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
කුකුල් මහත්මය. එයා ඇවිත් මොකද කළේ? මේගොල්ලො එම ගෙට පැන්නාය කියා එතන ලියල. ගුටි කෑ අය ආ විට ඒ ගොල්ලො හිර කර ගත්ත. ඊට පසුව අර නැලේ බැඳ දැමූ ඉලන්දාරිය බැම් ලිහාගෙන සැතපුම් 4 ක් පමණ දුර ගෙවා ලේ පෙරමින් පොලීසියට ආවට පස්සෙයි අපි කී දෙය හරි බව පිළි ගත්තෙ. නමුත් අද වන තුරු විභාග යක් නැහැ. අද වන තුරු එක්කෙනෙක් වත් සිර භාරයට ගෙන නැහැ. තවම කුකුළ එළියෙ හඬලනව. අර වයසක අම්මණ්ඩිත් ඇවිත් කෙළින්ම ප්‍රකාශ කර තිබෙන ව බලහත්කාරයෙන් බොරු ලියවිල්ලකට අත්සන් ගත්තාය කියා. පොලීසියෙන් එහාට ගිහින් ඇවිත් කියනව, මිනිස්සු සොයා ගන්ට බැරි බව. ගමේ මිනිස්සු මේ අම්මණ්ඩිත් අඳුණනව නම් [බාධාකිරීමක්]. නමුත් තවම අල්ලා නැහැ. මෙයින් මො කක්ද පෙනී යන්නෙ? මෙවැනි සිද්ධියක් වී ඇති බව පොලිස් වාර්තාවල තියෙනව. තමුන්නාන්සේලා අපක්ෂපාතීව කටයුතු කරනවාය කියා වචනයෙන් හෝ කියනව නම් කරුණාකර අදම පොලීසියට අණ දෙන්න, මේ මැරවරකම් කළ කුකුළා සහ අනිකුත් අය අල්ලා දඬුවම් දෙන්ටය කියා. වෙන කරන්ට දෙයක් නැතිනම් තමුන් නාන්සෙලගෙ නරිත්වවත් භාර දෙන්න.

මැතිවරණ කටයුතු පවත්වා ගෙන යන විට ඡන්දදායකයකුට වේවා ඡන්ද අපේක්ෂකයකුට වේවා මොනයම්ම විධියේ හෝ බලපෑමක් කරනවා නම් එය නීති විරෝධි ක්‍රියාවක් විය යුතුයි. සීතා ද සිල්වා සෙනෙවිරත්න මහත්මිය—ඇය දේශපාලනය කරන්නෙ සීතා මොලමුරේ යන නමිනුයි.—වේදිකාවේ සටන පටන් ගත්තෙ කුමන ආකාරයකටද? ක්ලිෆර්ඩ් රත්වත්තෙ මන්ත්‍රීතුමාගෙ ආසනය අහිමි කළාලු. මල්ලිකා රත්වත්තෙගෙ ආස නය අහිමි කරනව විතරක් නොවෙයි ඇයව හිරෙත් යවනවලු. ඒ විධියට කියමිනුයි ඇය මැතිවරණ කටයුතු පටන් ගත්තෙ. දැන් ගරු අගමැතිතුමාම කියනව කිසිම සිද්ධියක් වුණේ නැත කියා. මැතිවරණ කටයුතු ගෙනියන්නෙ, ආසනය අහිමි කරනවය කියන තර්ජනයත් එල්ල කරමිනුයි. හරියට අධිකරණය තමන්ගෙ සාක්කුවෙ වගෙයි කතාව. එවැනි ක්‍රියා නොසිදුවන අන්දමටයි නීතිය සකස් කරන්ට ඕනැ. නැති නම් අපක්ෂපාතව ඡන්ද ව්‍යාපාර කෙරෙන්නෙ නැහැ.

කුමන රැස්වීමකට ගියත්, කුමන තර්කයක් අසා සිටියත් කිසිවකුගෙ බලපෑම කට යටත් නොවී රහසේම තම ඡන්දය පාවිච්චි කරන්ට කාටත් පුළුවන් වෙන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසේකර මයා.]

ඕනැ. තමා කුමන පක්ෂයකට ඡන්දය දුන්නාද කියා කාටවත් කියන්ට අවශ්‍ය නැහැ. කාටත් පුළුවනි රහසේම කතිරය ගසන්ට. නමුත් ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමා තමන්ගෙම නමින් පුදුම කොළයක් ගසා තිබුණ, බලංගොඩ. පුද්ගලික වශයෙන් නොවෙයි පාර්ලිමේන්තු ලේකම්තුමා හැටි යටයි එය ගසා තිබුණෙ. ඒක පෝම් කොළයක්. එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයාට ඡන්දය දෙනවාය කියා දිවුරා පොරොන්දු වෙන බව ප්‍රකාශ කරමින් එය අත්සන් කර දෙන්ට ඕනැ. අපි ළඟ එම පෝම්ස් තියෙනව. ඒක අපි පත්‍රයෙත් දැම්ම. මෙකෙ රහස පිළිබඳ සුළු වශයෙන් ආරංචි මීට පෙර අවස්ථාවලදී ලැබී තිබුණු නමුත් එය ඔප්පු වුණේ මේ අවස්ථාවෙ දියි. ඇමෙරිකාවෙ ක්‍රියාත්මක වන "චේන්ජ් වෝට්ං" නමැති ක්‍රමය මෙහිත් ඇතැම් තැන්වල ක්‍රියාත්මක කළ බවයි මෙයින් මම විශ්වාස කරන්නෙ. ඇතැම් ඡන්ද පෙට්ටිවල හිස් කඩදාසි කොළ එක දෙක තිබුණු බව මැතිවරණ කොමසාරිස් වරයා විසින් පරීක්ෂා කර බැලුවොත් පෙනී යනවා ඇති. මේ "චේන්ජ් වෝට්ං" ක්‍රමයෙදි කෙරෙන්නෙ මේකයි: දෙපැත්තටම නැතිව වැනි වැනි ඉන්න ඡන්දදායකයන් ළඟට මේ උදවිය ගොස් එක්තරා කොළයකට ඔවුන්ගෙන් අත්සන් ගන්නව. දිවුරා අත්සන් කළාය කියා යමකට අත්සන තැබුවහම එය කඩ කිරීම නීති විරෝධි හැටියට ගමේ ගොඩේ අය සලකනව. ඒ විධියට අත්සන් කරවගෙන ඔවුන්ට මුදලක් දෙන්නත් පොරොන්දු වෙනව. නිකම්ම මුදලට පමණක් ඡන්ද ලබා ගන්න බැරි බව එක්සත් ජාතික පක්ෂය ඉගෙනගෙන තිබෙනව. අර විධියට අත්සන් කරවගෙන පොරොන්දු කරවා ගත් කෙනකුට කියනව, "තමුසෙ මෙන්න මේ කොළය අරගෙන ඡන්ද පොළට ගිහින් එතෙන්දි ලැබෙන නියම කොළය කුඩුව ඇතුළෙදි හංගගෙන, ඡන්දය දැමූ බව නිලධාරීන්ට පෙනෙන්න ඕනැ නිසා හිස් කොළය පෙට්ටියට දමා නියම කොළය රැගෙන එන්න" කියා. එය ගෙනාවට පස්සෙ, අර විධියටම පොරොන්දු කරව ගත්තවත් කෙනකුට කියනව, "මේ කොළය පෙට්ටියට දමා තමුසෙට ලැබෙන කොළය හංගගෙන එන්න" කියා. ඔය "චේන්ජ් වෝට්ං" හෙවත් දිවුරා අත්සන් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක වෙන්නෙ ඔහොමයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

බෙලිගම්මන ක්‍රමය.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கரா)*
(Mr. Weerasekera)

ඔව්. බෙලිගම්මන ක්‍රමය ක්‍රියාත්මක වෙන්නෙ ඔය විධියටයි. මෙය නැති කිරීමට සුළු යෝජනාවක් ඉදිරිපත් කරන්න මම අදහස් කරනව. මගේ යෝජනාව මැතිවරණ කටයුතු පිළිබඳ වගකීම භාර නිලධාරීන්ගෙ සැලකිල්ලට භාජන වේයයි මම විශ්වාස කරනව. ඡන්දය ලකුණු කිරීම හෙවත් කතිරය ගැසීම කාටවත් නොපෙනෙන තරමට පමණක් කුඩුව සෑදිය යුතුයි. පැන්සලය අල්ලා ඡන්දය ලකුණු කරන අතේ අග කොටස පමණක් ආවරණය වන විධියට අඟල් 6 ක 7 ක පමණ කුඩුවක් තිබීම හොඳටම ප්‍රමාණවත්. කුඩුව විශාලෙට තිබුණහම ඒ ඇතුළෙදි නොයෙක් විධියෙ දූෂණයන් සිදු වෙන්න ඉඩ තිබෙනව. අර මා කී විධියට කුඩුව හැදුවහම ඒක ඇතුළෙදි කාටවත් තමන්ගෙ සාක්කුවට අත දාන්නවත්, කොළ ඉනේ ගහගන්නවත් පුළුවන් කමක් නෑ. යම් කෙනෙක් එවැනි වරදක් කරන්න හැදුවොත් ඡන්ද නිලධාරීන්ටත් ඡන්ද ඒජන්තවරුන්ටත් ඒ බව පෙනෙනව. "චේන්ජ් වෝට්ං" කරන්න කිසිවකුට ඉඩක් ලැබෙන්නෙ නෑ. පසුගිය මහ මැතිවරණයෙදි දෙහිඕවිට ඡන්ද කොට්ඨාශයෙ පෙට්ටි කීපයකත් ඔය හිස් කොළ කීපයක් තිබුණා. එය කුමක්දැයි මා එදා දැනගෙන හිටියෙ නෑ. දැනුයි දන්නෙ කොළේ වහල ගහල තියෙන බව. මා මුලින් කී විධියට ඡන්ද ලකුණු කරන කුඩුව සකස් කළොත් මෙවැනි දූෂණවලක්වන්න පුළුවන් වේයයි මම විශ්වාස කරනව.

ඊළඟට, දෙමළ ඡන්ද ගැන ගරු අගමැතිතුමා මහ විකාර කියමනක් කිව්ව. එතුමාට බැඩි හරියෑත් කියන්නෙ විකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියමන්මයි. දෙමළ ඡන්ද සම්බන්ධයෙන් එතුමා ඉදිරිපත් කළේ මහ පුදුම තර්කයක්. ඡන්දය තිබෙන දෙමළ ජනතාව ඉන්දියාවට යවන්නෙ නැති නිසා, විරුද්ධ පක්ෂයෙන් ඉදිරිපත් කළ චෝදනාව වැරදි බවයි ගරු අගමැතිතුමා කිව්වෙ. ගිය මැතිවරණයෙදි වතුකරයට ගොස් එතුමන්ලා කිව්වෙ, ඡන්ද බලය නැති දෙමළ ජනතාව ඉන්දියාවට යවන බව නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හෙවත් මැතිණියට බලය ලැබුණොත් දෙමළ ජනතාවට ඉන්දියාවට යන්න සිදු වන බවත් එක්සත් ජාතික පක්ෂයට හෙවත් ඩඩ්ලි හාමුට බලය ලැබුණොත් දෙමළ ජනයාට මෙහෙ ඉන්න පුළුවන් බවත් එතුමා කෙලින්ම ප්‍රකාශ කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට ආවොත් තමන්ට ඉන්දියාවට යන්න සිදුවේයයි ඡන්දය තිබෙන ද්‍රවිඩ අය කල්පනා කළා. "ඩඩ්ලි අපට ඉන්න කිව්ව, මිරිම අපට යන්න කිව්ව" කියමිනුයි ඒ උදවිය පෙළ පාළි ගියෙ. මේ විධියෙ බලපෑම්වලට යට වෙලයි ඔවුන් ඡන්දය පාවිච්චි කළේ.

අතුරු මැතිවරණ අවස්ථාවෙදි බෙන්තර-ඇල්පිටියෙ බස් සේවය පැවැත්වුණු අන්දම ඒ ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන්න යෙදුණා. බලංගොඩ සිදු වුණේ ඒකෙ අනෙක් පැත්ත. අපේ අන්තිම රැස්වීම තිබුණෙ 21 වැනිදායි. ඒ රැස්වීමට සෙනග ඒම නවත්වන්න, බස් නැවතුම් පොළ ඉදිරිපිට බස් රථ 10ක් 15ක් නතර කර තිබුණා.

**එම්. අබ්දුල් බකීර් මාකර් මයා. (බේරුවල)**
*(ஜனாப் எம். அப்துல் பாக்கீர் மாக்கார்—வேருவலை)*
(Mr. M. Abdul Bakeer Markar—Beruwala)

ඒ පසුගිය කාලෙ සේවකයින් පුරුදු කළ හැටි තමයි.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

උන්නැහෙ කියන දේ කවුරුවත් ගණන් ගන්නෙ නෑ. උන්නැහෙ දන්නෙ මැණික් ගැන පමණයි. ඒත් අර යටින් යවන ඒව ගැන පමණයි.

**අබ්දුල් බකීර් මාකර් මයා.**
*(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)*
(Mr. Abdul Bakeer Markar)

රත්නපුරේ මැණික්.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

ගරු කථානායකතුමනි, අපේ රැස්වීම්වලට පවා අවහිර කළේ එහෙමයි. බස් යන්න බැරි පාරවලත් විශේෂ බස් දමා තිබුණා. අගමැතිතුමාගෙ බලන්ගොඩ මහා රැස්වීම තිබුණෙ මට මතක හැටියට 22 වැනිදයි. එදා මගේ හිතේ රත්නපුර, රක්වාන ප්‍රදේශවල එහෙම බස් නැහැ. ඇයි, ඔක්කොම බස් මෙහෙ. ලොරිවලින් බණ්ඩාරවෙල සෙනග ඇද්ද බලන්ගොඩට. බලන්ගොඩ සෙනග බණ්ඩාරවෙලට ඇද්දාය කියාත් මට ආරංචියි. මෙහෙමයි ඒ අයගෙ ප්‍රජාතන්ත්‍රවාදය. මගේ කල්පනාවේ හැටියට හැට ගණනක් පොලිස් අත අඩංගුවට ගත්ත. ඒ හැට ගණන අතර නඩුවක් වැටෙන එක් කෙනෙකුවත් සිටිය කියා මා විශ්වාස කරන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, අලුත් නුවර සිද්ධිය ගැන අගමැතිතුමා සඳහන් කළා. අලුත් නුවරට ගියාම එතන කලබල සහිත තත්ත්වයක් තිබුණාය, එම නිසා පොලිසියට ආවාය කියා එතුමා කිව්ව. අගමැතිතුමා අලුත් නුවර සිද්ධිය ගැන සඳහන් කළ නිසා මා ඒ පිළිබඳව මේ විස්තරය ඉදිරිපත් කරන්ට ඕනැ. අගමැතිතුමා සංචාරය කළ "පෝලිං ස්ටේෂන්ස්" කීපය බොහොම ලස්සනට සංවිධානය කර තිබුණා. අගමැතිතුමා එක ස්ථානයකට එන්ට පළමුවෙන් අර "චියරිං ස්ක්වොඩ්" නැත්නම් "ජයවේවා" කියන කට්ටිය එනව. අගමැතිතුමා ඒ ස්ථානයකට එන විට කලින් එතනට පැමිණෙන ඒ "චියරිං ස්ක්වොඩ්" එක "ජයවේවා" කියා කෑගහනව. අගමැතිතුමා ඒ ස්ථානයෙන් පිටත් වෙන්න පළමුවෙන් ඒ "චියරිං ස්ක්වොඩ්" එක ඊළඟ ස්ථානයට යනව. ඒ ස්ථානයට අගමැතිතුමා පැමිණ රථයෙන් බසිනවාත් සමගම කලින් පැමිණි අර කට්ටිය නැවතත් "ජයවේවා" කියා කෑගසනව. සමහර විට අගමැතිතුමා කල්පනා කරන්න ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගමක් ගමක් පාසා එතුමාට වැඩ කළ මිනිසුන් සිටියාය කියා. නමුත් ඒ ගැනත් දන්නවලු. ඔය විධියට අලුත් නුවරට පැමිණෙන විට තිස් දෙනෙකුගෙන් පමණ යුක්ත වුණු ඒ "චියරිං ස්ක්වොඩ්" එක, කොලපාට සාටක, කොලපාට තොප්පි ඇඳ ගෙන සිටි ඒ කට්ටිය, "ජයවේවා" කියා ඝෝෂා කරන්ට පටන් ගත්තා. ඒ සමගම අනෙක් පැත්තෙන් "සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියට ජයවේවා" කියන්නත්, "අත ලකුණට ජයවේවා" කියන්නත් පටන් ගත්තා. ඒ අවස්ථාවේදී ඉන්ස්පෙක්ටර් මහත්මයෙක් ඇවිත් අපේ ආධාරකරුවන් සියලු දෙනාම සිර භාරයට අරන් පොලිස් වෑන් එකෙන් ගෙන යන්න වුවමනාය කියා කිව්ව. ඒ අවස්ථාවේදී එතන හිටිය, හිටපු පාර්ලිමේන්තු ලේකම්තුමියක වන අපේ විවියන් ගුණවර්ධන මහත්මියත් එක් කෙනෙකුවත් හිර භාරයට ගන්න ඒ මැතිණිය ඉඩ දුන්නෙ නැහැ. අගමැතිතුමාට වාහනයෙන් බහින්නටවත් අවස්ථාවක් නොලැබී ලජ්ජාවෙන් ආපසු යන්න සිද්ධ වුණා. විවියන් ගුණවර්ධන මහත්මිය ඉදිරිපත්වීම නිසා කිසිම වරදක් නොකළ ඒ පිරිසෙන් එක් කෙනෙකුවත් පොලිසියට ගෙන යන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. අන්න ඒ ලැජ්ජාවට තමයි අලුත් නුවර සිටින නිල් සාටක ඇඳපු, නිල් තොප්පි ඇඳපු සියලු දෙනාම සිර භාරයට ගන්නය කියා පොලිසියට ගිහින් කිව්වෙ. ඒකයි අලුත්නුවර වෙච්ච සිද්ධිය.

**ඩී. පී. අතපත්තු මයා. (රාජ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. பீ. அத்தபத்து—இராஜாங்க அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. D. P. Atapattu—Parliamentary Secretary to the Minister of State)

අහගෙන හිටියද? අහගෙන හිටියෙ නැත්නම් කියන්නෙ බොරු නොවැ.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

නමුන්නාන්සෙ එහෙ හිටියෙ නැහැ. මම දන්නව වෙච්ච සිද්ධිය.

**ඩී. එෆ්. හෙට්ටිආරච්චි මයා. (නිවිතිගල)**
*(திரு. டீ. எப். ஹெற்றியாரச்சி—நிவித்திக்கல)*
(Mr. D. F. Hettiarachchi—Nivitigala)

නමුන්නාන්සෙගෙ පුතෙකු වන කෙනෙක් හිටිය එහෙ. [බාධා කිරීමක්]

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

පොලීසියෙන් වැඩියෙන්ම දූෂණ කළේ, පක්ෂපාතව ක්‍රියා කළේ, මුන්නැහෙගෙ නෑදෑයකු වන අතපත්තු ඉන්ස්පෙක්ටර් මහත්මයාය කියා මා කියනව. [බාධා කිරීම්]

ගරු කථානායකතුමනි, මා මේ පෙන්නුම් කරන්නෙ පොලීසිය පක්ෂපාතව ක්‍රියා කිරීම නිසා, රජයේ අණට, අගමැතිතුමාගේ අණට කීකරුව පක්ෂයක් අර ගෙන ක්‍රියා කිරීම නිසා අප මේ කොපමණ නීති සංශෝධනය කළත්, නීති සම්පාදනය කළත්, සාධාරණ මැතිවරණයක් පැවැත්විය නොහැකිය යන්නයි. ඔය අතපත්තු ඉන්ස්පෙක්ටර් මහත්මය කලින් හිටියෙ කලවානෙ. ඒ මහත්මය බලන්ගොඩට මාරු කළේ මේ අවස්ථාවේදී අවශ්‍ය දේවල් කරවා ගන්නයි.

මා දුටු තවත් සිද්ධියක් කියන්නම්. මගේ සහෝදරයෙක් ඉන්නව. එයා සමසමාජ කාරයෙක්. එයා වැඩ කළේ ඉඹුල්පෙ. එතැනට පොලිස් වෑන් එකක් ආව. ඇවිත් "අඩෝ, ගලවපන් රතු කමිසෙ" කියා අණ කළා. මම මොකටද රතු කමිසෙ ගළවන්නෙ, එහෙනම් අර කොළ කමිසත් ගළවන්න කියන්නය කියා එයා කිව්වා. එතකොට එක පාරටම ජීප් එකට නැගපන් කිව්වා. ඒ අවස්ථාවෙදි මෙයා ඉංග්‍රීසියෙන් කථා කළා. ඉංග්‍රීසියෙන් කථා කළාම ටිකක් නම්බු කරනවා. ඒක පොලීසියෙ තියෙන දුර්වලකමක්. "Get those green-shirted fellows in to your jeep, then I will get in" කියා මෙයා. කිව්වා. පස්සෙ මෙයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙ නම ඇහුවම කිව්වා, අහවලාය කියා. එතකොට ලිස්සලා යන්න ඇරියා. එදා ඒ අහු වුනේ ගමේ ගොඩේ අහිංසක කෙනෙක් නම් ඒ මිනිහට ගුටි කාලා යන්නයි, සිදු වෙන්නෙ. දක්ක සිද්ධියක් ගැන කියන්න කිව්ව නිසයි, මම ඔය දක්ක සිද්ධියක් ගැන කිව්වෙ.

අගමැතිතුමා මැතිවරණය දාට කලින් දවසේ ඉබුල්පේ ඒ අයගේ කාර්යාලයට ඇවිත් සාකච්ඡා කරන විට වෙලාව රෑ එකොළහයි. ගෙයින් ගෙට යාම විතරයි, ගරු අගමැතිතුමා කළේ නැත්තෙ. අනික් ඇමතිවරු නම් ඒකත් කළා. [බාධා කිරීමක්] ඔව්, බඩ ගෑවා. එක ඇමතිවරයෙක් එක් වතු අයිතිකාරයකුට තර්ජනය කරලා මුහුණටම කිව්වා, බලාගනින්, මැතිනියට වැඩ කරන්න එපා, වැඩ කළොත් උඹේ වත්ත "ස්ටේට් ප්ලාන්ටේෂන් කෝප රේෂන්" එකට ගන්නවය කියා. එවැනි දේ කෙරුණු මැතිවරණයකටයි, අපි මුහුණ දුන්නෙ. අපිත් පොලීසියෙ සිටිද්දී—නීතිඥ සරත් මුත්තෙට්ටුවෙගම මහත්මයත්, එන්. එල්. පෙරේරා මහත්මයත් සිටිද්දි—කොළ කමිස ඇඳගෙන, අලියා ලකුණ ගහගෙන කීප දෙනෙක් පොලීසියට ආවා. අපි ඇහුවා, සලකුණු ගසා ගැනීම තහනම් නේද, මේ අයට විරුද්ධව ක්‍රියා කරන්නෙ නැත්තෙ ඇයි කියා. එත කොට එතැන හිටපු නිලධාරී මහත්මයෙක් මට කිව්වා, මේ ගැන වැඩිය එළවන්න එපා, අපි නීතිය ක්‍රියාත්මක කළොත් තමුන්නාන්සේලා සන්තෝෂ වෙයි, නමුත් අපට රක්ෂාව නැති වෙයි කියා. එවැනි තර්ජන මැදයි, අපි මැතිවරණය ගෙනිච්චෙ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
රාජ්‍ය ඇමතිතුමා නම් හොඳට හැසිරිලා තියෙනවා.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
උන්නැහේ කැමතිලු, පැරදුනාට. මේ මැතිවරණය ගෙන යන්න අපට බොහොම අමාරු වුණා, බලන්ගොඩ හිටපු මන්ත්‍රීතුමත්, එතුමාගේ ප්‍රධාන ආධාරකාරයනුත් නඩුවේ ප්‍රශ්නය උඩ සම්පූර්ණයෙන් පැත්තකට වී සිටීම නිසා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
1965 මාර්තුවලදිත් මැතිවරණය ගෙන යන්න අමාරු වුනා, බලන්ගොඩ. ඒවා දැන් අමතක වෙලා තියෙනවා.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
1965 මාර්තු මැතිවරණයේදී උන්නැහේ ලාට දිනන්න පුළුවන් වීමෙන්ම පෙනෙනවා, අප එවැනි බලතල පාවිච්චි කළේ නැති බව. ඒ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මැතිවරණය ගැන කථා කළාට, තව මත් ඡන්දය ලබා ගන්න බලාපොරොත්තු වෙන්නේ "ආමි" එක අනුගමනය කරන මැරවර මාර්ගවලින්මයි.

බලන්ගොඩ මැතිවරණයේදී අපේ පැත්තට වැඩ කරන්න බලන්ගොඩ ආසනය ගැන සෑහෙන තරම් දුරට දන්න විජේසූරිය මහත්මයා අපට ඉතිරි වුණා. ඒ මහත්මයාට භාරව තිබුනේ මැතිවරණයට පෙර වාහනවලට පෙට්රල් දීම සහ මැතිවරණය දවසේ පෝලිම් ඒජන්තවරුන් නොයෙක් නොයෙක් ස්ථානවලට පිටත් කර යැවීම පමණයි. නමුත් පාන්දර බොරු චෝදනාවක් ඉදිරිපත් කර ඒ මහත්මයා හිර භාරයට ගත්තා. අපි නීතිඥයන් ඉදිරිපත් කර කිව්වා, ඒ මහත් මයාට ඇප දෙන්නය කියා. නමුත් ඇප දුන්නෙ නැහැ. පරණ සිද්ධියක් තියෙන වය, මේ වතාවෙත් එය සිද්ධ වෙන්න පුළුවන්ය කියන සැකය උඩ ඒ මහත්මයා ඇල්លුවා. හතරබාගේ "පෝලිං ස්ටේෂන්" එකට අපෙන් 9 දෙනෙක් ගියා. නිල් සාටක ඇඳගෙන සිටියාය කියා ඒ 9 දෙනාම ජීප් එකට දා ගත්තා. කලින් චෝදනාවක් නැත කිව්වා. පසුව චෝදනාවට කිව්වෙ සාමය කඩ කරාවිය කියා සැකයක් තිබෙන බවයි. අපේ නියෝජිතයන්ට ගැහුවත් තවම කිසිම දෙයක් කරල නැහැ.

ගරු කථානායකතුමනි, මැතිවරණයකින් පසු දිනූ අපේක්ෂකයාට කච්චේරියේදී තමන්ට ආධාර කළ පිරිසට ස්තුති කිරීම සඳහාත්, සාමකාමීව ගෙදර යන්න කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසේකර මයා.]

කීමට හෝ වෙනත් යම් කිසි දෙයක් කීම සඳහාත් අවසථාව දීම සිරිතක්. නමුත් රත්නපුරයේ යූ. එන්. පී. එක බදාගෙන පක්ෂපාතව කටයුතු කරන පතිරණ නමැති ඒජන්ත මහත්මයාගේ අණ උඩ, ජයග්‍රහණය කළ මල්ලිකා රත්වත්තෙ මැතිණියට වචන සවල්පයක් කථා කරන්න වත් ඉඩ දුන්නෙ නැහැ. ඒකයි, ප්‍රජාතන්ත්‍ර වාදය! බෙන්තර-ඇල්පිටියේ අපක්ෂපාතව කටයුතු කළ නිලධාරි මහත්මයෙක් සිටිය නිසා දිනූ තැනැත්තාටත්, පැරදුණු තැනැත්තාටත් කථා කරන්න අවසථාව දුන්නා. නමුත් බලන්ගොඩ දිනූ තැනැත්තාටවත්, පැරදුණු තැනැත්තාටවත් එවැනි අවසථාවක් දුන්නෙ නැහැ. අබුසාලි මහත්මයා අලුත්නුවරට ගොස් කිව්වේ කුමක් ද? "ඇටර්නි ජනරල් මගෙ මස්සිනා නිසා මම ඔක්කොම බලා ගන්නම්" කිව්වා. [බාධාකිරීම්] මා මෙය කියන්නෙ වගකීමක් ඇතිවයි. ගෙදර බල්ලාය කියන්නෙ ඒ නිසයි. "උසි" කිව්වම හපා කනවා: "මෙහෙ ඉජ" කිව්වම තමන් ළඟට එනවා. අබුසාලි මහත්මයා පස්සෙ හෝ ඩඩ්ලි සේනානායක මහත්මයා පස්සෙ හෝ යනව.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
කව්ද කියන්නෙ?

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
හැම එක්කෙනාම කියන්නෙ "ගෙදර බල්ලා" කියලයි. ඒ තරමටම බොහොම කීකරුයි. නීති සකස් කරන්න ඕනෑ කාටත් සාධාරණ ලෙස බලපාන ආකාරයටයි. නීතිය සකස් කරන නිලධාරීන් වුවත් නීතිය කඩ කළොත්, ඒ ගැන පැමිණිල්ලක් ලැබුණාම නියම අන්දමට ක්‍රියා නොකළ අවසථාවක් ඇති වුණාම දැඩි පියවරක් ගන්න ඕනෑ. ඒ ගැනත් සෑහෙන සැලකිල්ලක් ඇතිව කටයුතු කරන්න ඕනෑ. එසේ නොකර තොත් කොපමණ නීති ඇති කළත් රටට සෙතක් නම් වන්නේ නැහැ.

අ. භා. 5.35

**ජේ. එල්. සිරිසේන මයා. (බිංගිරිය)**
*(திரு. ஜே. எல். சிறிசேன—பிங்கிரிய)*
(Mr. J. L. Sirisena—Bingiriya)
ගරු කථානායකතුමනි, ඡන්ද නීතිය ගැන කථා කරන්නට ගියාම මෙවැනි ගරු සභාවලදී නම් කථා කරන්නෙ හරියට අටසිල් සමාදන් වුණු සිල්වත් උපාසක මහත්තැන්ලා වගේ තමයි. එහෙත් ක්‍රියාවට ගියාම නම් බලු වලිගන්නෙත් නැහැ. අයුතු බලපෑම් ගැන—ඡන්ද කට යුතු කෙරෙන කාලයේ සිදු වුණාය කියන අයුතු බලපෑම් ගැන—නොයෙක් දේවල් අහන්න ලැබුණා. බලංගොඩ අතුරු මැතිවරණ කාලයේ සිදු වූ දේ ගැන ඒ හා සම්බන්ධ වූ උදවිය හොඳින් දන්නව. ඉහත කාලයේදී මැතිවරණ පැවැත්වුණු ආකාරය ගැන කවුරුත් පාහේ හොඳින් දන්නව. මැතිවරණ කටයුතු කරගෙන යාමට මේ රටේ වාමාංශික පිරිස් විසින් යම් යම් වැඩ පිළිවෙළවල් ලෑස්ති කර තිබුණා. ඒ කාලයේ මහා මැතිවරණයක් ඇති වුණාම එක දවසේ ආසන කීපයක පමණයි ඡන්දය විමසන්නට පුළුවන්කම තිබුණේ. මැතිවරණය සම්පූර්ණයෙන් අවසන් වීමට දවස් දෙක තුනකටත් වඩා කල් ගත වුණා. ඒ නිසා කොළඹ ඉන්න යම් යම් පිරිස් පුදුරු පුහුණු කර හොර ඡන්දය දීමටත් වෙනත් ත්‍රස්තවාදී ක්‍රියා කිරීමටත් යවන්න ඔවුන්ට පුළුවන්කම තිබුණා. [බාධාකිරීම්]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
කරුණාකර ඒ ගරු මන්ත්‍රීතුමාට කථා කරගෙන යන්න ඉඩ දෙන්න.

**ජේ. එල්. සිරිසේන මයා.**
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)
ගරු කථානායකතුමනි, ඒ පුරුද්දේ පුදුම බලපෑම නැවතුණේ 1960 මාර්තු මාසයේදී ගාල්ලේ ගරු මන්ත්‍රීවරයා වන සවදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා අගමැතිව සිටි කාලයේදී එක් දිනකින් මහා මැතිවරණය පවත්වන්න පටන් ගත් අවසථාවේදීයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
ඒක අපේ නීතියක්.

**ජේ. එල්. සිරිසේන මයා.**
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)
මහා මැතිවරණයක් තිබෙද්දී දැන් ඉස්සර කළ දේවල් කරන්න බැහැ. එහෙත් අතුරු මැතිවරණයක් වුණාම ඇති වන තත්ත්වය ඉන් ටිකක් වෙනස් නිසා ඒ පරණ පුරුදු කාලයට ඒ කටයුතු කරන්න පුළුවන්කම තිබෙනවා. බලංගොඩ මැතිවරණ කොට්ඨාශයේ අතුරු මැතිවරණ කට යුතු කරගෙන යන කාලයේ සුමාන තුනක් තිස්සේ දවස ගානේ මා ඒ කොට්ඨාශය තුළ කාලය ගත කර තිබෙනවා.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)
එහෙම නම් තමුන්නාන්සෙ තමයි කෑවෙ බලංගොඩ.

**ජේ. ඇල්. සිරිසේන මයා.**
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)
මේ ගරු සභාවේදිවත් විනීත අන්දමට හැසිරෙන්න බැරි මහත්වරුන් අධිනීතිඥ මහතුන් වීම ගැන මා කනගාටු වෙනවා. 23 වැනිදා පාන්දර ලංකා සමසමාජ පක්ෂයේ නායිකාවක් සෙනග තිහක් හතළිහක් පමණ අරන් දෙහිඹිවිට ගරු මන්ත්‍රීතුමාගේ පියා වන අලුත්නුවර දේවාලේ බස්නායක නිලමේගේ නිවසට ගියා. මේ පිරිස 150කට අධික වුණා රාත්‍රි හය හත වන විට.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
එයා ගිවියෙ කාමරේකයි.

**ජේ. එල්. සිරිසේන මයා.**
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)
මා ගිවියෙ කාමරයක නොවෙයි, අල්ලපු ගෙදර.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
අල්ලපු ගෙදරක් නැහැ, අල්ලපු කඩේ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
කරුණා කර ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ හරින්න. මේ ගරු සභාව කෝලම් මඩුවකැයි ගරු මන්ත්‍රීවරුන් කල්පනා කරනවා වගෙයි. මා මේ තරම් කියද්දිත් ගරු මන්ත්‍රීතුමන්ලා කථාවට බාධා කිරීම හරි නැහැ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன—சமூக சேவை அமைச்சர்)*
(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)
ලජ්ජා නැතිකම මහ මුදලිකමටත් වඩා ලොකුයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
තව දුරටත් රීතිගරුක නොවී සිටියොත් ගරු මන්ත්‍රීවරුන් දෙතුන් දෙනකු සභා ගර්භයෙන් පිට කරන්න මට සිදු වෙනවා. කරුණා කර කථා කරන්න ඉඩ දෙන්න.

**ජේ. එල්. සිරිසේන මයා.**
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)
රාත්‍රි වන විට 150 ක් පමණ වුණු මේ පිරිස මගේ ඇස් ඉදිරිපිටම ඒ මිදුලෙන් ගමන් කළ කොයි පැත්තට ඡන්දය දෙන වාදැයි අපි කිසිවෙක් නොදන්න, පුද්ගලයෙකු බලයෙන් ඒ ගෙදරට අඩ ගහගෙන ගොස් ඔහුට අරක්කු බෝන්ට දුන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඒක බොරුවක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජේ. එල්. සිරිසේන මයා.
(திரு. ஜே. எல். சிறிசேன)
(Mr. J. L. Sirisena)
ඒ පුද්ගලය කිව්ව, මම කවදාවත් බොන්නෙ නැහැ කියා. වෙරි මතින් සිටි පුද්ගලයින් දෙතුන් දෙනෙක් එකතු වෙලා ඒ පුද්ගලයාගෙ කටට බලෙන් අරක්කු වත් කළා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
කවුද?

ජේ. එල්. සිරිසේන මයා.
(திரு. ஜே. எல். சிறிசேன)
(Mr. J. L. Sirisena)
විවියන් ගුණවර්ධන මැතිනිය සමග ගිය සහචරයන්.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
තමුසෙ කලිසම ඇඳගෙන නේද, හිටියේ?

ජේ. එල්. සිරිසේන මයා.
(திரு. ஜே. எல். சிறிசேன)
(Mr. J. L. Sirisena)
මම කලිසම ඇන්දම තමුසෙට මොකද වෙන්නෙ? මම කලිසනුත් අඳිනව; රෙදිත් අඳිනව. ඒකෙ අමාරුවක් තියෙන වයැ. තමුසෙ කාලයක් රෙදි ඇන්දෙ. [බාධා කිරීමක්] තමුන්නාන්සෙලාගෙ නායකයා තුන් හවුල් ආණ්ඩුවෙ ඉන්න කාලයෙ එහෙමයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please. Hon. Members must behave. I shall have to name the next Member who interrupts.

ජේ. එල්. සිරිසේන මයා.
(திரு. ஜே. எல். சிறிசேன)
(Mr. J. L. Sirisena)
ගරු කථානායකතුමනි, එපමණක් නො වෙයි. නාමල්ගහ ඡන්ද පොළට ගියාය කියන පෝලින් ඒජන්ත මහත්මයා එහි වෙන යාමයේ 2.30 ට පමණ තමයි එහි ගිහින් තියෙන්නෙ. පොලිස් වාර්තාව අනුව, ඔහුගේ කට උත්තරයේ හැටියට, පාන්දර 2.30 ට පමණ තමයි, ඔහු එහි ගිහින් තිබෙන්නෙ. මට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්ව වගේම මේ ඡන්ද පොළට යැමට හැතැප්ම ½ කට වැඩි දුරක් පයින් යායුතුව තිබෙනව. බයිසිකල යකින්වත් ඒ ස්ථානයට යන්ට බැහැ. මැතිවරණ කටයුතු උදේ 8 ට පටන් ගන්න නියමව තිබෙද්දී පාන්දර 2.30 ට පමණ තමයි, මේ පෝලින් ඒජන්තතුමා ගෙදරකට ගිහින් තියෙන්නෙ. එතැනදී කෝලාහලයක් වුණාය කියා අපටත් අහන්ට ලැබුණ. ඒ සිද්ධිය සම්බන්ධ යෙන් පොලීසිය යම් යම් උදවිය අල්ල ගත්ත බවත් අහන්ට ලැබුණ. තවත් අහන්ට ලැබුණු කාරණයක් තමයි, මැතිවරණ දවසේ උදේ 9 ට විතර මැකී රත්වත්තෙ දොස්තර මහත්මයා මට කලින් කථා කළ මන්ත්‍රීතුමා සඳහන් කළ ඒ ගෙදරට ගිහින් ඒ අහිංසක ස්ත්‍රියට වෙන විධියකට කට උත්තරයක් දෙන්න කියා බල කළාය කියන එක. [බාධා කිරීමක්]

මැද කොළඹ තුන්වෙනි ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) කිව්ව, මේ කාරණය සම්බන්ධයෙන් 64 දෙනකු පොලීස් සිර භාරයට ගෙන තිබෙනවය කියා. මම නම් ගණන හරියට දන්නෙ නැහැ. ගණන කීයක් හෝ වේවා මේ සිර භාරයට ගත් අය අතර එක්සත් ජාතික පක්ෂයට වැඩ කළ උදවියත් සිටිනව.

දෙහිඕවිට ගරු මන්ත්‍රීතුමා (වීරසේකර මයා.) ආරියසිංහ නමැති සහකාර පොලිස් අධිකාරි මහත්මයෙක් ගැන සඳහන් කළා ඒ මහත්මයා මගේ ගමේ පුද්ගලයෙක්. එහෙත්, අත් අඩංගුවට ගෙන සිටි එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවන් එක් කෙනෙකුට දෙන්නෙකුට ඇප දෙන්ට පුළුවන්දැයි මා සවස 5.30 ට විතර ඔහුගෙන් ගිහින් ඇසුවාම ඔහු බැරිය කිව්ව. ඒ පිරිස රාත්‍රී 9 ට 10 ට විතර රත්නපුර මහෙස්ත්‍රාත්තුමා ඉදිරියට පමුණුවලයි, ඇප දුන්නෙ. එහෙම නම් කොහොමද ඒ ගරු මන්ත්‍රීතුමා මේ සභාවේදී කියන්නෙ පොලිසිය පක්ෂපාතව ක්‍රියා කළාය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ වගේම අපේ දෙහිඹිවිට ගරු මන්ත්‍රීතුමාගෙන් වැදගත් දෙයක් කිය වුණා. අර කථාවක් තියෙනව, "කට බොරු කිව්වත්, දිව බොරු කියන්නෙ නැහැ" කියල. එතුමා ඡන්දාපේක්ෂකයන්ගෙ වර්ණ ගැන සඳහන් කරන විට සෑම වෙලාවෙම වගේ කිව්වෙ "නිල් පාට ඇඳ ගත්ත, නිල් පාට ලේබල් ගහ ගත්ත" ආදි වශයෙනුයි. ඒක සම්පූර්ණ ඇත්ත [බාධාකිරීමක්] පොලිස් අත් අඩංගුවට ගත් පිරිසට ඇප දෙන්ට පුළුවන් වුණේ මහෙස්ත්‍රාත්තුමා ඉදිරියට පැමිණවීමෙන් පසුවයි. එයින් අපට පෙනී යනව, පොලීසිය පක්ෂපාතව ක්‍රියා කළේ නැති බව.

නාමල්ගහ ඡන්ද මධ්‍යසථානයේ තවත් සිද්ධියක් ඇතිවී තිබෙනව. මා කලින් සඳහන් කළා, 23 වැනිදා සවස හය, හත පමණ වන විට කොළඹින් සෙනග 150 ක් විතර එහි ළඟා වූ බව. නාමල්ගහ ඡන්ද මධ්‍යස්ථානය පරීක්ෂා කරන්ට සහකාර පොලිස් සුපිරින්ටැන්ඩන්ට්වරයා යන අතරතුර ගමේ ඡන්ද බලයවත් නැති පොඩි ළමයින් කීප දෙනකු ඒ මහත්මයාට පැමිණිලි කර තිබෙනව, යම් යම් පිරිස් ඒ උදවියට තර්ජනය කරන බවට. ඒ පැමිණිල්ල උඩ ක්‍රියා කළ සහකාර පොලිස් අධිකාරීවරයා 9 දෙනෙකු හිර භාරයට ගත්ත. ඒ සියලු දෙනාම කොළඹ තොට ලඟින් ගිය පිරිස. එයින් 3 දෙනෙක් අයි. ආර්. සී. කාරයන්.

දෙහිඹිවිට ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී සඳහන් කළා, 1965 තුන් හවුල බලයේ සිටිද්දී අයුතු බලපෑම් සිදු වුණා නම් කොහොමද එක්සත් ජාතික පක්ෂය මැතිවරණයෙන් දිනුවෙ කියා. ඒක අතුරු මැතිවරණය සම්බන්ධයෙනුත් බොහොම හොඳට එල්ල කරන්ට පුළුවන්. එක්සත් ජාතික පක්ෂයේ බලපෑම් තිබුණා නම් ආසන තුනම ඒ අය දිනුවෙ කොහොමද? ඔය විදියට අතුරු මැතිවරණය ගැනත් බොහොම හොඳට තර්ක කරන්ට පුළුවන්. ආණ්ඩු පක්ෂය බලපෑම් කළා නම් එතුමන්ලා ආසන තුනම දිනාගත්තෙ කොහොමද කියා මා අහන්ට කැමතියි. නාමල්ගහ ප්‍රදේශයේ සිරභාරයට ගත් 9 දෙනාගෙන් 3 දෙනෙක්ම අයිආර්සී කාරයො. 9 දෙනාම කොළඹ තොටලඟ අය.

23 වැනිදා බෙලිහුල්ඔය ප්‍රදේශයේ විශාල සෙනගක් හැසිරුණු බව ඇත්ත. මැද කොළඹ 3 වැනි ගරු මන්ත්‍රීතුමා ඒ ගැන කිව්ව. එතුමාම කිව්ව, එතුමාගෙ රිය දුරා මධ්‍යම රාත්‍රියෙ ටෝච් එකක් අරන් ආවය කියල. ලයිට් තිබෙන බෙලිහුල්ඔය රෙස්ට් හවුස් එකට නැත්නම් තානාය මට මධ්‍යම රාත්‍රියෙ ටෝච් එකක් අරන් එන්නෙ මොනවටද කියල තමුන්නාන්සෙට පුදුම හිතේවි. කොළඹින් ගෙනිච්ච ත්‍රස්තවාදි පිරිසත්, තවත් හමුදුරුවරු පිරිසකුත් සමග රෑ එළි වන තුරු ඒ පළාතෙ ගෙයක් ගෙයක් ගානෙ ඇවිද්ද. මේව අයුතු බලපෑම් නොවෙයිද? [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

සල්ලිත් බෙදුව.

**ජේ. එල්. සිරිසේන මයා.**

*(திரு. ஜே. எல். சிறிசேன)*

(Mr. J. L. Sirisena)

මම ඇහින් නොදැක්ක, කණින් නාහපු දෙයක් ගැන කථා කරන්නෙ නැහැ. සල්ලි බෙදනව මම දැක්කෙ නැහැ. ඒක ආරංචියක් පමණයි. ඒ නිසා ඒ ගැන මම කියන්න යන්නෙ නැහැ. නමුත් කොළඹින් 500-600 ක් පමණ සෙනග ගෙන ගිහින් අනන්තවත් අයුතු බලපෑම් කළා.

අළුත්නුවර ඡන්දපොළත්, බස්නායක නිලමෙතුමාගෙ බංගලාවත් තිබෙන්නෙ එකම මිදුලෙ යාර 10 ක් විතර ඇතිනුයි. 24 වැනි දා උදේ 9 ට විතර ඒ මිදුලෙ "අත් සලකුණ" ගසාගත්ත යම්කිසි මැර වර පිරිසක් ඡන්දය දීමට එන පිරිසට අවහිර කිරීමට ලෑස්ති වුණා. ඒ අවස්ථාවෙ එක්සත් ජාතික පක්ෂයට වැඩ කරන පිරිස ඊට පිළිතුරු දෙන්ට ලෑස්ති වුණා. නමුත් කලබලයක් ඇතිවීමට මා ඉඩ දුන්නෙ නැහැ. පුළුවන් තරම් උත්සාහ කරල, කලබලයක් වෙන්ට ඉඩ නොදී ඒ පිරිස නවත්ව ගත්ත. මිනිත්තු කීපයක් ඇතුළත පොලිස් ඉන්ස්පෙක්ටර්වරු කීප දෙනෙක් සහිත පොලිස් ජීප් රථයක් එතැනට පැමිණුනා. මම ඒ මහත්වරුන්ට කිව්ව, "මෙතැන සමහර විට කෝලාහලයක් වෙන්ට පුළුවන්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරුණාකර ඒ ගැන ටිකක් විමසීමෙන් ඉන්ට" කියා. එතකොටම තමුන්නාන්සෙලගෙ සමසමාජ පක්ෂයෙ නායිකාවක් ගිහින් පොලිස් ඉන්ස්පෙක්ටර් මහත්මය එක්ක තර්ක කරන්ට පටන් ගත්තා. පොලිස් ඉන්ස්පෙක්ටර් තමන්ගෙ රිය තුළ තිබුණු ඡන්ද රෙගුලාසි පොත අරගෙන සමසමාජ නායිකාවට පෙන්නුවාම, "මට ඕනැ කරන්නෙ ඔක නොවෙයි" කියා ඒ නායිකාව කිව්ව. එවිට පොලිස් ඉන්ස්පෙක්ටර් කිව්ව "මැතිණියට ඕන හැටියට එක විදියකටත්, තව පක්ෂයක කෙනෙකුට ඕන හැටියට තව විදියකටත් මේක තේරුම් කරන්ට මට බෑ. ඒ නිසා හැතැප්ම 1/4 කට එහා මිසක් කාටවත් ඡන්ද සලකුණු ප්‍රදර්ශනය කිරීමට ඉඩ දෙන්නෙ නෑ" කියල. ඒ ටික වේලාවකට පස්සෙයි, අගමැතිතුමා ආවෙ. ලොරිවලින් ගෙනිච්ච මිනිස්සු ඇවිත් "ජය වේවා" කියනව මම නම් දැක්කෙ නැහැ. අගමැතිතුමාට රථයෙන් බහින්ටවත් කිසි වුවමනාවක් තිබුණෙ නැහැ. එතුමා ඡන්දපොළ ළඟට ඇවිත් මිනිත්තු දෙකක්වත් නැවතුනේ නැහැ, යන්ට ගියා. එතැන කෑගහන්ට, ලොරිවලින් සෙනඟ ආවෙ නැහැ. නමුත් එතැන හිටපු එක්සත් ජාතික පාක්ෂිකයො එතුමාගෙ පැමිණීම සාදරයෙන් පිළිගෙන "ජය වේවා" කියා කිව්ව. ඒක ඇත්ත. ඒ අතරම, විරුද්ධ පක්ෂයෙ උදවිය "සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියට ජය වේවා" කියල කිව්ව. ඒක සාධාරණයි. ඒකෙන් කාටවත් අයුතු බලපෑමක් වුණේ නැහැ.

පුතා "සමසමාජය" දේශනා කළාට අළුත්නුවර බස්නායක නිළමෙතුමා දේවාලෙගමේ ඉඳගෙන දුප්පත් මහජනය සූරාකනව. ඒ බව මට ඔප්පු කරන්ට පුළුවන්. මම කියන්නෙ, ඔප්පු කරන්ට බැරි ඒව නොවෙයි; ඔප්පු කරන්ට පුළුවන් ඒවයි. බස්නායක නිළමෙ තුමාගෙ කන්තෝරුවෙ අවුරුදු 15 ක් සේවය කළ ලියන මහත්මය 23 වැනිදා පාන්දර 8 ට අස් කළා. එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන්ට ලෑස්තිවුණාය කියල. ඒක අයුතු බලපෑමක් නොවෙයිද?



අනික, දේවාලගමේ ඉන්න සැම කෙනකුටම අණ කළා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයාට ඡන්දය දෙන්නය කියා. එසේ නොකලොත් කිසිම කෙනකුට මැණික් හාරන්නටවත්, ඉන්නටවත් ඉඩ දෙන්නේ නැහැ කියා කිව්ව.

එපමණක් නොවෙයි. මේ බස්නායක නිළමෙතුමා මහා භාරකාරතුමා පවා රවටා තිබෙනව. එක මැණික් පතලයකට බහින්ට අරන් තිබෙන අවසර පත්‍රයෙන් මැණික් පතල් හත අටකට බහිනව. ඒ සේරම ඉල්ලම් මැණික් ගරන තැනට ගොඩ දානව. එපමණක් නොවෙයි, ඒවයෙ වැඩ කළ අය පවා දැන් එළවා දමල. [බාධාකිරීම්]

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
I challenge you to say that outside. කියපන් එළියෙ බලන්න. අමූලික පට්ට පල් බොරු කියන්න එපා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Order, please!

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
That is an utter lie. මට බැන්නට කමක් නැහැ. ඕනෙ නැති ප්‍රශ්න අදින්න එපා.

**ජේ. එල්. සිරිසේන මයා.**
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)
අයුතු බලපෑම් ගැනයි කියන්නෙ.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)
පරය; පරය. [බාධා කිරීම්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ඔය සමසමාජ කාරයන්ගෙ හැටි තමයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Hon. Member for Dehiowita, please withdraw that word.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

I withdraw that. I apologise to you for that and I withdraw that word. I lost my temper when he kept on abusing my father.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

තමුන්නාන්සෙල කියන ඒව අපි නම් අසාගෙන සිටිනව මහත්වරු වාගෙ.

**ජේ. එල්. සිරිසේන මයා.**
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)

මැණික් වීදුරුවෙනවය කියා සමහර අය අංගොඩටත් ගියා. රත්තරන් පිත්තල වෙනවය කියාත් සමහර අය අංගොඩ ගියා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr Speaker)

Hon. Members must be careful in what they say. [බාධා කිරීම්]

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

එන්න කියනව බලන්න. [බාධා කිරීම්.]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please !—[*Interruption*].—He has withdrawn it. Hon. Ministers must be more careful in their speech.

**ජේ. එල්. සිරිසේන මයා.**
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)

ඇත්ත බොහොම විසයි. කාටත් ඒක එහෙමයි. මැණික් වීදුරු වෙන අවස්ථා තිබෙනව. රත්තරන් පිත්තල වෙන අවසථා තිබෙනව.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Will the hon. Member please listen to me ? You are not referring to the Motion at all. Please come back to the Motion before the House.

**ජේ. එල්. සිරිසේන මයා.**
*(திரு. ஜே. எல். சிறிசேன)*
(Mr. J. L. Sirisena)

ඔය විධියට අළුත්නුවර ඡන්දපොලේ බල පෑම් සිදු වුණා. පෙර දින කොළඹ සිට පන් සියයක් හය සියයක් පමණ ගොස්—[බාධා කිරීම්]. තමුන්නාන්සේ තබා වෙන කිසිවකු වත් පිළිගන්නෙ නැහැ කොළඹින් යන අයට පෝලිං ඒජන්ට්ස්ලා හැටියට ක්‍රියා කරන්ට පුළුවන්ය කියා. බලංගොඩ ඡන්දදායකයන් ගැන ඒ අයට හැඟීමක්, දැනීමක් තියෙනව ද ? එහෙම හැඟීමක් දැනීමක් නැති පිරිස කූයි පෝලිං ඒජන්ට්ස්ලා හැටියට බලංගොඩට ගෙනිච්චෙ. තොට ලඟ, මාවත්තෙ, වරායෙ සිට ගිය පිරිස බලංගොඩ ඡන්ද දායකයන් අඳුනන්නෙ නැහැ. බලංගොඩ සමහර ගම්වල සිට එන්ට අඩි පාරක්වත් නැහැ. එවැනි ප්‍රදේශවල සිට පැමිණෙන ඡන්දදායකයන් හඳුනන්ට ඒ අයට පුළුවන් ද ? ඒ අනුව තමුන්නාන්සෙල කවුරුත් අවිවාදයෙන් පිළිගන්ට ඕනෑ, අයුතු බලපෑම් කිරීම සඳහා බොහොම ලස්සනට වැඩ පිළිවෙළ යොදා ක්‍රියා කර තිබෙන බව. මා දන්නෙ නැහැ, අනිකුත් කොට්ඨාශවල කෙසේද කියා. බලංගොඩට නම් මෙවැනි පිරිස් ගෙන ගොස් නොයෙක් විධියෙ අයුතු බලපෑම් කර තිබෙනව. එම නිසා අපි ඡන්ද කොමසාරිස්තුමාගෙන් ඉල්ලා සිටිනව, මැතිවරණ ව්‍යවස්ථා වෙනස් කරන විට එවැනි අක්‍රමිකතාවලට ඉඩ නොලැබෙන ආකාරයට ක්‍රියා කරන්ටය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. එෆ්. සිරිසේන මයා.]

තවත් වැදගත් කාරණයක් කියන්ට තිබෙනව, මෙම මැතිවරණය පිළිබඳව. ග්‍රාම සේවක මහත්වරු ගැන විශෙෂයෙන් සඳහන් කරන්ට ඕනෑ. මෙම ඡන්දදායක කොට්ඨාශ තුනේ පමණක් නොවෙයි ලංකාවෙ සෑම ග්‍රාම සේවක කොට්ඨාශයකම වාගෙ සමහර ග්‍රාම සේවක මහත්වරු ඒ අයට හිතවත් අහිතවත් අන්දමට ඡන්ද දායකයන්ගෙ නම් ලැයිස්තුවලින් අතහැර දමා තිබෙනව. බලංගොඩ ඡන්ද කොට්ඨාශ යේ විරුද්ධ පාර්ශ්වයට පක්ෂපාතය කියා ඒ අයට හිතෙන අවුරුදු 14 ළමයින්ගේ නම් පවා ඡන්ද ලැයිස්තුවලට ඇතුළත් කර තිබෙනව.

ගරු කථානායකතුමනි, මගේ තර්කය මේකයි : යම්කිසි පුද්ගලයකුට හාල් සලාක පොතක් ලැබී තිබෙනවා නම්, ගෘහමූලික ලැයිස්තුවේ නම තිබෙනවා නම්, නම අනුව ඔහු සිංහලෙක්ය කියා තිරණය කරන්න පුළුවන් නම්—ඒ පළාත්වල සියයට 99.9 ක්ම සිටින්නේ සිංහල අයයි—කලින් ඡන්ද ලැයිස්තුවල ඔහුගේ නම තිබුණා නම්, ඔහු ගේ නම හිටි හැටියේ ඡන්ද ලැයිස්තුවෙන් අස් වෙන්නේ කොහොමද? මේ ග්‍රාම සේවක මහත්වරුන් මැතිවරණ කොමසාරිස්තුමා යටතේ සිටින පිරිසක් නොවුණත් ඡන්ද ලැයිස්තු පිළිබඳව වගකිව යුත්තේ මැතිවරණ කොමසාරිස්තුමා නිසා එතුමා විසින් ඒවා ගැන පරීක්ෂා කර බලා කටයුතු කළ යුතුව තිබෙනව. ඒ අන්දමින් නීති සකස් වන්නට ඕනෑ. හාල් සලාක පොත් තිබෙනවා නම්, ගෘහමූලික ලැයිස්තුවල නම් තිබෙනවා නම්, සිංහලයන් බව නම්වලින්ම ඔප්පු වෙනවා නම්, කලින් ඡන්ද ලැයිස්තුවල නම් ඇතුළත්ව තිබුණා නම්, ඒ අයගේ නම් හදිසියේම ඡන්ද ලැයිස්තුවලින් ඉවත් වන්නේ කොහොමද කියා සොයා බලා ඒ අන්දමේ අයුතු දේ කරන ග්‍රාම සේවක නිලධාරීන්ට දඬුවම් කළ යුතුයි.

ගරු කථානායකතුමනි, මැද කොළඹ තුන්වැනි මන්ත්‍රීතුමා කථා කරන විට නම් බොහොම ලක්ෂණයි. එහෙත්, පසුගිය 23 වැනි දා රාත්‍රී එළිවන තුරු එතුමා ටෝච් ලයිට් එකකුත් අරගෙන බලංගොඩ කළේ මොකක්ද කියා මා අහනවා. එපමණක් නොවෙයි. හදිසියේ තරම කොපමණද කියනවා නම්, එක්තරා තානායමකදී යම් කිසි පුද්ගලයකුට දුර කථනයෙන් කථා කොට පණිවුඩයක් දුන්නා "මම තරුණයින් 50 ක් ගෙනැවිත් සිටිනවා, ඒ අය යම් යම් ස්ථානවලට යවන්නට ඕනෑ, ඒ සඳහා වාහන එවන්න" කියා. මේ තරුණයින් ගෙනාවේ කොහෙන්ද, මොනවාටද, කියන එකයි ප්‍රශ්නය. ඡන්ද ලැයිස්තු පිළියෙළ කරන තැන සිට ඡන්ද ගණන් කරන තැන දක්වාම මෙන්න මේ විධියේ අසාධාරණ දේවල් සිදු වෙනව. ඡන්ද ගණන් කිරීම නම් සාධාරණව සිදු වෙනව. විශේෂයෙන්ම අසාධාරණ අයුතු දෑ සිදු වන්නේ රැස්වීම් තැබිය හැකි අන්තිම දිනයත් මැතිවරණ දිනයත් අතර දවසේදීයි. ඒ දිනයේදී නොයෙකුත් අසාධාරණ දේවල් හා අයුතු බලපෑම් සිදු වෙනව. ඒ නිසා මින් ඉදිරියට එවැනි දේ ඇති නොවන පරිදි මැතිවරණ කොමසාරිස් තුමා වගබලාගත යුතුවාක් මෙන්ම එවැනි අයුතු බලපෑම් නැති කිරීමට අවශ්‍ය නීතිරීති සම්පාදනය කළ යුතුව තිබෙනව. එපමණයි මා කියන්නෙ.

අ. භා. 5.58

**එස්. කේ. කේ. සූරියාරච්චි මයා.** (මහර)
*(திரு. எஸ். கே. கே. சூரியாரச்சி—மஹற)*
(Mr. S. K. K. Suriarachchi—Mahara)

ගරු කථානායකතුමනි, මැතිවරණ නීති සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත් කරන්නට අදහස් කරන මේ අවස්ථාවේදී වැදගත් කරුණු කීපයක් මතක් කර දීමට ඔබතුමාගේ අවසරය ඉල්ලනවා. අපි මේ කමිටුවෙන් බලාපොරොත්තු වන්නේ පසුගිය මහ මැතිවරණයේදීත්, ඊයේ පෙරේදා ඇතිවූ අතුරු මැතිවරණවලදීත් ලත් අත් දැකීම් සහ මහ මැතිවරණය පිළිබඳව මැතිවරණ කොමසාරිස්තුමා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ අන්තර්ගත කරුණු සොයා බලා නීතිය සංශොධනය කිරීමයි. ඒ අනුව දැන් දෙපක්ෂයෙන්ම ඉතා ප්‍රයෝජනවත් කරුණු රාශියක් ඉදිරිපත් වුණා. ඒ කරුණු අපේ සැළකිල්ලට භාජන විය යුතුයි.

ගරු කථානායතුමනි, මෙය ආණ්ඩු පක්ෂයට ලැබුණු වෙස් වලාගත් ආශිර්වාදයක්ය කියා මා හිතනව. මා එසේ කියන්නේ මෙන්න මේ නිසයි. මේ රජය පසුගිය 25 වැනි දා සිට ආණ්ඩු පක්ෂය පරාද වුණේ ඇයි කියන ප්‍රශ්නයට පිළිතුරු සොයමින් පර්යේෂණ පවත්වමින් සිටියා. ඒ පිළිබඳව කරුණු පුවත්පත් මඟින් හා වෙනත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාක්ෂිකයින් මගින් සොයමින් සිටි අවධියක මේ විවාදය නිසා හදිසියෙන් ලැබුණු මේ වරප්‍රසාදය ආණ්ඩුවට ලැබුණු වෙස් වලාගත් ආශිර්වාදයක්'ය කියා මා හිතනව. ආණ්ඩු පක්ෂයේ අපේක්ෂකයින් තුන්දෙනාම ඒ ආසන තුනෙන්ම පැරදීමට හේතුව දැන් මේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් විසින් විග්‍රහ කරදීම ඒ වරප්‍රසාදයය කියා මා කියනව.

1966 අංක 20 දරණ සැසි වාර්තාවෙහි මෙසේ සඳහන් වෙනවා. මේ සැසි වාතීාව නිකුත් කර තිබෙන්නේ 1965 මාර්තු මාසයේ පැවැත්වුණු මහා මැතිවරණය පිළිබඳවයි.

(1) (ඒ) යම් කාල සීමාවක් තුළ පදිංචිව සිටීම වෙනුවට එක්තරා නියමිත දිනයකදී (එනම්, ඕනෑම අවුරුද්දක ජූනි 1 වැනි දින) සාමාන්‍යයෙන් පදිංචිව සිටීම, ඡන්ද හිමියකුගේ නේවාසික සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් හැටියට විග්‍රහ කෙරෙමින් ඡන්දදායකයන් ලියාපදිංචි කිරීම පහසු සහ වඩාත් නිවැරදි කිරීම ;

1964 අංක 10 දරණ ලංකා පාර්ලිමේන්තු මැතිවරණ සංශෝධන පනතින් කර ඇති එක සංශෝධනයක් ගැනයි, මේ සඳහන් කර තිබෙන්නේ. ඡන්දදායකයකු ලියා පදිංචි කිරීම සඳහා ඇති විය යුතු සුදුසුකම් 1964 සංශෝධනයෙන් අප තවදුරටත් ලිහිල් කළා. නමුත් මේ සංශෝධනය ගැන මේ රටේ මහජනයා දන්නේ නැහැ. තමන් ඡන්දදායකයකු වශයෙන් ලියා පදිංචිවීම සඳහා තිබිය යුත්තේ කෙබඳු සුදුසුකම් දැයි මහජනයා හරියාකාර ලෙස නොදැනීම මැතිවරණ දෙපාර්තමේන්තුවේ සැලකිල්ලට භාජනය විය යුතුයි. මේ සංශෝධනය පිළිබඳව මහජනයාට සෑහෙන අවබෝධයක් ලබා දිය යුතුයි. ඉහත සඳහන් කොටස උපුටා කියවන ලද්දේත් ඒ නිසායි.

ගරු කථානායකතුමනි, 1965 මාර්තු මාසයේ පැවැත්වුණු මහා මැතිවරණයෙන් පසුව දැන් දෙවතාවක්ම මැතිවරණ ලැයිස්තු සංශෝධනය කර තිබෙනවා. මා දන්නා හැටියට ඡන්දදායක නාම ලේඛනය සහතික කරන්නේ සෑම අවුරුද්දේම මැයි මාසයේ අවසානයේදීයි. එසේ නම් 1965 මාර්තු මැතිවරණය පවත්වා තිබෙන්නේ 1964 මැයි මාසයේ 31 වැනිදා සහතික කරන ලද ඡන්ද ලැයිස්තු අනුවයි. මීට පසුව 1965 මැයි මාසයේ 31 වැනිදා සංශෝධන මැතිවරණ ලැයිස්තුවක් සහතික කරන ලද අතර 1966 මැයි මස 31 වැනිදා අලුත්ම මැතිවරණ සංශෝධන ලැයිස්තුව සහතික කර තිබෙනවා. මෑතකදී අතුරු මැතිවරණ ඇති වුණේ අලුත්ම සංශෝධන මැතිවරණ ලැයිස්තු අනුවයි. මේ අවස්ථාවේදී බෙන්තර--ඇල්පිටිය කොට්ඨාශයේදී මට ලැබුණු අත්දැකීමක් ගැන සඳහන් කරන්නට කැමතියි. ඒ කොට්ඨාශයෙහි තුන්දුව නමැති ගමේ ඡන්දදායකයන් 32 ට පසුගිය අතුරු මැතිවරණයේදී ඡන්දය අහිමි වී තිබුණා. ඒ අය අපේ අපෙක්ෂකයාට ප්‍රබල අන්දමින් වැඩ කළ අයයි. 1965 මාර්තු මහා මැතිවරණයේදී ඡන්දය පාවිච්චි කළ ඒ 32ට මේ වර ඡන්ද පාවිච්චි කරන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ වගේම අවුරුදු 18 සම්පූර්ණ නොවූ එක්සත් ජාතික පක්ෂයට ලැදිකම් දක්වන තරුණ තරුණියන් රාශියක් අළුතෙන් ලියාපදිංචි කර තිබෙන බව ඒ ප්‍රදේශයේ අපේ සංවිධායකයන් ඡන්ද ලැයිස්තුවල සටහන් කොට අපට පෙන්වා දුන්නා. තුන්දුව ගමේ පමණක් නොව සෑම ගමකම වාගේ තත්ත්වය ඔකයි. සෑම ගමකම වාගේ අපට පක්ෂපාත ඡන්දදායකයන් 25-50 අතර ගණනකට මේ වර ඡන්දය අහිමි වුණු අතර එක්සත් ජාතික පක්ෂයට හිතවත් වූ අය ඒ තරම් ප්‍රමාණයක් අලුතෙන් ලියාපදිංචි කර තිබෙනවා.

මේ කාරණයට තවත් නිදසුනක් වශයෙන් මා නියෝජනය කරන කොට්ඨාශය ගැනත් සඳහන් කරන්නට පුළුවනි. දැන් ඡන්දදායක නාම ලේඛනය සංශෝධනය කරගෙන යනවා. එසේ සංශෝධනය කිරීමේදී ග්‍රාම සේවක මහතුන් කියා තිබෙන්නේ සතියේ දින හතම ගෙදර නිදා නොගන්නා අයගේ නම් ඡන්ද ලැයිස්තුවෙන් කපා දමන ලෙසටයි. මහර කොට්ඨාශය පිහිටා ඇත්තේ කොළඹට නුදුරුවයි. ඒ ප්‍රදේශයේ උදවිය සැතපුම් දහයක් දොළහක් මඟ ගෙවා කොළඹ රැකියාවලට එනවා. කොළඹ රැකියාවල යෙදී සිටින විට ඒ සමහර අයට සතියකට දින තුන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සූරියආරච්චි මයා.]

හතරක් කොළඹ නතර වන්නට සිදු වෙනවා. අනික් දවස් ටික ගත කරන්නේ තමන්ගේ ගෙදරයි. අලුත් තත්වය අනුව එවැනි අයට මහර කොට්ඨාශයෙහි ඡන්ද බලය අහිමි වෙනවා. ග්‍රාම සේවක නිලධාරීන්ට මේ විධියට උපදෙස් දී තිබීම නිසා අපේ ඡන්දදායකයින්ගෙ නම් රාසියක් ඡන්ද ලැයිස්තුවලින් ඉවත් වී තිබෙන බවට මට පැමිණිලි ලැබී තිබෙනව. ග්‍රාම සේවකයින්ට මේ පිළිවෙළට උපදෙස් දී තිබෙනවදැයි මම කොළඹ දිස්ත්‍රික්කයේ මැතිවරණ කොමසාරිස්තුමාගෙන් ඇහුව. තමන් විසින් එවැනි උපදේශයක් දී නැති බව සහකාර මැතිවරණ කොමසාරිස්තුමා මට ලියා එවා තියෙනව. නමුත් ග්‍රාම සේවකයින්ට එවැනි උපදෙස් ලැබී තිබෙන බවට සාක්ෂි වශයෙන් ග්‍රාම සේවක මහත්වරුන්ම ඉදිරිපත් කරන්න මට පුළුවනි. ඔවුන්ට එය ලැබී තිබෙන්නෙ ඊළඟට සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරියා වන ආදායම් පාලක නිලධාරීන් ගෙනුයි. ඊට සාක්ෂි වශයෙන් ග්‍රාම සේවක මහත්වරුන්ම ඉදිරිපත් කරන්න පුළුවනි. ග්‍රාම සේවක මහත්වරුන් අවංක සේවයක් කරන්න උත්සාහ කරන නිසා මම ඒ අයට චෝදනා කරන්නෙ නෑ. ඉහළින් ලැබෙන අණක් ක්‍රියාත්මක නොකර සිටින්න ඔවුන්ට පුළුවන්කමක් නෑ. රාජකාරිය පැහැර හැරියාය යන චෝදනාව උඩ නොයෙකුත් දඬුවම් විඳින්න සිදුවේය යන බියෙන්, ග්‍රාම සේවක මහත්වරුන්, ඔවුන්ට ඉහළින් ලැබෙන ඕනෑම නියෝගයක් ක්‍රියාත්මක කරනව. මේ උදවිය මැතිවරණ නීතිරීති දන්නෙ නෑ. ඡන්දදායකයන් ලියා පදිංචි කිරීමේ නීතිරීති ගැන ඔවුන්ට දැනීමක් නෑ. ඩී.ආර්.ඕ. කෙනෙක් හෝ මැතිවරණ නිලධාරියෙක් හෝ මන්ත්‍රී ධුරාපේක්ෂකයගෙ නම පවා ඡන්ද ලැයිස්තුවෙන් කපා හරින ලෙස ග්‍රාම සේවකයකුට නියම කළොත් ඔහු එය ඉෂ්ට කරනව. මේව ගැන ඉහළ තැන්වලින් ඇසූ විට කියන්නෙ ඒ විධියේ උපදෙස් නොදුන් බවයි. උප කොමසාරිස්තුමා කියන්නෙත් එහෙම උපදෙසක් දී නැති බවයි. නමුත් ග්‍රාම සේවක මහත්මයගෙන් ඇහුවහම ඔහු කියන්නෙ තමාට එවැනි උපදෙස් ලැබී තිබෙන බවයි. මගේ ඡන්දදායකයන් සිය ගණනාවකගෙ නම් මේ විධියට කපා හැර තිබෙනව. මැතිවරණ උප කොමසාරිස්තුමාගෙ උපදෙස් අනුව එම නම් නැවත ඡන්ද ලැයිස්තුවලට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගන්නව.

ඡන්දදායක නාම ලේඛන සම්බන්ධයෙන් තවත් වරදක් සිදු වෙනව. යම් ඡන්දදායකයෙකුගෙ නම ඉවත් කරන්න ඕනෑ වුණහම ග්‍රාම සේවක නිලධාරීන් ගොස් පරීක්ෂා කර බලා ඒ තැනැත්තා ගම නැත කියා හෝ වෙන යම් කරුණක් දක්වා හෝ ආදායම් පාලක නිලධාරිතුමාට වාර්තාවක් ඉදිරිපත් කරනව. එතුමා ඒ නම ඡන්ද ලැයිස්තුවෙන් ඉවත් කළයුතු නමක් හැටියට ප්‍රදේශයේ දිසාපතිතුමාට ඉදිරිපත් කරනව. ඊළඟට දිසාපතිතුමා, "ඔබගේ නම "අ" ලැයිස්තුවට ඇතුළත් කරන ලදි" යනුවෙන් සඳහන් ලියුමක් අර ඡන්දදායකයාට යවනව. වෙන කිසිම දෙයක් ඒ ලියුමෙ සඳහන් වන්නෙ නෑ. ඒ ලියුම ඡන්දදායකයට යවන්නෙත් ලියාපදිංචි කළ තැපෑලෙන් නොව සාමාන්‍ය තැපෑලෙනුයි. මේ ලියුම ලැබුණහම ඡන්දදායකයා කල්පනා කරන්නෙ, "අ" ලැයිස්තුවෙ බැරිනම් "උ" ලැයිස්තුවෙ නම තිබුණත් කමක් නෑ මට ඡන්දෙ තියෙනව නම් කියායි. ඔහුගෙ නම අස් කිරීමට යෝජනා කර තිබෙන බවක් මේ ලියුමෙ සඳහන් නොවන නිසා ඡන්දදායකය අර විදියට කල්පනා කර නිශ්ශබ්දව ඉන්නව. ඔය කියන "අ" ලැයිස්තුව බලන්න කච්චේරියට යන්න ගම්බද මිනිස්සු මහන්සි වෙන්නෙ නෑ. මේ ලියුම් සාමාන්‍ය තැපෑලෙන් යන නිසා සංවිධානය වුණ කණ්ඩායමකට ඒව තැපැල් කන්තෝරුවෙදි හොරකම් කර ගන්නත් පුළුවන්කම තියෙනව. තමාගෙ නම ඡන්දදායක නාම ලේඛනයෙන් අස් කිරීම නිසා තමාට ඡන්දය අහිමි වුණු බව, ඊට විරුද්ධත්වය දක්වීමේ කාල සීමාව ඉක්ම යන තුරුම ඡන්දදායකය දන්නෙ නෑ. ඒ කාල සීමාව ඉක්ම යන්න කලින් ඊට විරුද්ධත්වය දක්වීමේ ලියවිලි ඉදිරිපත් කළයුතු බවක් ඔහු දන්නෙත් නෑ. මේ පිළිවෙළට, අපට පක්ෂ ඡන්දදායකයින්ගෙ නම් ඉවත් කරමින් එක්සත් ජාතික පක්ෂයට හිතවත් අයගෙ නම් ඇතුළත් කිරීමේ රහසිගත ව්‍යාපාරයක් ගෙන යන බව මගේ කොට්ඨාශයෙන් ඔප්පු වී තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඡන්දදායක නාම ලේඛනවලින් නම් ඉවත් කිරීමේ මේ රහසිගත ව්‍යාපාරය සම්බන්ධයෙන් උදාහරණයක් වශයෙන් එක් කරුණක් මට පෙන්වා දෙන්න පුළුවනි. බෙන්තර-ඇල්පිටිය ඡන්දදායක කොට්ඨාශයෙන් දිනූ අපේක්ෂකයගෙ වැඩි ඡන්ද ගණන 1,677යි. මේ කොට්ඨාශයට ගම් 58ක් තිබෙනව. දවස් 7ම ගෙදර නිදා හිටියෙ නැත කියා හෝ වෙන යම් කරුණක් කියා හෝ එක් ගමකින් අපට පක්ෂ ඡන්දදායකයින්ගෙ නම් 15 බැගින් කපා හැර, අනෙක් පැත්තට පක්ෂ අඩු වයස්කාරයින් 15දෙනා බැගින් ලියා පදිංචි කළොත් එක ගමකින් වෙනස 30ක් වෙනව. එතකොට ගම් 58 වෙනස 1740 ක් වෙනව. ඊළඟ ඡන්දයේදී අපේ මන්ත්‍රීතුමා දිනයිද, පරදියිද කියා එයින් පෙනෙනව. ඒ ඉලක්කම් අනුව බලන විට පෙනෙන තත්ත්වය. නමුත් බෙන්තර-ඇල්පිටිය ජනතාව ගැන අපි දන්නව. වැඩි ඡන්ද 1,677 කින් තමයි ජයග්‍රහණය කළේ. නමුත් විශාල ඡන්දදායකයින් සංඛ්‍යාවකට නොයෙක් නොයෙක් තර්ජන ගර්ජන නිසා ඡන්දය පාවිච්චි කරන්න බැරි වුණා. ඒ සමගම පසුගිය මහා මැතිවරණයෙන් පසු ගම් රටවල් අත්හැර බොහොම ඈත ප්‍රදේශවල පදිංචියට ගොස් සිටින විශාල සංඛ්‍යාවකටත් මිල මුදල් නොමැතිකම ආදී කරුණු නිසා ඡන්දය දෙන්න ආපසු ඡන්ද කොට්ඨාශයට එන්න නොහැකි වුණා. ඔය ආදී කරුණු නිසයි වැඩි ඡන්ද ගණන 1,677 ක් පමණක් වූයේ. මා කලින් සඳහන් කළ බාධක නොතිබුණා නම්, ඡන්දය දීමට නොහැකිවූ ඡන්දදායකයිනුත් පැමිණියා නම් වැඩි ඡන්ද 5,000 කින් අපට ජයග්‍රහණය කරන්ට තිබුණා.

ගරු කථානායකතුමනි, අපේ පැත්තෙන් ඡන්ද කපා දමන අතර අනෙක් පැත්තට ඡන්ද එකතු කිරීමේ සූක්ෂම වැඩ පිළිවෙළක් ගෙන යන බව මා කලින් සඳහන් කළා. ඒ වැඩ පිළිවෙළ අනුව ගමක් පාසා ඡන්ද 30 ක වෙනසක් ඇති වුණොත් ගම් 58ක් තිබෙන බෙන්තර-ඇල්පිටිය වැනි ඡන්ද කොට්ඨාශයක ඡන්ද 1,740 ක වෙනසක් ඇති වෙනව. ඒ අන්දමේ සූක්ෂම වැඩ පිළිවෙළක් අනුව ආසන දිනා ගැනීමේ උපක්‍රමයක් ගෙන යන බව පසුගිය අතුරු මැතිවරණයේදී ඡන්ද ලැයිස්තු අරගෙන ගමක් ගමක් පාසා යමින් මැතිවරණ කටයුතුවල යෙදුණු අපට පැහැදිලිවම පෙනී ගියා. එමනිසා ලංකාව පුරාම සිටින ප්‍රගතිශීලී ජනතාවට මේ අවස්ථාවේදී මා අනතුරු හැඟවීමක්, මේ කරන්නෙ. ලබන දෙසැම්බර් 1 වැනිදා සිට 31 වැනිදා දක්වා කච්චේරියෙන් හෝ වේවා ආදායම් පාලක කාර්යාලවලින් හෝ වේවා පළාත් පාලන ආයතනවලින් හෝ වේවා ප්‍රදර්ශනය කරන ඡන්ද ලැයිස්තුවල තමන්ගේ නම් ලියා පදිංචි වී තිබෙනවාද කියා සොයා බලන ලෙස ලංකාව පුරාම සිටින ප්‍රගතිශීලී ජනතාවට ආයාචනය කරනවා.

ගරු කථානායකතුමනි, මේ අතුරු මැතිවරණයේදී වූ නොයෙක් අයුතු බලපෑම්, දූෂණකම් රාශියක් මේ කමිටුවේ සැලකිල්ලට භාජනය කරවීමේ චේතනාවෙන් මෙහිදී ඉදිරිපත් කරන්ට යෙදුණා. බෙන්තර-ඇල්පිටිය ඡන්දදායක කොට්ඨාශයේ මැතිවරණ කටයුතුවල යෙදුණු මා කොයි තරම් අශෝභන සිද්ධීන් ඇති වුණාද කියා පෞද්ගලිකව දන්නව. ඇත්ත වශයෙන්ම සමහර අවස්ථාවලදී මේ ලංකාවද නැත්නම් තවත් කොන්ගෝවක්ද කියා මට සිතුණා. ලුමුම්බා අගමැතිතුමා මරා දමූ දිනයේ සිට මැතිවරණ කටයුතු පිළිබඳව ලෝකයේම තිබෙන ම්ලේච්ඡ රට කොන්ගෝවය කියා මා තුළ හැඟීමක් තිබුණා. එහෙත් පසුගිය අතුරු මැතිවරණයේදී බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයේ වූ සමහර සිද්ධීන් ගැන බලන විට මේ ලංකාව ඇත්ත වශයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී රජයකින් පාලනය වන රටක්ද එහෙම නැත්නම් ම්ලේච්ඡ යුගයේ පාලනයක් පවතින රටක්ද කියා මට සිතුණා. ඒ ප්‍රදේශය භාර ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා හැටියට කටයුතු කළේ අපේ සෞඛ්‍ය ඇමතිතුමායි. එතුමා සාමකාමී කෙනෙක්. අපට ආරංචි හැටියට එතුමා ශිෂ්ට සම්පන්නව මැතිවරණ කටයුතු ගෙන යන්න උත්සාහ කළාලු. නමුත් එක්තරා ක්‍රමානුකූල සංවිධානයක් ආසන තුනේම සූක්ෂම වැඩ පිළිවෙළක් ගෙන ගියාය කියා අපට දැන් ඔප්පු වී තිබෙනව. ඉහලින් ලැබුනු අනක් අනුව ඒ සූක්ෂම වැඩ පිළිවෙළ 23 වැනිදා රාත්‍රියේ ආසන තුනේම එක මොහොතේම ආරම්භ වූ බව දැන් අපට පෙනෙනව. ඊට සාක්ෂියක් මම ඉදිරිපත් කරන්නම්. 22 වැනිදා වන තුරු අපට අමාරිකකම්වලට මුහුණදෙන්ට වුණේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සූරියාරච්චි මයා.]

නැහැ. සුලු සුලු දූමරිකකම්නම් වුනා තමයි, කෝදුරුවන් මදුරුවන් කෑගහනව වගෙ. අපි ඒව ගණන් ගත්තෙ නැහැ. නමුත් 23 වැනිදා රාත්‍රියෙ වුණේ කුමක්ද? මැතිවරණයකදී ඡන්ද නියෝජිතයින් ඉතාමත්ම අවශ්‍යයි. ඡන්ද නියෝජිතවරුන් කියන්නෙ ඡන්දාපේක්ෂකයා වෙනුවෙන් ඒ ඒ ඡන්ද මධ්‍යස්ථාන භාරව සිටින පුද්ගලයිනුයි. සාමාන්‍යයෙන් ඡන්ද දිනයට පෙර දින රාත්‍රියේ ඡන්ද නියෝජිතවරුන් සියලු දෙනාම රැස් කරවා මැතිවරණ නීති රීති පිළිබඳව ඔවුන්ට උපදෙස් දීම කොයි දේශපාලන පක්ෂයක් වුවත් අනුගමනය කරන සිරිතක්. හොර ඡන්ද අල්ලන්නෙ මෙහෙමයි, විරුද්ධත්වය දක්වන්නෙ මෙහෙමයි, හොර ඡන්දයක් එනව නම් අපි සංඥා කරන්නෙ මෙහෙමයි ආදී වශයෙන් ඡන්ද නියෝජිතවරුන්ට උපදෙස් දෙනව. 23 වැනිදා රාත්‍රියේ අපි ඡන්ද මධ්‍යස්ථාන අටක නියෝජිතවරුන් රැස් කළා. බෙන්තර නගරයේ සීමාව තුළ ඡන්ද නියෝජිතවරුන් අපි ආරච්චිමුල්ල කියන ප්‍රදේශයට කැඳෙව්වා. අප රැස් වුණේ රාත්‍රී 11ට පමණයි. අපේ පැමිණීම ප්‍රමාද වුණා, ස්ථානයෙන් ස්ථානයට යන විට වූ ප්‍රමාද නිසා. සියලුම උපදෙස් දෙන්න අපට ගත වූයේ පැයයි. රාත්‍රී 11 සිට 12 දක්වාවූ පැය තුළ අපි ඡන්ද නියෝජිතවරුන්ට දිය යුතු උපදෙස් සියල්ලම දුන්නා. මැතිවරණ නීති රීති පිළිබඳව අවශ්‍ය උපදෙස් ටයිප් ගසා චක්‍ර ලේඛනයක මාර්ගයෙන් බෙදා දුන්නා. උපදෙස් දීමෙන් පසු ඡන්ද නියෝජිතවරුන්ට ඕනෑම ප්‍රශ්නයක් අසන්නය කියා අපි ඒවාට පිළිතුරුත් දුන්නා. ඒ සියලුම කටයුතු කර අවසාන වී අපි ඡන්ද නියෝජිතවරුන් වාහනවල නංවා රාත්‍රියේ ගෙවල් දොරවල්වලට යැව්වා. ඒ යන විට පොල් කොටන් දමා, කළු ගල් දමා පාර අවහිර කර අපේ වාහන නවත්වා අපේ නියෙජිතයන් එළියට ඇදලා ගන්නට උත්සාහ කළා. වාසනාවකට වගේ අපේ වාහනවල ගමන් ගත්ත පිරිස් නිර්භීත නිසා ඔවුන්ට ඉඩ නොදී වාහන ආපසු හරවාගෙන අප සිටින ස්ථානයට ඇවිත් අපට පැමිණිලි කළා. එවිට දඹදෙනියේ මන්ත්‍රීතුමත් (ආර්. ජී. සේනානායක මයා.) මමත් කිව්වා, මේ තරම් සාමකාමීව මැතිවරණය ගෙන ගොස් අවසාන මොහොතේ පරාජය පෙනුණ නිසා මේ පියවර ගන්නට ආණ්ඩු පක්ෂය තීරණය කර තියෙනවා නම් අපි නීතියේ පිළිසරණ සොයන්නට ඕනෑය, එසේ නැත්නම් අපිත් පෞද්ගලිකව ඒවාට මුහුණ දෙන්නට සූදානම් වෙන්න ඕනෑය කියා. එදා රෑ අපට නින්දක් තිබුණේ නැහැ. දඹදෙනියේ මන්ත්‍රීතුමා කිව්වා, අපි පළමු වැනි පියවර වශයෙන් නීතියේ පිළිසරණ සොයමු කියා. ඒ අනුව එතුමත් මමත් රෑ එකහමාරට හැතැප්ම තිස් ගණනක් ඈත අම්බලන්ගොඩ පොලිසියට ගොස් පැමිණිල්ලක් කළා, එක්සත් ජාතික පක්ෂයේ දාමරිකයන් රාත්‍රියේ පාරේ ඉඳගෙන වාහනවලින් සංචාරය කරමින් යන එන්නන් බිය වද්දනවාය කියා. පොලිසිය වහාම ක්‍රියාත්මක වුණු නිසා ඌරගහ පොලිසියෙනුත්, කොස්ගොඩ පොලිසියෙනුත් වහාම පෙට්රෝල් ආව. මෙන්න මේ අය අපට අවහිර කළාය කියා ඇඟිල්ල දික්කර පෙන්නුවම ඒ අයව පොලිසියට අල්ලාගෙන ගියා. පසුවදා ඒ අයට ඇප දුන්නද, නැද්ද අපි දන්නෙ නැහැ. එදා රෑ එක්සත් ජාතික පක්ෂයට ආධාර කළ පිරිස ජීප් රථවලින් සංචාරය කරමින් අපේ ජීප් එකක් හැතැප්ම දෙකක් මහා පාරේ එළවාගෙන ගියා. හිර භාරයට ගත් අයගේ නම් අන්න පොලිසියේ තියෙනවා, බලන්න පුළුවන්. මම ඒ පොලිස් නිලධාරීන්ට ස්තුතිවන්ත වෙනවා. ඒ අතරම මට සැකයක් ඇති වෙනවා. ඒ පොලිස් නිලධාරීන්ට හිරිහැරයක් වේදෝ කියා, එසේ අපක්ෂපාතව කටයුතු කිරීම නිසා. බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයේ සේවය කළ ඒ පොලිස් නිලධාරීන් බොහෝ දුරට අපක්ෂපාතව වැඩ කළ බව මට කියන්නට පුළුවනි. මල් කළඹ පිදිය යුතු තැනට පුදන්නට අපි ලෑස්තියි. අපට පුදුම හිතෙන්නේ, බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයේ පොලිස් නිලධාරීන් ඒ තරම් සාධාරණව කටයුතු කළා නම්, නීති ගරුකව කටයුතු කළා නම් මේ රටේ නායකයා වන අගමැතිවරයා පෞද්ගලිකව පෙනී සිටි බලන්ගොඩ ප්‍රදේශයේ එසේ නොවුනේ මන්ද කියා—

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

කොහේද නොවුනේ? සම්පූර්ණ අසත්‍යයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සූරියාරච්චි මයා.**
(திரு. சூரியாராச்சி)
(Mr. Suriarachchi)

ඔබතුමා අසත්‍යය කියා කිව්වට අපට සාක්ෂි තිබෙනව. අපි බලාපොරොත්තු වුනා, ඔබතුමා අවසාන දවස බෙන්තර-ඇල්පිටියේ ගත කරාවිය කියා. මහජනයාගේ විශ්වාසයක් තිබුනා, අගමැතිවරයා මධ්‍යස්ථ පුද්ගලයෙක්ය, පක්ෂපාතව වැඩ කරන්නෙ නැත කියා. ඒ අතින් තමුන්නාන්සේ කෙරෙහි සැහෙන විශ්වාසයක් තිබුනා. නමුත් තමුන්නාන්සේ බලන්ගොඩට පෞද්ගලිකව ගොස් සෑම ඡන්ද පොළකටම යෑම නිසා පමණක් නොව පොලිසියේ වැඩ කටයුතුවලට ඇඟිලි ගැසූ බවට පැහැදිලි සාක්ෂි තිබෙන නිසාත් ඒ විශ්වාසය සම්පූර්ණයෙන්ම නැති වී තිබෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

සම්පූර්ණ අසත්‍යයක්.

**සූරියාරච්චි මයා.**
(திரு. சூரியாராச்சி)
(Mr. Suriarachchi)

එතුමා අසත්‍යයක්ය කියා ප්‍රකාශ කරනවා. අපි කියනවා, ඒක සත්‍යයක් බව. තීන්දුව උසාවියෙදි ලැබෙයි, නඩු ඉදිරිපත් වුනාම.

**ගරු ඩඩ්ලි සේනානායක**
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

ඕනෑම උසාවියකට එන්න ලෑස්තියි.

**සූරියාරච්චි මයා.**
(திரு. சூரியாராச்சி)
(Mr. Suriarachchi)

ගරු කථානායකතුමනි, මැතිවරණ නීති පොතේ තුන් වැනි පිටුවේ බී. කොටසේ ධජ පතාක, පෝස්ටර්ස් සහ දැන්වීම් ප්‍රදර්ශනය කිරීම තව දුරටත් තහනම්ය කියා සඳහන් වෙනවා. ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීම කලින් තහනම් කර තිබුනා. 1964දී ඇති වූ සංශෝධනයෙදි පෞද්ගලික ස්ථානවල ප්‍රදර්ශනය කිරීම පවා තහනම් වුනා. ධජ, පතාක, පෝස්ටර්ස් ප්‍රදර්ශනය කිරීම සම්පූර්ණයෙන්ම තහනම්. එසේ තිබෙද්දී අගමැතිතුමාගේ අලංකාර ඡායා රූපය විරූප කරලා එය බෙන්තර-ඇල්පිටියේ මහා පාර අයිනේ සෑම ගෙවල්වලම අලවා තිබුනා. හැබැයි, මහා පාර අයිනේ ගෙවල්වල පමණයි, ඒක අලවා තිබුනේ. මගේ කණගාටුව ඔබතුමා මුළා කිරීම සඳහා, ප්‍රමාණයට වඩා උද්‍යෝගය දක්වන පක්ෂයේ ආධාරකාරයන් ඒ විධියට ක්‍රියා කිරීම ගැනයි. සමහර ගෙවල්වල බලෙන් ඒ පෝස්ටර්ස් ඇලවීම නිසා කවදාවත් අත ලකුණට කතිරය නොගැසූ ඡන්ද දායකයන්ගේ ඡන්දය පවා මේ වර අපට දුන්නා. තමුන්නාන්සෙගෙ දැන ගැනීම සඳහා දැන් පරීක්ෂණයක් කරනව. ඇයි, පරාද වුණේ යන්න සොයාගන්න දැන් නොයෙක් විධියට කණ්ඩායම් වශයෙන් එකතු වී කුළල් කාගන්න හදනව. ඇයි අපෙන් අහන්න එපායැ ? අපෙන් ඇහුවා නම් නියම සත්‍යය පැහැදිලි කර දෙන්න පුළුවනි අපට. නීති විරෝධි අන්දමට කටයුතු කළ නිසා අප පරාජයට පත් වුණාය යන්න තේරුම් ගැනීම වඩානිවැරදියි. ගරු අගමැතිතුමාගේ පින්තූරය මුද්‍රණය කරන ලද කොළ පාට කඩදාසි ඡන්දදායකයන්ගේ වාසස්ථානවල එල්ලා තිබුණා. පක්ෂයේ අය ගරු අගමැතිතුමාගේ පින්තූරය ඡන්දදායකයින්ගේ ගෙවල එල්ලා තිබීම නීතියට පටහැනියි. එය වැරද්දක්. නඩුවක් දමා ඔප්පු කළොත් රුපියල් සියයක දඩයකට යටත් වෙන්න සිදු වන බව පැහැදිලි කර දෙන්න සිදු වුනා. පොලිස් උසාවියෙන් දඩ කන්න සිදුවන විධියේ වැරද්දක් අසුවල් පක්ෂයේ අය කර තිබෙනවය යන්න අහිංසක ඡන්දදායකයන්ට අවබෝධ වුණාම ඒ අය බියට පත් වුණා. කොයි තරම් දුප්පත් වුවත් කවදාවත් නීතියක් කඩ කර උසාවියට නොගිය අහිංසක ගැමි ජනතාව කවදත් නීති ගරුකයි. අපේ රටේ ඉන්න අහිංසක ගැමියා එහෙමයි. නීතිය කඩන්නෙ කොයි පක්ෂයෙන්ද, දාමරිකකම් කරන්නෙ කොයි පක්ෂයෙන්ද, නොපණත්කම් කරන්නෙ කවුරුද යනාදි කරුණු සම්බන්ධව ඡන්දදායකයන් සැලකිලිමත් වුණා. මා වැඩ කළ, මා කථා කළ බෙන්තර-ඇල්පිටිය මැතිවරණ කොට්ඨාශයේ ඇති වූ දේවල් ගැන මට කියන්න පුළුවනි. මැතිවරණ රැස්වීම් පැවැත්වීමට පුළුවන්කම තිබුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සූරියාරච්චි මයා.]

අවසාන දවසේ සිට ආණ්ඩු පක්ෂයේ හිතවතුන් වෙතින් ආරම්භ වූ හිංසාකාරි දාමරික ක්‍රියා නිසා අපේ ඡන්ද සංඛ්‍යාව සීග්‍ර ලෙස—බලාගෙන සිටිද්දී—වැඩි වූ බව සක් සුදක් සේ පැහැදිලියි.

පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද වාර්තාවේ 3 වැනි පිටුවේ (සී) කොටසේ මෙසේ සඳහන් කර තිබෙනව:

(සී) නාමයෝජනා දින සිට මැතිවරණ දිනට පසු දින දක්වා අතර කාලය තුළ පෙරහැරවල් පැවැත්වීම තහනම් කිරීම.

දැන් කාරණය පැහැදිලියි. නාමයෝජනා දින සිට මැතිවරණ දිනට පසු දින දක්වා අතර කාලය තුළ පෙරහැරවල් පැවැත්වීමට ඉඩ නැහැ. එයින් කියැවෙන අන්දමට 24 වැනිදා පමණක් නොව 25 වැනිදා වන තුරුත් පෙරහැර යාම තහනම් බව නීති සංශෝධනයේ තිබෙනව. මැතිවරණය අවසන් වී පසුදා වනතුරුත් පෙරහැරවල් තහනම් වෙනව.

අපට හරි වැඩක් වුණා. ඒ ගැන අපට සාක්ෂ්‍ය තිබෙනව. 22 වැනිදා දේද්දුව කියන ස්ථානයේ රැස්වීමක් තිබුණා, පංච මහා බල වේගයේ මූලිකත්වයෙන් අපේ අපෙක්ෂකයාට ආධාරයක් වශයෙන්. එක්සත් ජාතික පක්ෂයේ අපෙක්ෂකයා ඇතුළු තවත් දාමරික පිරිසක් අර රැස්වීම මර්දනය කිරීමේ පෙළපාළියක් සංවිධානය කර බොහොම දාමරික ලෙස පෙළපාලි ගෙන ගියා. දාමරිකයන් රාශියක් එදා විශේෂයෙන් සංවිධානය වී අර රැස්වීම මැදින් දාමරික අන්දමින් පෙළපාලි ගියා. එය මැතිවරණ නීතියට පටහැනි බව මතක් කර දුන්නා, කැළණියෙන් අපේ ආධාරයට එහි ගොස් සිටි අපේ තරුණයෙක් "ඇයි සහෝදරයා ඔය විධියට පෙළපාලි යාම මැතිවරණ නීතියට විරුද්ධයි නේද" කිව්වා. නාමයෝජනා දින සිට එවැනි පෙරහැර යාම මැතිවරණ නීතියට පටහැනි බව ඒ තරුණයා කියා සිටියා. පෙරහැරේ ගිය එක් තරුණයෙක්—ඔහු සිටියේ සිවිල් ඇඳුමිනුයි—මගේ රක්ෂාව නැති වුණත් මම කණට ගහනවා කියමින් ඉදිරියට පැන්නා. "රක්ෂාව නැති වුණත්" කියන වචන ටික ඇසීමෙන් මේ පුද්ගලයා කවරෙක්දැයි සෝදිසි කිරීමට අපට සිදු වුණා. අපට දැන ගන්න ලැබුණා මේ පුද්ගලයා ලංකා ගුවන් හමුදාවේ සේවය කරන නිලධාරියෙකු බව. ඔහු නිලධාරියෙක්ද එසේ නැතිව සාමාන්‍ය භටයෙක්දැයි කියන්න මා හරියට දන්නෙ නැහැ. එහෙත් ඔහු යූ. කේ. ආතර් පියසිරි නමින් රෝයල් සිලෝන් එයාර් පෝස් හෙවත් ලංකා ගුවන් හමුදාවේ සේවය කරන—නිලධාරියෙක්ද භටයෙක්ද කියන්න දන්නෙ නැහැ—කෙනෙකු බව සෝදිසි කරගෙන යාමේදී අපට දැගන්න ලැබුණා. ඔහු සිවිල් ඇඳුමිනුයි එහි සිටියේ. කොයි හැටි වෙතත් ඔහු බොහොම දරුණු අන්දමිනුත්, දාමරික ලෙසත් හැසුරුණු බව පෙනී ගියා. ඔහු තර්ජනාත්මකව කථා කළා.

කැළණියෙන් පැමිණ සිටි සාමකාමී තරුණයෙක් ඔහුට කථා කර ඇයි සහෝදරයා ඔය විධියට පෙරහැර යාම මැතිවරණ නීතියට විරුද්ධයි නේද යනුවෙන් ඇහුවා. කොස්ගොඩ පොලීසියේ පරීක්ෂකවරයත් මේ සම්බන්ධයෙන් සාක්ෂියි. මේ තරුණයා එතැනදීම පැමිණිලි කළා. ඉන් පසු පොලීසියටත් ගොස් මේ ගැන පැමිණිල්ලක් ඉදිරිපත් කළා. එපමණක් නොව ඒ පැමිණිල්ලේ පිටපතකුත් ලබාගෙන තිබෙනව. ගුවන් හමුදාව, නාවුක හමුදාව, යුද හමුදාව යන මේ ත්‍රිවිධ හමුදාවන්ට අයත් පුද්ගලයන් මෙවැනි කටයුතුවලදී හතර මාසිමට ගණ්නත් තහනම් කර තිබෙන නමුත් සිවිල් ඇඳුමින් සැරසී පැමිණ මෙවැනි පෙළපාළිවලට සහභාගි වෙතොත් අපට මේ රටේ සාධාරණ මැතිවරණයක් බලාපොරොත්තු වන්න කවදාවත් පුළුවන්ද? මේ විධියේදේ කරලත් ජයග්‍රහණය කරන්න බැරිවීමයි පුදුමය. ඒ පිළිවෙළට ජයග්‍රහණය කරන්න පුළුවන් වුණා නම් මේ රටේ කවදාවත් නියම සාධාරණ මැතිවරණයක් ගැන හිතන්නවත් නොලැබෙන්න තිබුණා. පෙරහැරවල් තහනම් කර තිබියදීත් මේ අන්දමට පෙළපාලි ගිය බව පොලීසියේ වාර්තාගතවී තිබෙනව. සාමකාමී මැතිවරණයක් පැවැත්වුණාය කියමින් ගරු අගමැතිතුමා උදන් අනන නිසයි මට මේ අන්දමට එකින් එක සඳහන් කරන්න සිදු වුණේ. ගරු අගමැතිතුමා සාමකාමී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැතිවරණයක් ගැන පුරසාරම් දෙඩූ නිසයි එය එසේ නොවන බව ඔප්පු කිරීමට කරුණු ඉදිරිපත් කරන්න මා කල්පනා කළේ. පසුගිය අතුරු මැතිවරණයේදී මා සිටි ප්‍රදේශය වන කුඩා සීමාව තුළ සිදු වූ දේ කෙරෙහි ඔබතුමාගේ නෙත් යොමු කර බලන්න පුළුවන් නම් ලංකා ඉතිහාසයේ කවදාවත් මේ තරම් භයානක ම්ලේච්ඡ දේවල් නොසිදු වූ බව ඔබතුමාට වැටහෙනු ඇතැයි මා කියනව.

බෙන්තර-අල්පිටිය ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ දේ නිකමට සඳහන් කළ දේවල් නොවෙයි. අපට මුහුණ පෑමට සිදු වූ දේ ගැනයි එතුමා කිව්වෙ. නොයෙක් විධියේ ත්‍රස්තවාදි දේවල් එහි වුණා. ඒ නිසා ඒ ප්‍රදේශයේ මිනිසුන් ඇත්ත වශයෙන්ම තමන්ගේ ගෙවලින් එලියට එන්න පවා බිය වුණා. රැස්වීම් පවත්වා ඒ අයට ඇසෙන සේ කරුණු කියන්න සිදු වුණා. "සහෝදරවරුනි, බිය වෙන්න එපා, දකුණු වියට්නාමයේ දේශප්‍රේමී ජනතාව තමන්ගේ ජීවිත ගැන පවා නොසලකා ඉදිරියට පැමිණ ත්‍රස්තවාදි ක්‍රියා කෙරෙහි තමන්ගේ විරෝධය පළ කරන ආකාරය ගැන කල්පනා කර බලන්නැයි" කියන්නට සිදු වුණා. ඒ අය තමන්ගේ රට වෙනුවෙන් සිය ජීවිත පවා පුද කරන ආකාරය පැහැදිලි කර දෙන්න සිදු වුණා. මහ මග ගමන් කරමින් තමන්ගේ අත කපා සතුරාට එය විසි කර දමා ගසන තරමට එඩිතර වී සටනට ඉදිරිපත් වී ඉන්නවා නම් අපේ ලංකාවේ ජනතාව ඉදිරියට එන්නට බිය වන්නේ මන්දැයි අහන්නට සිදු වුණා. ත්‍රස්තවාදී ක්‍රියාවලට විරුද්ධව සටන් කිරීම සඳහා ගෙවලින් පිටවී එලියට එන්නැයි අප කළ ආයාචනය ඇසූ ජනතාව දහස් ගණනින් කඳු මුදුන්වල සිට අපේ වේදිකාවලට ආවා. ත්‍රස්තවාදී ක්‍රියා වැඩි වන්ට වැඩි වන්ට අපේ තරුණයන්ගේ උද්‍යෝගය දියුණු වුණා. කොයි තරම් ත්‍රස්තවාදී ක්‍රියාවලින් වුවත් ඔවුන් බැඳ තබන්නට එක්සත් ජාතික පක්ෂයට බැරි වුණු නිසා අපි රුහුණු ජනතාවට හිස නමනව. රුහුණු වැසියන් ලංකාවේ ස්වාධීනත්වය තකා සටන් කළ ජාතියකින් පැවත එන පිරිසක් හැටියට අප විශ්වාස කරනව. ඒ මුතුන් මිත්තන් තුළ පැවති නිර්භීතකම හා උද්‍යෝගිමත් භාවය අදත් ඒ ප්‍රදේශයේ තරුණයන්ගේ ලේවල තිබෙන බවට සාක්ෂියක් තමයි, එක්සත් ජාතික පක්ෂයේ ත්‍රස්තවාදී ක්‍රියාවලට විරුද්ධව ඔවුන් තමන්ගේ පැන්සල් කතිරය පාවිච්චි කරන්ට ඉදිරිපත් වීම.

ගරු කථානායකතුමනි, තවත් පුදුමාකාර දෙයක් එක් ඡන්ද ස්ථානයක සිදු වුණා. මැතිවරණ සම්ප්‍රදායට අනුව—ඒක නීතියක්දැයි මා දන්නෙ නැහැ—මැතිවරණය පවත්වන ශාලාවට ඇතුළු වන ගේට්ටුව අසල කිසිවෙකුට රැඳී සිටින්න ඉඩ දෙන්නෙ නැහැ. [බාධා කිරීමක්] ඒක නීතියක්. ඡන්දපොළ පවතින ස්ථානයේ සිට හැතැප්ම 1/4 ක් අතර ඡන්ද හර වන්ටවත් ඉඩක් නැහැ. එහෙත්, බෙන්තර නගරය අසල දෙද්දුව ඡන්ද මධ්‍යස්ථානයේ ගේට්ටුව ළඟ ඇමරිකන් චරපුරුෂයන් දෙදෙනෙක් දෙපස රැකගෙන සිටියා. පසු ගිය මහ මැතිවරණ සමයෙදි අගමැතිතුමා "චීන්නු චීන්නු" කියා කෑ ගැසුව මේ අවස්ථාවේදී ඇමරිකන් චර පුරුෂයන් දෙදෙනෙක් ඒ ස්ථානයෙ රැකගෙන සිටිය. එවිට එහින් සේනානායක මැතිනිය ගිහින් එතැන සිටි පොලිස් නිලධාරීන් ගෙන් ඇසුව, "මේ සුද්දො දෙන්න කවුද ?" කියා. ඒ උදවිය කිව්ව, "ඇමෙරිකන් ශිෂ්‍යයන් දෙදෙනෙක් මැතිවරණය බලන්ට ඇවිල්ල" කියා. එවිට සේනානායක මැතිනිය කිව්ව, "මැතිවරණය බලන්නට ඔතැන ඉන්ට අවසර නැහැ. මැතිවරණය බලන්ට ඕනෑ නම් අපේ රැස්වීම්වලට ඇවිත් බලාගන්න කියන්න. ගේට්ටුව ළඟ රැක ගෙන ඡන්දදායකයන් බය වද්දන්ට ඉඩ දෙන්ට එපා" කියා. පොලීසිය ඔවුන් නෙරපන තුරු එහින් සේනානායක මැතිණිය ඒ ස්ථානයේ ලැගුම් ගත්ත, "මේ දෙදෙනා මෙතැනින් එළවන තුරු මා මෙතැනින් යන්නෙ නැහැ" කියා ඉන් පසු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියකු පැමිණ ඇමෙරිකන්කාරයින් දෙන්න පන්නා දැම්ම. අගමැතිතුමා පසුගිය මැතිවරණ කාලයෙදි මහජනයා භය වැද්දුව, "චීන්නු මා පස්සෙ එනව" කියා. තමුන්නාන්සේට චීන භීතිකා රෝගය වැළඳුණු නිසා රටේ අතැම් ජනයා භය වුණා, අපේ ඩඩ්ලි සේනානායක මැතිතුමා පස්සෙ චීන්නු එනවා, මොකද දන්නෙ නැහැ. කියා. මහා ව්‍යසනයක් එන්නෙ, කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සූරියාරච්චි මයා.]

සමහරු භය වන්ට ඇති. සාමාන්‍ය දවසක නොවෙයි, මැතිවරණ දවසෙදි—තමුන්නාන්සෙ පස්සෙ ආව කියන්නෙ මැතිවරණයට කලින්—පිටිසර ගම්බද ප්‍රදේශයක ඡන්දපොළක විදේශිකයන් දෙදෙනෙකුට ස්වදේශිකයන්ටත් අවසර නැති ස්ථානයක ඉන්ට අවසර දුන්නෙ මොන හේතුවක් උඩද ? [බාධා කිරීමක්] පොලිස් නිලධාරීන් අවසර දීල අපේ බලවත් විරුද්ධත්වය නිසා පසුව ඔවුන් ඉවත් කර ගත්ත. පොලීසිය තමුන්නාන්සෙගෙ නම් තමුන්නාන්සෙ ඒව විමසන්න. තමුන්නාන්සේ මේ ලෝකෙ දෙයක් දන්නෙ නැහැ කියා පොලීසියට ඕනෑ දෙයක් කරන්ට ඉඩ ඇරල සුදන වන්ට පුළුවන් කමක් නැහැ.

ලංගමය මැතිවරණ කාලයේදී ගෙන ගිය ව්‍යාපාර ගැනත් මන්ත්‍රීවරුන් කීප දෙනකු සඳහන් කළා. 22 වැනිදා තමුන්නාන්සේලාගේ පක්ෂයේ අපේක්ෂකයාට ආධාර වශයෙන් දූවමොට්ටාවේ අමරවංශ හාමුදුරුවන් වහන්සේ වැඩම කරවා පැවැත්වූ මහා දේශනාවට ලංගම බස් වලින් ටිකට් නැතුව සෙනග ඇද්ද බව පැහැදිලි ලෙස ඔප්පු කරන්ට අපට සාක්ෂි තිබෙනව. ලැයිස්තුවක් තබාගෙන කොන්දොස්තර ගිහින් " මහත්මයා දැන් 50 ක් ගෙනාව, සල්ලි" කියා අත දික් කරන විට, ඔහු කිව්වා, " සල්ලිවල ප්‍රශ්නයක් නැහැ මිනිහො. හැන්දෑවට ඇද්ද ගණන කියාපන්. පාර අයිනෙ ඉන්න ඕනෑ කෙනෙක් දාගෙන වරෙන් " කියල. ටිකට් නොකඩවා ටිකට් පොතේ පිටුපස්සෙ ඉලක්කම් ලියා ගෙන සෙනග ඇද්ද බව ඔප්පු කරන්ට අපට සාක්ෂි තිබෙනව. තවත් බස් එකක, බස් ගාස්තුව ගෙව්වෙ ගමන් කළ උදවිය නොවෙයි. එක්සත් ජාතික පක්ෂයේ කාර්යාලය මගිනුයි. මා කලින් සඳහන් කළ බස් එකේ එක ටිකට් එකක්වත් කැඩුවේ නැහැ. පසුව ටිකට් 10 ක් 15 ක් කඩල වීසි කළාදැයි දන්නෙ නැහැ. ටිකට් නොකඩ සෙනග ඇදල ගණන කියල සල්ලි ඉල්ලුවාම කිව්වෙ, ඔක්කොම ගණන එකතු කරල හැන්දෑවට කියන්න කියලයි. මේ පිළිවෙළට රජයේ මහජන සංයුක්ත මණ්ඩලයක් වාහන වැරදි විධියට පාවිච්චි කළා.

එපමණක් නොවෙයි, මේ නීති සංශෝධනය කිරීමේදි පරිස්සම් විය යුතු තවත් කාරණයක් තිබෙනව. අපි මේ නීතිවල අඩංගු කර තිබෙනව. යම්කිසි පූජනීය ස්ථානයක සිට මැතිවරණ කටයුතුවල යෙදීම තහනම් බව. තම දායකයන් කෙරෙහි, තම ආගම අදහන්නන් කෙරෙහි, එක්තරා ප්‍රමාණයකට බලපෑම් කරන්ට පූජකවරුන්ට පුළුවන්. ඒ බලය අයුතු ලෙස පාවිච්චි කරයි කියලයි, අපි පූජනීය ස්ථානවල ඉඳ ගෙන මැතිවරණ කටයුතු කිරීම තහනම් කර තිබෙන්නෙ.

ඊට වඩා භයානකයි අද තිබෙන තත්ත්වය. අපි දන්නව, අධ්‍යාපන උප ඇමතිතුමා දිවතුර වත්තේ සුපිරින්ටෙන්ඩන්ට් බංගලාවේ නැවතී සිටි බව. ඒ ප්‍රදේශයේ සෑම ලොකු වත්තකම තමුන්නාන්සෙලාගෙ පක්ෂය රැස්වීම් පැවැත්වූයෙ කොහොමද? වත්තෙ තිබෙන ලොරි ටික ගම්වලට අරිනව. හරක් පටවන්න වගෙ ඡන්දදායකයන් පටවගෙන ඇවිත් වත්තෙ සුපිරින්ටෙන්ඩන්ට් බංගලාව ළඟ බස්සනව. සුපිරින්ටෙන්ඩන්ට් ඒ අය ඉස්සරහට ගිහින් " සියලු දෙනාම අහවල් පැත්තට ඡන්දෙ දෙන්ට ඕනෑ " කියල කථාවක් පවත්වනව. ආපහු ඒ මිනිසුන් ගෙන ගිහින් බස්සනව. ඔහොමයි. රැස්වීම් පැවැත්තුවෙ. ඒ නිසා—

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
මම ?

**සූරියාරච්චි මයා.**
*(திரு. சூரியாரச்சி)*
(Mr. Suriarachchi)

අපි ඔබතුමාට චෝදනා කළේ නැහැ. ඔබතුමා එහෙ සනීප නැතුව හිටපු බව මම දන්නව. පළාත් පාලන උප ඇමතිතුමා ඒ ගැන වගකියනව ඇති. මම නම දන්නෙ නැහැ, අපේ මහියංගනේ උප ඇමතිතුමා—

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ගල්ළිඳවත්ත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සූරියාරච්චි මයා.**
*(திரு· சூரியாரச்சி)*
(Mr. Suriarachchi)

අන්න හරි, ගල්ළිඳවත්ත. ඔය විදියට හරක් වගේ, වැඩ කරන කම්කරුවන් ගල්ළිඳවත්තට රැස් කළා. අපි රහස් ඔත්තුකාරයන් එහාට ඇර තිබුණ. [බාධාකිරීම්] සෑම තැනකටම රහස් ඔත්තුකාරයන් ඇරිය. අරලියගහ මන්දිරයෙ පවා අපේ රහස් ඔත්තුකාරයන් ඉන්නව. පරෙස්සම් වන්න. මේක සුරංගනා කථාවක් වගෙයි. ඒ රැස් කළ පිරිසට මේ ගොල්ල තේ බෙදාගෙන ගියා. අවාසනාවකට වගේ අපේ තැනැත්තා නිකන් තේ බොන්නෙ නැහැ. සංග්‍රහ කිරීම් තහනම්ලු. ඒකයි මම කියන්නෙ වත්තෙ සුපිරින්ටෙන්ඩන්ට් විසින් කැවුම්, කොකිස්, බිස්කට් ආදි මොනවද කෑමකින් සංග්‍රහ කරල-මොනවයින්ද සංග්‍රහ කළේ කියල මට දැනගන්ට බැරි වුණා-ඊට පසුව නිකන් තේ සංග්‍රහයක් කළා. අවාසනාවකට වගේ අපි ඇරපු ඔත්තුකාරය නිකන් තේ බොන්නෙ නැහැ. එයා කිව්ව, "මට කිරි තේ එකක් ඕනැ" කියල. "කිරි තේ එකක් ?" උප ඇමතිවරුන් දෙපොළක් නිකන් තේ බිව්ව නම් කවුද මේ කිරි තේ ඉල්ලන්නෙ කියල ඒ තැනැත්තගෙ මූණ දිහා බැලුව. "උඹ 'ඇත්ත' පත්‍රයෙන් ආපු ඔත්තුකාරය නේද ?" කියල අහල ඒ තැනැත්තාව මරන්න ලෑස්ති වුණා. ඒ තැනැත්තා කිව්ව, "ඔව්, මම විරුද්ධ පක්ෂයෙ කෙනෙක් තමයි. මෙ තැන රැස්වීමක් තිබෙන නිසා මොකද වෙන්නෙ කියල බලන්න මම ආව" කියා. මේ තැනැත්තට එතැනින් යන්න කිව්ව. ඔහු යනකොටම මහියංගනේ උප ඇමතිතුමා—මම දන්නෙ නැහැ. අමාත්‍යාංශය මොකක්ද කියල—ඇවිත් කිව්ව, "ඕක විතරක් නොවෙයි, තවත් ඉන්න පුළුවන්, හොයාපියව්, හොයාපියව්" කියා. සෑම තේ පඳුරක් ගානෙම හොයන්ට පටන් ගත්ත. අපි 4 දෙනෙක් ඇරල තිබිය. 4 දෙනාගෙන් එක මිනිහයි ඉදිරිපත් වුණේ. අනිත් 3 දෙනා රැස්වීම වාර්තා කරගෙන ඇව.

**ජයසූරිය මයා.**
*(திரு· ஜயசூரிய)*
(Mr. Jayasuriya)

මහියංගනේ උප ඇමතිතුමා පළාතකටවත් ආවෙ නැහැ.

**සූරියාරච්චි මයා.**
*(திரு· சூரியாரச்சி)*
(Mr. Suriarachchi)

මහියංගනේ උප ඇමතිතුමා කියන්නෙ, සෙනෙවිරත්න උප ඇමතිතුමා.

**ජයසූරිය මයා.**
*(திரு· ஜயசூரிய)*
(Mr. Jayasuriya)

එතුමා පළාතකටවත් ආවෙ නැහැ. ඔන්න තමුන්නාන්සෙල කියන පට්ටපල් බොරු එතැනින්ම අහු වුණා. [බාධාකිරීම්]

**සූරියාරච්චි මයා.**
*(திரு· சூரியாரச்சி)*
(Mr. Suriarachchi)

මම නම දන්නෙ නැහැ කියල කලින්ම කිව්ව. විජේපාල මැන්ඩිස් උප ඇමතිතුමා, ප්‍රේමදාස උප ඇමතිතුමා. [බාධාකිරීම්]

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

බොරුකාරයො.

**සූරියාරච්චි මයා.**
*(திரு· சூரியாரச்சி)*
(Mr. Suriarachchi)

කථානායකතුමනි, මගේ වැරැද්ද මා නිවැරදි කළා. [බාධා කිරීම්] ඒ ඇමතිවරු තේ පැනින් සංග්‍රහ කරල, ගල්ළිඳවත්තෙ මැතිවරණ රැස්වීම් සංවිධානය කළා. අග මැතිතුමා——

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මම ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සූරියාරච්චි මයා.**

*(திரு. சூரியாரச்சி)*

(Mr. Suriarachchi)

තමුන්නාන්සෙටයි පැමිණිලි කරන්නෙ. තමුන්නාන්සෙ ඒක කරන්ට ගියේ නැහැ. [බාධාකිරීම්]

පත් කළ විශේෂ කමිටුවේ සැළකිල්ලට භාජන විය යුතු ඉතා වැදගත් කාරණයක් තිබෙනවා. මැතිවරණ කාලෙ රැස්වීම් තබන්ට, අපි පොලිසියෙන් අවසර ගන්නව. මොකද, "ලවුඩ්ස්පීකර්"—එහෙම නැත්නම්, ශබ්දවාහිනී යන්ත්‍ර—පාවිච්චි කරන්ට ඕනැ නිසා. මැතිවරණ කාලෙ බෙන්තර—ඇල්පිටිය ප්‍රදේශයෙ ප්‍රසිද්ධ ස්ථානවල රැස්වීම් තබන්ට බලපත්‍ර ගන්ට බොහොම අමාරු වුණා. අද, හෙට, අනිද්ද, ආදි වශයෙන් දිනපතාම මුළු මාසය සඳහාම එක්සත් ජාතික පක්ෂය ඒ ස්ථාන නම් කර බලපත්‍ර අරගෙන. අපේ විපක්ෂ නායිකාව බණ්ඩාරවෙල රැස්වීම අමතන්ට එන විට තුන් පොළකට වේදිකාව කඩා ගෙන යන්ට සිද්ධ වී තිබුණා. එක තැන කට බලපත්‍රය දුන්නට පස්සෙ එය අවලංගු කළා. එතැනින් කඩාගෙන තව තැනකට ගියා. ඊළඟට එතැනින් කඩාගෙන තවත් තැනකට ගියා. ඔය ආදි වශයෙන් තුන් පොළකට යන්ට සිදු වුණා. මහ වැස්සෙ තෙමි තෙමි එතුමියට සැතපුම් කාලක් විතර පයින් යන්ට පවා සිදු වුණා. රැස්වීම් සඳහා බලපත්‍ර දීමෙදි එක්තරා පිළිවෙළකට අනුව කටයුතු කරන්ට වුවමනායි. හිතුවක්කාර විධියට ඉඩම් කාරයින්ගෙන් ලියවිලි අර ගෙන ගිහින් [බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, අපි මැතිවරණ ගණනාවකට මුහුණ දී තිබෙනව. මේවර බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයෙ අළුත් නීතියක් පතවා තිබුණා අපි එම ආසනය පුරාම සිටින ඉඩම් හිමියන්ගෙන් ලියුම් රැගෙන ආව රැස්වීම් පවත්වන්න බලපත්‍ර ගැනීම සඳහා. මෙම ලියුම් එකතු කරන්න දින 2 ක් ගියා. ඒව අරගෙන පොලීසියට ගියාට පස්සෙ මොකද කීවෙ? එම ඉඩම් ඒ උදවියට අයිති බවට ග්‍රාම සේවක මහතාගෙන් අත්සන් සහිත ලිපියක් ගෙන එන්නය කීව. අවසන් මොහොතේ හදිසියේ දෙන ලද එම තීරණය නිසා නැවත වතාවක් වාහන අරගෙන යන්ට සිදු වුණා, මුළු මැතිවරණ කොට්ඨාශයෙම ග්‍රාම සේවකයන් සොයන්ට. සමහර ග්‍රාම සේවකයන්—සේරම ග්‍රාම සේවකයන් නොවෙයි, සමහර ග්‍රාම සේවකයන්—අපි එම කාරණය සඳහා එනවාය කියන ආරංචිය උඩ අපට මගහැර ගමින් පිට වී ගියා. ඔවුන්ගෙන් ඇතැම් දෙනා වතු සුපිරින් ටැන්ඩන්ට්වරුන්ගෙ බංගලාවල හංගගෙන ඉඳල තියෙනව. අර අවසර පත්‍රය ලබා ගැනීමෙ ලියවිල්ලට අත්සත් කරන්ට සිදු වෙනවටයි එසේ කළේ. අපි මේ ගැන පොලිස්පති වරයට කීව, "බලපත්‍ර දීමෙ නීති රීති වැරදි විදියට ක්‍රියාත්මක කරන වය; ග්‍රාම සේවකයන්ගෙන් ලියුම් ගෙන එන්ටය කියා හදිසියේ නියම කිරීම උඩ අපට අනවශ්‍ය කරදරවලට මුහුණ පාන්න සිදු වුණා ය කියා අපි කිව්ව. ඒ ආකාරයට අපේ බලපත්‍ර ප්‍රමාද කළාට මොකද එක්සත් ජාතික පක්ෂයෙ රැස්වීම් සඳහා සෑම ගමකටම බලපත්‍ර දී තිබුණා. ඒ මුළු කාල සීමාව තුළම ඔවුන් රැස්වීම් ගෙන ගියා. අදත් රැස්වීමක්, හෙටත් රැස්වීමක්, අනිද්දත් රැස්වීමක්, ඉන් අනිද්දත් රැස්වීමක්. ඒ අය දිගටම රැස්වීම් පවත් වන්න බලපත්‍ර අරගෙන.

මට මෙම අවස්ථාවෙ එක්තරා කාරණ යක් මතක් වෙනව. වාඩුවැලිවිටිය කියන ගමේ රැස්වීමක් පවත්වන්න අපට අවසර පත්‍රයක් දී තිබුණා. සවස 2 සිට රාත්‍රී 8 වන තුරු රැස්වීම පවත්වන්නයි එම අවසරය ලැබී තිබුණේ. ඒ අතර එක්සත් ජාතික පක්ෂයට උදේ 10 සිට හැන්දෑවෙ 6 වන තුරු රැස්වීමක් පවත්වන්න අවසර දී තිබුණා. ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයෙත් හොඳ මන්ත්‍රීවරු සිටිනව. අපේ හොඳම හොඳ මන්ත්‍රීවරයකු වන ජාඇළ ගරු මන්ත්‍රීතුමා (ජී. ජේ. පාරිස් පෙරේරා මයා.,) එදා සිටිය දිවිතුරේ වත්තෙ. එතුම සිටියෙ අධ්‍යාපන කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමත් සමගයි. එම පාර්ලිමේන්තු ලේකම්තුමාට බඩ යාමෙ රෝගයක් හැදී සිටින බවකුත් කීව. [බාධා කිරීම්] ටෙලි ෆෝන් එකෙනුයි කීවෙ. ජාඇල ගරු මන්ත්‍රීතුමා ටෙලිෆෝනයෙනුයි කීවෙ. කෙසේ වෙතත් අපි එතුමට කීව, "තමුන් නාන්සෙල උදේ 10 සිට සවස 6 වන තුරු රැස්වීම පවත්වන්න බලපත්‍රයක් ලබා

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ගෙන තිබෙන අතර අපි සවස 2 සිට රාත්‍රී 8 වන තුරු රැස්වීම පවත්වන්න බල පත්‍රයක් ලබාගෙන තිබෙනව. මේ තත්ත්වය අනුව අපේ රැස්වීම් දෙක එක වෙලාවටම පවත්වාගෙන යන්න සිදු වෙනව. එත කොට දෙගොල්ලම කතා කරන දේවල් එක්වර ඇහෙන්ට වෙනව. ඒ නිසා මේ ආකාරයට දෙගොල්ලම එක්වර කෑ ගහන එකේ තේරුමක් නැහැ, අපි මේ වෙලාවල් සුදුසු පරිදි බෙද ගනිමු" යි කීව.

වාසනාවකට වාගෙ උන්නැහෙ බොහොම සාධාරණ මන්ත්‍රීවරයෙක් නිසා ඊට එකඟ වුණා. උන්නැහෙ ලස්සන මන්ත්‍රීවරයෙක් වාගෙම උන්නැහෙගෙ අදහසුත් ලස්සනයි. එ නිසයි එසේ එකඟ වුණේ. ඒ අයගෙ රැස්වීම සීමිත කාලයක් පවත්වා අවසාන කරන්ට එකඟ වුණා. නමුත් උන්නැහෙලගෙ පක්ෂයෙ ආධාරකාරයො වගයක් කියා සිටිය අපේ රැස්වීම්වලට බාධා වන පරිදි බොරුවට රෙකෝඩ්ස් ගගහ ඉන්ට. කෙසේ වෙතත් එදා එම දෙපොළගෙ මැදිහත්වීම නිසා වෙන්ට තිබුණ කරදරය වළක්වා ශිෂ්ඨ විධියට එම රැස්වීම පවත්වාගෙන යන්ට ඉඩ ලැබුණා. මා එය ඉදිරිපත් කළේ උදාහරණයක් වශයෙනුයි. බලපත්‍ර දීමෙදී සාධාරණ ක්‍රමයක් අවශ්‍යයයි. අතුරු මැතිවරණවලින් පමණක් නොවෙයි, මහා මැතිවරණවලිනුත් ලබන ලද අත්දැකීම් අනුව ඒ ඒ කාල සීමාවලදී ඒ ඒ ප්‍රදේශවල රැස්වීම් පවත්වන්න බලපත්‍ර බෙදා දෙන්ට ඕනෑ. රැස්වීම් පැවැත්වීමෙ කාල සීමාව එකම පක්ෂයක් විසින් වෙන් කරගෙන තිබුණාය කියා අනික් පක්ෂයට එම නිදහස නැති කළොත් මොකද සිදු වන්නෙ? තම පක්ෂයෙ ප්‍රතිපත්ති ඡන්දදායකයන්ට කියා දීමෙ අවස්ථාව එක් කොටසකට නැතිව යනව. එම අවස්ථාව නැති කිරීම ප්‍රජාතන්ත්‍රවාදී වෙන්නෙ නැහැ. එම නිසයි අර කාරණය මම නිදසුනක් වශයෙන් මතක් කළේ.

යුද හමුදාවෙත් ගුවන් හමුදාවෙත් සේවය කරන අය මැතිවරණ කටයුතුවලට කෙළින්ම සහභාගි වන බව මා කීවා. ඒවගෙම ප්‍රසිද්ධ පුද්ගලයන් රාශියක්ද මැතිවරණ කටයුතුවලට කෙළින්ම මැදිහත් වුණා. මැතිවරණ නීතිවල ඒ පිළිබඳ තහනමක් අඩංගු නුනත් රාජ්‍ය සේවා කොමිසමේ එවැනි නීති අඩංගු වෙනව. මා පෙන්වා දෙන්නම් එක් සිද්ධියක්. සීතා සෙනෙවිරත්න මහත්මියගේ ස්වාමි පුරුෂයා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙ සාමාජිකයෙක්. එතුමා එහි සභාපතිද කියන්ට මා දන්නෙ නැහැ. රාජ්‍ය සේවා කොමිසමෙහි පනවා තිබෙන නීතිවලට අනුව යම් රජයේ සේවකයකුගෙ භාර්යාව දේශපාලන ක්‍රියාවල නිරත වෙනව නම් ඒ ක්‍රියාව පුරුෂයා කළ ක්‍රියාවක් හා සමාන විධියට සලකන්ට පුළුවනි. ස්වාමි පුරුෂයා රජයේ සේවයෙකුව සිටියදී ඔහුගේ භාර්යාව දේශපාලන කටයුතුවල යෙදෙනවා නම් එය ස්වාමි පුරුෂයා දේශපාලන කටයුතුවල යෙදෙනවා හා සමානව සලකනවාය කියා රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝගවල සඳහන් වී තිබෙනව. එහෙත්, මේ සීතා සෙනෙවිරත්න මැතිනිය දේශපාලන කටයුතුවල යෙදුණ පමණක් නොවෙයි, ඇතැම් ඡන්දදායකයින්ට රක්ෂාවල් ලබා දෙන බවටත් පොරොන්දු දී තිබෙනව. ඒ බවට සාක්ෂි තිබෙනව. එමෙන්ම තමන්ගේ ස්වාමි පුරුෂයා රාජ්‍ය සේවා කොමිෂමේ සාමාජිකයකු කියා අස් කළ සේවකයන්ට නැවත රක්ෂාව ලබා දෙන බවටත් පොරොන්දු දී තිබෙනව. එහෙත්, රාජ්‍ය සේවා කොමිෂම ඒ සාමාජිකයා සේවයෙන් අස් කළාද? නැහැ.

නමුත් පසුගිය මහ මැතිවරණයේදී තමුන්නාන්සේලාට විරුද්ධව දේශපාලන කටයුතුවල යෙදුණාය කියා දහස් ගණනකගේ වැඩ නවත්වා තිබෙනව. විශේෂයෙන්ම ගුරුවරුන් දහස් ගණනකගේ වැඩ නවත්වා දැනට හුඟ දෙනෙකු සේවයෙන් පහ කර සිටිනව. අපි "ජනදින" හා "ඇත්ත" පත්තරවල දැන්වීමක් දැම්ම. හත් හවුල් රජයේ තාඩන පීඩනවලට ගොදුරු වූ ගුරුවරුන් සිටිනවා නම් බෙන්තර-ඇල්පිටිය ආසනයේ මැතිවරණයට උපකාර කරන්න එන්නය කියල. ඉල්ලුම් පත්‍ර දහස් ගණනක් අපට ලැබුණා. එයින් 648 දෙනෙක් බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශයේ මේ නියම්ගම්වලට ගොස්—සමහර තැන්වලට වතුර ඇදලා දර පළලා—හත් හවුල් රජයේ දූෂිත පළිගැනීමේ ක්‍රියා කලාපය ගැන කරුණු අවබෝධ කර දුන්නා. ඒ නිසා බෙන්තර-ඇල්පිටියේ ජයග්‍රහණයෙන් කොටසක් අපට ලැබුණේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සූරියාරච්චි මයා.]

තමුන්නාන්සේලාගෙ දූෂිත පළිගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් කියන අතර, ඒ සඳහා ගුරු පරපුරට මේ අවස්ථාවේදී අපි මල් කලඹක් පුද කරනව. ඒ අවස්ථාව ලබා දීම ගැන මේ රජයටත් අපි ස්තුති වන්ත වෙනවා.

ඒ සමගම සේවයෙන් නෙරපන ලද වරායේ හා ලංගම සේවකයින් දහස් ගණනක් අද රක්ෂාවල් අහිමි වී සිටිනව. ඔවුන් අද ඕනෑම සටනකට සූදානම්ව සිටිනව. තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදීව නොකරන සටනකට වුණත් ඉදිරිපත් වන්නට එවැනි අය දහස් ගණනක් අද සූදානමින් සිටිනව. ඉදිරි මැතිවරණවලදී ප්‍රජාතන්ත්‍රවාදීව ක්‍රියා නොකර ඔය විධියේ ත්‍රස්තවාදී ක්‍රියාවලින් පිළිතුරු දෙන්නට ආවොත් තමුන්නාන්සේලාගේ හත් හවුලෙන් බැට කෑ උදවිය එයට නිසි පිළිතුරු දෙන්නට සූදානමින් සිටිනව. "ඇමෙරිකන් ඉන්ටෙලිජන්ස් සර්විස්" එකට කියන්න ඔවුන් කියන මනෝවිද්‍යාත්මක පර්යේෂණය වැරදියි කියල. ත්‍රස්තවාදී ක්‍රියාවලින් ලංකාවේ මහජනයා බියවද්දා මැතිවරණ ජයගන්න බැරි බව කියන්න. සිංහලයන්ට ඉතිහාසයක් තිබෙනව. ගහන්න ගහන්න අපේ අය ප්‍රකෝප වෙනව; ප්‍රතිප්‍රහාරය දෙනව. වියට්නාමයේ කරන්නා වාගේ තමුන්නාන්සේලා අහිංසක මිනිසුන්ට පහර දී ත්‍රස්තවාදී ක්‍රියාවලින් මේ රටේ ජනතාව බියවද්දා මැතිවරණ පවත්වන්නට සූදානම් වූ නිසා තමයි, මෙතරම් පහසුවෙන් මේ ආසන තුන දිනාගන්නට අපට පුළුවන් වුණේ. තමුන්නාන්සේලාට උපදෙස් දෙන ඒ මනෝවිද්‍යාඥයින්ට කියන්න ඔවුන්ගේ පොතේ වැරදි පිටුවක්ය පෙරළිලා තිබෙන්නේ කියා. ඒ සෙල්ලම ලංකාවේ හරියන්නේ නැහැ. ඉතිහාසයක් තිබෙන ලංකාවේ ජනතාව ගහන්න ගහන්න ප්‍රතිප්‍රහාරය දෙනව. තමුන්නාන්සේලාගෙන් බැට කෑ දහස් ගණනක් වූ ඒ රජයේ සේවකයින්, තමුන්නාන්සේලා නීතිය පැත්තකින් තබා පොල්ල එල්ල කරන්න ලෑහැස්ති වුණොත් පොල්ලට පොල්ල එල්ල කරන්න සූදානමින් සිටින බවත් මතක් කරන්නට ඕනෑ.

රාජ්‍ය ඇමතිතුමා බොහොම ලක්ෂණ හිනාවක් දැම්ම. එතුමා හිනාවෙන්නෙ බඩේ බිජු තබාගෙන තමයි. අපි මේ කථා කරන්නේ ඒ සියල්ලකටම සූදානමින්ය කියා අපි කියනව. තමුන්නාන්සෙලාගෙන් පහර කෑ රජයේ සේවකයින්ගේ රක්ෂාවල් නැතිවීම නිසා ඔවුන්ගේ දරුවන් ගෙවල්වල අඬද්දී ඔවුන්ට උන්නත් එකයි; මළත් එකයි; එල්ලුම්ගස් ගියත් එකයි. [බාධාකිරීමක්] මේ කියන්නෙ සමාජසේවා ඇමතිතුමාට නොවෙයි. තමුන්නාන්සෙ පොඩ්ඩක් ඉන්න. මේ විධියට ආණ්ඩු පක්ෂය නොයෙක් නොයෙක් විධියට කරුණු ඉදිරිපත් කර සැනසෙන්නට දැන් උත්සාහ කරනව. බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා ඒ මැරිච්ච අලියට යන්තම් හෝ පණ දෙන්නට උත්සාහ කළා. නමුත් පුංචි වෙද මහත්මයකු ඇවිත් පවන් සැලුවාට මැරිච්ච අලියට පණ එන්නේ නැහැ.

ගරු අගමැතිතුමාගෙ කථාව අසාගෙන සිටි මට ප්‍රථම වතාවට ආණ්ඩුව ගැන දුකක් ඇති වුණා. දැන් පින් පිරිහී ඇති බව අගමැතිතුමාගෙ කථාවෙන් ඔප්පු වුණා. දිව්‍ය ලෝකයේ පහළ වී සිටින දිව්‍ය පුත්‍රයන්ගේ පින් පිරිහී ගොස් දිව්‍ය ලෝකයෙන් චුත වන්නට ආසන්න වූ විට ඒ අය වැහැරී මලානික වන ස්වභාවක් තිබෙනවා. පින් කර දිව්‍ය ලෝකයේ ඉපදෙන අය ඒ පින් අවසන් වූ විට පිරිහී මලානික වන ගතියක් තිබෙනවා. පින් පිරිහී දිව්‍ය ලෝකයෙන් චුත වන්නට ලෑස්ති වී සිටින දිව්‍ය පුත්‍රයකුගේ ස්වභාවක් ගරු අගමැතිතුමා කථා කරගෙන යද්දී පිළිබිඹු වුණා. අද වගේ අපහසුවකින් එතුමා මීට පෙර මෙම ගරු සභාවේදී කථා කර නැහැ. එතුමා වචන එකතු කෙළේ බොහොම අමාරුවෙනුයි. ඇයි අප් පොච්චියේ, චෛතිය රජුගේ යුගය පසුගිය දිනවල හොඳ හැටි පිළිබිඹු කළා නොවැ. මැතිවරණ සමයේදී ඇද බෑ දේවල ප්‍රතිඵල තමා ඔය පල දෙන්නෙ. "කළ කළ දේ පල පල දේ" යනුවෙන් කියමනක් ඇති බව ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ද දන්නවා ඇති. පසුගිය මහා මැතිවරණ සමයේදීත්, අතුරු මැතිවරණ සමයේදීත් ඉකුත් වූ ඒ "වාසනාවන්ත 18 මාසය" තුළත් කළ පව් පලදීගෙන එන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බවයි දන්නම් පෙනෙන්නට තිබෙන්නෙ. බොහෝ සෙයින් පව් කළ තැනැත්තකු මෙලොව සිට පරලොව යන්නට ලෑස්ති වන විට කියන දේවලට "යන ගී කියනවා" යි ව්‍යවහාරයක් තිබෙනවා. ඒ "යන ගී කියන" කාලයේදී අට පිරිකර පූජා කිරීම් ආදිය කරනවා. මේ කාලයේදී ඔහු භීනෙන් භය වෙනවා, නං දොඩ වනවා, එහෙම නැත්නම් යන ගී කියනවා. මේ ආණ්ඩුවේ අගමැතිවරයා සහ අනිකුත් මැති ඇමතිවරුන් පසුගිය කාලයේදී බොහොම ලොකුවට පුරසාරම් දෙඩුවා. මහේසාක්‍ය ලීලාවෙන් කථා කළා. එදා මහේශාක්‍ය ලීලාවෙන් කථා කළ මැති ඇමතිවරුන් අද නිශ්ශබ්ද වී බිංගිරියේ අහිංසක ගරු මන්ත්‍රීතුමා බිල්ලට දුන්නා. ඒ මන්ත්‍රීතුමා අවංක උත්සාහයක් දැරුවත් මැරිච්ච අලියට පණ දෙන්නට එතුමාට ශක්තියක් නැහැ.

පසුගිය අතුරු මැතිවරණ සටනින් පරාජය වීමට හේතු සොයා ගන්නට මේ ආණ්ඩුව උත්සාහ කළත් තවම ඒ හේතු සොයා ගන්නට පුළුවන් වී නැහැ. තවම ඒ රහස සොයා ගන්නට පුළුවන් වුණේ නැත්නම් අපට එය කියා දෙන්නට පුළුවනි. මේ ආණ්ඩුව පසුගිය කාලයේදී අනුගමනය කළ වැරදි සහගත වූත් ප්‍රජාතන්ත්‍ර විරෝධි වූත් ක්‍රියාකලාපය නිසා පමණක් නොව මහජනයාට බොරු පොරොන්දු දී පෙඩරල් පක්ෂය සමග රහස් ගිවිසුමක් ඇති කරගෙන මේ රට බෙදා දීමේ යටිකුට්ටු ව්‍යාපාරයක් ගෙන යන නිසාත් පසුගිය පුංචි මැතිවරණයේදී මේ ආණ්ඩුව ආසන තුනෙන්ම පැරදුණා. මේ රටේ මහජනයා විරුද්ධ පාර්ශ්වයට සහතික තුනක් දී තිබෙනවා. පුංචි මැතිවරණ කාලයේදී මේ ආණ්ඩුවේ කට්කයන් ප්‍රචාරය කළ නින්දිත කථාවක් නම්, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුව වර්ජනය කර සිටින හෙයින් විරුද්ධ පාර්ශ්වයේ අපේක්ෂකයන්ට ඡන්දය දීමෙන් කරන්නේ ගෙදර සිටි මින්ම පඩි ගන්නා මන්ත්‍රීවරුන් පත් කර ගැනීමක්ය යන්නයි. වැඩ වර්ජනය කර සිටින අයට ඡන්දය දෙන්නේ මන්දැයි ආණ්ඩුවේ කට්කයන් ප්‍රශ්න කළා.

ඇයි අප පාර්ලිමේන්තුව වර්ජනය කෙළේ? අප කොච්චර කීවත් ආණ්ඩුවට ඒවා අසා ගැනීමට කන් නැත්නම්, අපේ හඬුව පසුගිය පුංචි මැතිවරණයේදි මහ ජනයාට කියා පැමට අප තීරණය කර ගත්තා. අප කියන දේ අසන්නේ නැත් නම් මෙහි පැමිණීමෙන් ඇති වැඩේ කුමක්ද? කඳු මුදුනේ සිට මුහුදු වෙරළ දක්වා පැතිරී සිටින ජනතාවට අප කරුණු පැහැදිලි කර දුන් විට ප්‍රීති සභාවක් හැටියට ක්‍රියා කළ ඒ මහජනතාව "හත් හවුල වැරදියි. විරුද්ධ පාර්ශ්වය හරි" යන තීන්දුවට බැස එය ප්‍රදර්ශනය කිරීමක් වශයෙන් විරුද්ධ පාර්ශ්වයට සහතික තුනක් දුන්නා. විරුද්ධ පාර්ශ්වය එයට එක්වුණු අලුත් මන්ත්‍රීවරුන් තිදෙනාත් සමග අද සවස 1.45 ට මෙම පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ පියගැට පෙළ නගිමින් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ වැඩ වර්ජනය සමාප්ත කළ බව කියන්නට කැමතියි. හත් හවුල මේ අතුරු මැතිවරණයෙන් ලැබූ ප්‍රතිඵලවලින් පාඩමක් ඉගෙන ක්‍රියා කරනවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා. නැවත වරක් මුක්කු ගසන්න නොවෙයි, අප බලාපොරොත්තු වන්නේ. මින් ඉදිරියට මුක්කු ගැහීම්වලින් වැඩක් නොවන නිසා, මැද කොළඹ තුන්වැනි ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන්, හත් හවුල් රජය අඩු වශයෙන් සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා නීති සම්පාදනය කිරීමේ යුතුකමවත් ඉෂ්ට කළොත් එය ඔවුන්ට ලොකු ගෞරවයක් වෙනව. 1960 මාර්තු මහ මැතිවරණය ඉතාමත් සාධාරණ මැතිවරණයක් හැටියට පැවැත්වීමට එවකට අගමැතිව සිටි ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) එදා කටයුතු කිරීම ගැන අපි අදත් එතුමාට මල් මිටක් පුද කරනව. දහසකුත් එකක් වැරදි තිබුණත්, එතුමාට නැවත වරක් ගාල්ලෙ ජනතාව ඒ ආසනය ලබා දුන්නෙ 1960 දී එතුමා ගත් ඒ සාධාරණ ක්‍රියා මාර්ගය නිසයි. මේ රටේ ජනතාවට හොඳට දේශපාලන ඉව තියෙනව. යුතුකම හරියට ඔවුන්ට ඉෂ්ට කර දුන්නොත් ඊට යුතුකමෙන්ම පිළිතුරු දීමටත් ඔවුන්ට අයුක්තියක් කළොත් ඊට අයුක්තියක්ම කිරීමටත් මේ රටේ ජනතාව කිසි විටෙක පැකිලෙන්නෙ නැහැ. එමනිසා, මැතිවරණ නීති රීති සම්බන්ධයෙන් අප මෙහිදී ඉදිරිපත් කළ යම් යම් දුර්වලකම් හිතට අරගෙන, සාධාරණ මැතිවරණයක් ඇති කිරීම සඳහා නීති සම්පාදනය කිරීමට පත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සූරියාරච්චි මයා.]

කෙරෙන කොමිටියෙ අවධානය ඒව ගැන යොමු කරවන හැටියට මේ අවස්ථාවෙදි රජයෙන් ඉල්ලා සිටිනව. ඒ එක්කම, යුක්ති සහගතව කෙරෙන සංශෝධනයකදි සාමාන්‍ය සම්ප්‍රදායය අනුව මේ ගරු සභාවෙ සෑම පක්ෂයකම නියෝජිතයින් ඊට සම්බන්ධ කර ගනිතොත් විරුද්ධ පාර්ශ්වයෙ සිටින අපගෙ සම්පූර්ණ සහයෝගය ඒ සඳහා ලැබෙන බව ප්‍රකාශ කරමින් මගෙ වචන ස්වල්පය අවසන් කරනව.

අ. භා. 6.51

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

ගරු කථානායකතුමනි, මා මෙම විවාදයට සම්බන්ධ වන්නට බලාපොරොත්තු නොවූ නමුත්, බෙන්තර-ඇල්පිටිය අතුරු මැතිවරණය සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශ කීපයක් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් විසින් කරන්න යෙදුණු නිසා සුළු වශයෙන් කරුණු කීපයක් කියන්න මම අදහස් කරනව. ආණ්ඩු පක්ෂයෙන් අද මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නෙ මැතිවරණ නීති සංශෝධනය කිරීම සඳහායි. පසුගිය අවුරුදු 10 ඇතුළතදී කීප වරක්ම මැතිවරණ නීති සංශෝධන ඇති කළා. ඒ අවස්ථාවෙදි රට ආණ්ඩු කළේ අද විරුද්ධ පාර්ශ්වයේ සිටින අයයි. ඒ කාලයෙදි ඉදිරිපත් කරන ලද මැතිවරණ නීති සංශෝධනවලින් එක්සත් ජාතික පක්ෂයට විශාල පහරක් ගහන්න පුළුවන් වේයයි ඒ අය කල්පනා කළා. විශෙෂයෙන්ම වයස 18 තරුණයින්ට ඡන්ද බලය දුන් කාලයෙදි, ඒ තරුණයින් කවදාවත් එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන්නෙ නැතැයි එදා ආණ්ඩු පක්ෂය කල්පනා කළා. නමුත් 1956 න් පසු පැවැත්වුණු හැම මැතිවරණයකදිම එක්සත් ජාතික පක්ෂයට වැඩි ආසන ගණනක් ලැබුණු බව ඔප්පු වී තිබෙනව. එය ප්‍රකට කාරණයක්. එම නිසා පිරිසිදු මැතිවරණයක් පැවැත්වීමට අවස්ථාවක් ඇති කිරීමේ ආසාව විරුද්ධ පාර්ශ්වයට මෙන්ම අපටත් තිබෙන බව මා මේ අවස්ථාවෙදි විශෙෂයෙන්ම මතක් කරනව.

විරුද්ධ පාර්ශ්වයෙ සමහර ගරු මන්ත්‍රීවරුන් අද මේ අවස්ථාවෙ කථා කළ අන්දමට මටත්, එක්සත් ජාතික පක්ෂයෙ ලේකම්වරයකු වශයෙන් සුළුවෙන් නොව දීර්ඝ වශයෙන් කියන්න පුළුවන් කරුණු කිව්වොත් ඇත්ත වශයෙන්ම විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට ලැජ්ජ හිතෙනව ඇති. මැතිවරණ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂය පොලිසියට බලපෑම් කර තිබෙන බවටත් විරුද්ධ පාර්ශ්වයෙ රැස්වීම් වලට අවසර නොදෙන ලෙස පොලිස්පතිට කියා තිබෙන බවටත් අපට චෝදනාවක් මෙහිදී එල්ල වුණා. මැතිවරණ කටයුතු පිළිබඳ සංවිධායකයකු වශයෙන් මේ ගැන වචනයක් කියන්න කැමතියි. මැතිවරණ රැස්වීම් පැවැත්වීමට අනෙක් පක්ෂවලටත් ප්‍රසිද්ධ ස්ථාන ලබා ගන්න ඕනැවන නිසාත් ඒ සඳහා පොලිසියෙ අවසර ලබා ගන්න සිදුවන නිසාත් ඒ ස්ථානයන් කාටත් සාධාරණව ලැබෙන පිළිවෙලට කටයුතු කිරීමයි සංවිධායකයකු වශයෙන් මා කළ පළමුවැනිම කටයුත්ත. නමුත්, දෙම්පෙ ප්‍රදේශයෙ රැස්වීමක් තියන්න අප අවසර ඉල්ලූ අවස්ථාවකදි මුලදි අපට ඒ අවසරය ලැබුණු නමුත් රැස්වීම පවත්වන්න දවස් තුනකට කලින් ඒ අවසරය අවලංගු කර පසුව ඒ ස්ථානය වෙනත්——

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

මැතිවරණ කාලයකදි ?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

මැතිවරණ කාලයක නෙමෙයි. මැතිවරණයක් නැති අවස්ථාවකදිත් නමුත් නාන්සෙල ඒ විධියටයි කටයුතු කළේ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

මැතිවරණ කාලයක නෙමෙයි නම් පාඩුවක් වුණේ නැහැනෙ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඞී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

ටිකක් ඉවසල ඉන්න. තමුන්නාන්සෙල ප්‍රජාතන්ත්‍රවාදය අනුව කටයුතු කළ හැටි මම කියන්නම්.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

කරුණාකර මතක තියා ගන්න නඩුවක් තිබෙන බව.

**ගරු එම්. ඞී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

නඩුව තියෙන්නෙ වැන් එකක් පොඩි කළාට.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

වැන් එකක් පොඩි කළාට නෙමෙයි, මිනිහකුට පිහියෙන් ඇන්නට.

**ගරු එම්. ඞී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

නඩුව ගැන මම බලාගන්නම්. මමත් නීතිඥයෙක්.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

දැනට නඩුවක් තිබෙන නිසා ඒ ගැන කථා කිරීම සම්පූර්ණයෙන්ම රීති විරෝධී බව, " sub judice " බව මා මතක් කරන්න සතුටුයි.

**ගරු එම්. ඞී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

නඩුව ගැන මම බලා ගන්නම්. මමත් නීතිඥයෙක්.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

නඩුව බලා ගන්න තියෙන්නෙ උසාවියටයි. උන්නැහෙට බැහැ නඩුව බලා ගන්න. උන්නැහෙල නොවෙයි උසාවියෙ ඉන්නෙ.

**ගරු එම්. ඞී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

අපේ රැස්වීම තහනම් කළ අන්දමයි මා මේ කියන්නෙ.

ගරු කථානායකතුමනි, බෙන්තර-ඇල්පිටිය අතුරු මැතිවරණය ඉතාමත්ම සාමකාමී අන්දමින් ගෙන යන්න අප සැම උත්සාහයක්ම දැරූ බවට විරුද්ධ පක්ෂයේ සංවිධානයට පැමිණි දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.), බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) එහෙම සාක්ෂි දරනවා ඇති.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

පෝස්ටර් ගැහුව.

**ගරු එම්. ඞී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

පෝස්ටර් ගැනත් මම කියන්නම්. පෝස්ටර් එකක් ප්‍රසිද්ධ තැනක ඇලවීමයි නීති විරෝධි. තමන්ගෙ පෞද්ගලික ගෙයි ඕනැම පෝස්ටර් එකක් අලවන්න පුළුවන්.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

පාර අයිනෙ ?

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

බස්වල ඇලෙව්වෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
ඒකටත් මැතිණියට මං පිළිතුරක් දෙන්නම්. තමුන්නාන්සේලාට විරුද්ධව කාරණා අපටත් ඉදිරිපත් කරන්න පුළුවන්. අප බස්වලින් මිනිසුන් ඇද්දුය කියා ඔය පැත්තෙන් කියන්ට පුළුවන් ඔය ගොල්ල බස්වලින් මිනිසුන් ඇද්දුය කියා මේ පැත්තෙන් කියන්ට පුළුවන්.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
තමුන්නාන්සෙල පාවිච්චි කළ බස් රථවල නොම්මරත් අපට ඉදිරිපත් කරන්ට පුළුවන්.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
ගරු කථානායකතුමනි, උසාවියෙ නඩු 10ක් තිබුණා. ඒ නඩු 10න් 9කින්ම විරුද්ධ පැත්තෙ මන්ත්‍රීවරුන්ටයි ආසන අහිමි වුණේ. තමුන්නාන්සෙල ඒක පිළිගන්නෙ නැද්ද? මොන චෝදනා උඩද? [බාධාකිරීමක්] අගලවත්ත මන්ත්‍රීතුමාට වැන් රථ පාවිච්චි කළාය කියා ලංකා ගමනාගමන මණ්ඩලයට රුපියල් හයසිය ගණනක චෙක්පතක් යවනන් සිද්ධ වුණා.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
උසාවියෙ තිබෙන නඩුවක් ගැන කථා කිරීම යෝග්‍යද? උසාවියට අදාළ වන දෙයක් ගැන කථා කිරීම යෝග්‍යද? අගලවත්තෙ ගරු මන්ත්‍රීතුමාට ආසනය අහිමි වුණාද නැද්ද කියන එක තවම උසාවිය ඉදිරියෙ තියෙන්නෙ.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
මමත් උසාවියෙ අවුරුදු කීපයක් වැඩ කළ නීතිඥයෙක්. උසාවියට අදාළ වන කාරණා මොනවාද කියා මමත් දන්නවා. මා කියන්නෙ මේ කාරණය පමණයි. අගලවත්තෙ ගරු මන්ත්‍රීතුමාට රුපියල් හයසිය ගණනක චෙක් පතක් ලංකා ගමනාගමන මණ්ඩලයට යවන්න සිද්ධ වුණා.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
ගරු කථානායකතුමනි, මම මේ රීති ප්‍රශ්නයක් මතු කරන්නෙ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Order, please! There is a case pending. Please do not refer to that matter.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
I am not referring to that appeal at all.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
A case is pending. It is now in appeal.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
I am asking for a Ruling, Sir. I am raising a point of Order.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
The Hon. Minister must please take my Order. Please do not refer to that matter at all.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
I will follow your Order, Sir. I am only mentioning a fact that does not appear in that case.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Please take my Order. Do not refer to it.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

මේ නඩුවලින් මොනවද ඔප්පු වුණේ? මම එක නඩුවක් ගැන විශේෂයෙන් කියන්නෙ නැහැ. බලන්ගොඩ නඩුවය, නැත්නම් අර නඩුවය මේ නඩුවය කියා එක නඩුවක් ගැන සඳහන් කරන්නෙ නැහැ. මේ සියලුම නඩුවලදී සාමාන්‍යයෙන් උසාවියෙ නඩුකාරවරුන් පිළිගත් කරුණු මොනවාද? මේ අය අල්ලස් දුන්නාය, අර අය අල්ලස් දුන්නාය, ආදී වශයෙන් මේ ගරු සභාවේදී දෙපක්ෂයම නොයෙක් චෝදනා හුවමාරු කර ගන්න පුළුවන්. නමුත් නඩු නවයකින් ඔප්පු වූ කාරණා මොනවාද? හාමුදුරුවරුන්ට ගල් ගැහුව; අයුතු බලපෑම් පෑව; ආණ්ඩුවෙ රථවාහන පාවිච්චි කළා. මේ ආදී නොයෙක් දූෂණ ඔප්පු වී තිබෙනව.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

බෙන්තර-ඇල්පිටියෙ මොකක්ද ඔප්පු වුණේ?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

මන්ත්‍රීතුමා පගාවක් ගත්තාය කියා ගැහැණු ළමයෙක් කථාවක් කළාලු. ඒ නිසයි ආසනය අහිමි වුණේ.

ගරු කථානායකතුමනි, දෙම්පේ ගරු මන්ත්‍රීතුමාට මා එක් කාරණයක් කියන්ට සතුටුයි. මන්ත්‍රීතුමාගේ නමින් එක වචනයකින් වුණත් සඳහනක් කරන්ට එපාය කියා මා සියලුම කවිකයින්ට කිව්වා.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

පත්‍රිකාවක් ගැහුව.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

මම නම් දැක්කෙ නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

දැක්කෙ නැහැ තමයි.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

පත්‍රිකාවක් බෙදූ බවක් මම නම් දැක්කෙ නැහැ. මම එය පිළිගන්නෙ නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

සංවිධායකය පත්‍රිකාව දැක්කෙ නැහැල්ලු.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

නමින්වත් වචනයකින්වත් මන්ත්‍රීතුමා ගැන සඳහනක් කරන්ට එපාය කියා අප සියලුම කවිකයින්ට කිව්වා. ඒ ගරු මන්ත්‍රීතුමාත් ඔළුව වනනව.

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

පත්‍රිකාවක් ගැහුව.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

ඒ ගරු මන්ත්‍රීතුමාගෙ රහස් පොලීසියක් තිබෙනවාය කියා දැන් ප්‍රකාශ කළා. අපේ රැස්වීම්වල කළ කථා ගැන තමුන්නාන්සේට දැනගන්න ලැබෙන්න ඇති. ඔය එක රැස්වීමකදීවත්, පි. 4 නමැති පත්‍රයේ කරුණු එකක්වත් මතක් කළේ නැහැ.

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

නමුත් අධිකරණ ඇමතිතුමා ඉදිරිපිටදී පිටිගල සාම මණ්ඩලයේ සභාපතිවරයා— පරණ මුලාදෑනියෙක්—සම්පූර්ණයෙන්ම පෞද්ගලික චරිතයට පහර දීල කථා කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

මම හිටපු රැස්වීම් එකකදීවත්, අගමැති තුමා හිටපු රැස්වීම් එකකදීවත් පෞද්ගලිකව තමුන්නාන්සේගේ නමවත් මතක් කරන්න ඉඩ දුන්නෙ නැහැ. ඒ විධියට පිරිසුදු අන්දමට මැතිවරණය ගෙන යාමට අප සෑම උත්සාහයක්ම දැරූ බව මම කියන්න සතුටුයි. දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) වැනි අය රාත්‍රී දහයට, එකොළහට පමණ අප සිටි ස්ථාන පසුකරගෙන යන්න ආවා. අපි කිසිම හිරිහැරයක් වෙන්න ඉඩ නොදී—හූ කියන්නවත් ඉඩ නොදී—යන්න ඉඩ දුන්නා. [බාධා කිරීමක්] ඔව්, ඔව්. ගම්පහ රැස්වීම පවත්වන්න ගිය අවස්ථාවේ අපට සංග්‍රහ කළ හැටි අපට හොඳට මතකයි. දොම්පේ මන්ත්‍රීතුමාට (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) ඒවා දැන් අමතක වෙලා. [බාධා කිරීමක්] දැන් උපාසකයන් වගේ කථා කරනවා.

තවත් කාරණයක් ගැන කිව්වා; ස්පිරිතාලයකට මුල් ගලක් තැබීම ගැන. ඒක චෝදනාවක් වශයෙන් කිව්වෙ නැත කියා මම හිතනව. කීප දෙනෙක්ම මට පැමිණිලි කළා, ඒ ආරෝග්‍යශාලාවේ දූෂණ වැඩ කෙරෙනවාය, එතැන සේවයේ යෙදී සිටින අය විශේෂයෙන්ම රජයට විරුද්ධව ප්‍රචාරයන් කරනවාය කියා. මම ඇවිත් සිටින්නේ ඇමතිවරයෙක් වශයෙන් ආරෝග්‍යශාලා පරීක්ෂා කිරීමට නොවේය, ඡන්දයට වැඩ කරන්නටය, ඒ නිසා ඒ කාරණා ගැන පැමිණිල්ලක් තිබෙනවා නම් පසුව ඉදිරිපත් කරන්නය කියා මම ප්‍රසිද්ධියේ කී බව කව්රුත් දන්නවා.

**එකල්හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදි.**

**එතැන් සිට විවාදය 1966 නොවැම්බර් 7 වන සඳුදා පවත්වනු ලැබේ.**

*அப்போது பி. ப. 7 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது.*

1966, நவம்பர் 7 திங்கட்கிழமை விவாதம் ஆரம்பமாகும்.

*It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Monday, 7th November 1966.*

# කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය",—[ගරු සී. පී. ද සිල්වා].

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக". [கௌரவ சீ. பீ. டி சில்வா] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed: "That the House do now adjourn"—[The Hon. C. P. de Silva.]*

අ. භා. 7

**අනිල් මූණසිංහ මයා.** (අගලවත්ත)
*(திரு. அனில் முனசிங்க—அகலவத்தை)*
(Mr. Anil Moonesinghe—Agalawatta)

ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නයක් අහන්න බලාපොරොත්තු වෙනවා. ජනසතු සේවා භාර ගරු ඇමතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් ඒ ගැන දැනුම් දී තිබෙනවා. ලංගමයේ ප්‍රධාන ධාවන ඉංජිනේරුතුමා රහස් ලියවිල්ලක් යවා තිබෙනවා, මේ අවුරුද්දේ සැප්තැම්බර් මස 27 වැනිදා. ඒ ලියමනේ නොම්මරය ඕ. ජී. කේ. 14 සී. ඒ ලියමනේ සඳහන් කර තිබෙනවා, 1.7.65 දින සිට ලං.ග.ම. බස්වල "ඇත්ත" පත්‍රයත් "මව්බිම" පත්‍රයත්, "ජන සතිය" පත්‍රයත්, "ජනදින" පත්‍රයත් ගෙන යාම තහනම්ය කියා. දෙවැනි ඡේදයේ තියෙනවා, ඒ පත්‍ර පාර්සල් කර හෝ මගියකුටවත් ගෙන යන්න බැරිය කියා. එපමණක් නොවෙයි, කොන්දොස්තර මහත්වරුන්ට නියම කර තිබෙනවා, ගෙන යන පාර්සල් ඇරලා බලන්නය කියා. මේ විධියේ හිතුවක්කාර නීති—හිට්ලර්ගේ නීති—දමා තිබෙනවා. කොන්දොස්තර මහත්වරුන්ට නියම කර තිබෙනවා, පාර්සල් ඇරලා බලන්නය කියා. "ඇත්ත", "ජනදින" පත්‍ර තියෙනවද කියා ගැහැණු මගීන්ගේ හෑන්ඩ් බෑග්ස් ඇරලා බලන්න ඕනෑද කියා මම අහන්න කැමතියි.

මේ ලියමනේ එක්තරා තර්ජනයකුත් ඇතුළත් වෙලා තියෙනවා. මොකක්ද තර්ජනය? කොන්දොස්තර මහත්වරුන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

කියා තිබෙනවා, මේ වගකීම තමුසෙලාට පැවරී තිබෙනවාය, ඒ විධියට සේවයට නැත් නම් තමුසෙලාට දඬුවම් කරනවාය කියා. එපමණක් නොවෙයි, එහි කියා තිබෙනවා, "ඇත්ත" හෝ "ජනදින" පත්‍ර ඇතුළත් පාසර්ලයක් යමෙක් ගෙන යනවා නම් ඒ පාර්සලයත්, මගියාත් පොලිසියට ගෙන යන්න ඕනෑය කියා. මෙවැනි නියෝගයක් පිට කර තිබෙනවාදැයි ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා අහනවා. මෙවැන්න කට එතුමන්ලාගේ අනුමැතිය ලැබී ඇද්දැයි මා අහනවා. ඒ වගේම බොහොම ඉහලින් කථා කරමින් රටට කියා දුන් ප්‍රජාතන්ත්‍ර වාදය මෙයදැයි මා අහන්න කැමතියි. ගරු අගමැතිතුමා මේ අවස්ථාවේ මෙහි නැති නිසා රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා ගෙන්—ගරු අගමැතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන්—ඉල්ලීමක් කරන්න කැමතියි. කරුණා කර මේ නියෝගය කියවා බලන්න. එවැනි බලයක් පොලීසියට දී තිබෙනවාදැයි අපට කියන්න. ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්වල යන මගීන්ගේ සෑම මල්ලක්ම විවෘත කර බලන්නැයි නියෝගයක් කර තිබෙනවාදැයි දැන ගන්න කැමතියි.

අ. භා. 7.5

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

ගරු කථානායකතුමනි, මේ මාසය තුළ පළාත් පාලන ආයතන සඳහා මැතිවරණ කීපයක් පැවැත්වීමට නියමිතව තිබුණා. විශේෂයෙන් දෙවිනුවර සුළු නගර සභා මැතිවරණය සඳහා නොවැම්බර් පළමුවැනි දට නාම යෝජනා භාර ගන්නයි තිබුණේ. එහෙත් ඒ දවසේ නාමයෝජනාපත්‍ර භාර දීමට ගිය නියෝජිතයන්ට සහකාර මැතිවරණ නිලධාරියාගෙන් දැන ගන්න ලැබුණේ අවුරුද්දකින් මැතිවරණය කල් ගිය බවයි. නාමයෝජනාපත්‍ර භාර දීම සඳහා එම කාර්යාලයට පැමිණ සිටියේ අපේ පක්ෂවල —ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත්, ලංකා කොමියුනිස්ට් පක්ෂයේත්—නියෝජිතයන් පමණයි. එක්සත් ජාතික පක්ෂයෙන් එක් කෙනකුවත් එහි සිටියේ නැහැ. එයින් පෙනී යන්නේ එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයන්ට මේ නිවේදනය අනෙක් අයට වඩා කලින් දැන ගන්න ලැබී තිබුණු බවයි. පළාත් පාලන ඇමතිතුමාගේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් දැන ගන්න කැමතියි, මේ මැතිවරණය කල් දැම්මේ මොන හේතුවක් නිසාද කියා. පසු ගිය අතුරු මැතිවරණවලින් ලත් ප්‍රතිඵල අනුව ඇති වූ බිය නිසා එසේ කරන්නට යෙදුණේදැයි දැන ගන්න කැමතියි.

අ. භා. 7.7

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)
*(திரு. எம். தென்னகோன்—நிக்கவெரட்டிய)*
(Mr. M. Tennakoon—Nikaweratiya)

ගරු කථානායකතුමනි, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න බලාපොරොත්තු වෙනවා. ගරු ඉඩම් ඇමතිතුමා මෑතක සිට මේ ආණ්ඩුවේ ඉඩම් ප්‍රතිපත්තිය අනුව නින්දගම් යෝධයකු වී සිටිනවා. සබරගමුව ප්‍රදේශයේ තිබෙන නින්දගම් නැති භංග කර දමන අතර වන්නිකර ප්‍රදේශයේ ගැමි ජනතාවට ප්‍රයෝජන ගැනීමට තිබෙන හොඳ ඉඩම්වල එතුමා දැන් අලුතින් නින්දගම් ඇති කරන්න යනවාදැයි දැන ගන්න කැමතියි. [බාධා කිරීමක්].

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

දෙමළ හත්පත්තුව.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

අක්කර සිය ගණනක් ගම්මුන්ට නොදී කොම්පැනිවලට දීගෙන යනවා. ඒ එක් කාරණයක් පමණයි. අනෙක, පුත්තලම් දිස්ත්‍රික්කයේ රාජවන්නි පළාතේ ඉඩම් වලින් කොටසක් ඒ පළාත්වාසීන්ගේ විරුද්ධත්වය ගැනත් නොසලකා, ඒ අය ටත් නොදී එෆ්. ආර්. සී. කාදර් නම් මහත් මයෙකුට බදු දීමට තීරණය කර තිබෙන බවට ඇති ආරංචියයි. මේ ගැන ගම්වාසීන් විරුද්ධත්වය පළ කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජී. ජේ. පාරිස් පෙරේරා මයා.** (ජාඇළ)
*(திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா—ஜாஎல)*
(Mr. G. J. Paris Perera—Ja-Ela)

අක්කර කීයක් ද? අක්කර පහයි නේ ද?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ඔව්, අක්කර පහයි කියමුකෝ. ජාඇළ ගරු මන්ත්‍රීතුමාට අක්කර හතරක් පහක් සුළු දෙයක් හැටියට පෙනී ගියාට ගම්බද දුප්පත් ගොවියන්ට නම් එය විශාල ප්‍රමාණයක් බව මතක් කරන්න කැමතියි. ඒ නිසා ප්‍රමාණය කොතෙක් වුවත් මෙතෙක් කල් ඉඩම් ඉල්ලා ඇතත් නොලබා සිටින අයගේ විරුද්ධත්වය ගැන සලකා ඒ ඉඩම් ගම්වාසීන්ට දෙනවා දැයි ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි. රාජවන්නිය පළාතේ මෙපමණ කාලයක් බලහත්කාරයෙන්—අනවසරයෙන්—ගොවිතැන් කළ අයට අක්කර දෙක තුනක් පවා නොදී කොම්පැනිවලට—පිට උදවියට—අක්කර හාරපන්සිය බැගින් දීම සාධාරණ දැයි අහන්න කැමතියි.

**පාරිස් පෙරේරා මයා.**
*(திரு. பாரிஸ் பெரேரா)*
(Mr. Paris Perera)

ඉලංගරත්න මහත්මයාට අක්කර තුන් සියයක්ම දුන්නෙ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

එහෙම දුන්නා නම් ඒත් දෙන්ට ඇත්තෙ ඔය ඇමතිවරයාම වෙන්ට ඕනෑ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

තංගවේල් කොම්පැනියටත් තවත් කොම්පැනිවලටත් දීගෙන යනව. එහෙත් රාජවන්නියේත් වෙනත් ප්‍රදේශවලත් සිටින ගම්බද අසරණ ගොවි ජනතාව අනවසරයෙන් වගා කරනවිට, රක්ෂිත වනය රක්ෂිත වනය කියමින් විශාල වශයෙන් අඩ නියම කරන්න ඕනෑය කියනවා. අද ඒ සියල්ලක්ම අහෝසි කරල ගම්වාසීන් වගා කරගෙන සිටින අක්කර තුන—හතරෙන් ඔවුන් පන්නල, අක්කර සිය ගණන් කොළඹ ධනපතීන්ට බෙදාගෙන යනව. එම නිසා අපට ඇමතිතුමාගෙන් දැන ගන්ට ඕනෑ කරනව, සබරගමුවේ නැති කරනවා කියන ඔය නින්දගම් ක්‍රමය වියඹේ දියුණු කරන්ට තිබෙන ඉඩම්වල ඇති කරන්ට යනවා ද කියා.

අ. භා. 7.10

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

ගරු කථානායකතුමනි, මට සුළු ප්‍රශ්න දෙකක් මතු කරන්ට තිබෙනව. පළමුවෙනි ප්‍රශ්නය ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් අහන්නෙ ගරු අගමැතිතුමා මෙහි නැති නිසයි. මා මතු කරන්නෙ විශේෂයෙන් එතුමන්ලා දෙපොළගේම අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්නය ක්.1965 රජය බලයට පත් වුණු වහාම වගේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වරයකු වශයෙන් රාජකාරි කරමින් සිටි ස්ටැන්ලි ජයවීර නමැති නිලධාරියෙකුගේ වැඩ තහනම් කළා. එක්තරා චෝදනාවක් උඩ උන්නැහේගේ ගෙදරට සී. අයි. ඩී. කාරයින් යවල පරීක්ෂා කරවල, උන්නැහේගේ ඇඳ යටද, උන්නැහේගේ ළමයකුගේ ඇඳක් යටද කොහෙද ලිපි ගොනු වගයක් තිබී අසුවුණාය කියා පිංතූර වගයක් එහෙම අරන් පත්තරේ දමල ලොකු ව්‍යාපාරයක් ගෙන ගියා. මේකෙ මොකක් හරි කුමන්ත්‍රණයක් තිබෙනවද අපි දන්නෙ නැහැ. උන්නැහේ ඔස්ට්‍රේලියාවෙ තානාපතිවරයා හැටියට පත්ව යන්ට සිටි අවස්ථාවෙයි මේ ව්‍යාපාරය ගෙන ගියෙ. ඒ ගමනත් නවත්වල ඒ මනුෂ්‍යයගෙ වැඩත් තහනම් කළා.

ඇත්ත වශයෙන්ම වරදක් කර තිබෙනව නම් කවුරුවත් ඒකට විරුද්ධ වෙන්නෙ නැහැ. එහෙත්, අවුරුදු 1 1/2 ක් දැන් ගත වී තිබෙන නමුත් මා දන්නා හැටියට අද දක්වා චෝදනා පත්‍රයක්වත් ඒ මනුෂ්‍යයාට ඉදිරිපත් කරල නැහැ. ඔහුට විරුද්ධ කිසිම ක්‍රියා මාර්ගයක් ගෙන නැහැ. බාග පඩියක් දිගටම ගෙවාගෙන යනව. මොක්ද මේකෙ අදහස කියා අපි රජයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අහන්ට කැමතියි. යම්කිසි වරදක් සිදුවී තිබෙනව නම් ඇයි, ඒ ගැන ක්‍රියා කරන්ට බැරි, අපට මෙතරම් දක්ෂතාවක් ඇති පොදු සේවා කොමිසන් සභාවක් පත් වෙලා තිබෙද්දි? භායභීවන්ට පවා මෙතරම් දක්ෂතාවක් තිබෙද්දි ඇයි පොදු සේවා කොමිසන් සභාව මගින් යම් ක්‍රියා මාර්ගයක් නොගන්නෙ? අනික් කාරණය, යම්කිසි චෝදනාවක් නැත්නම් ඇයි අපි රජයේ මුදල් මේ අන්දමට විනාශ කර දමන්නෙ, කිසිම වැඩක් නැතිව නිකම් සිටින මිනිසුන්ට බාගෙ පඩි ගෙවමින්? ඒක පළමුවෙනි ප්‍රශ්නයයි.

දෙවෙනි ප්‍රශ්නය, ආහාර ඇමතිතුමාගෙන් ඇසිය යුතු ප්‍රශ්නයක්. මා මිට කලින් 1965 අවුරුද්දෙ විශේෂ ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින් ඇහුව, කවදද, මේ රජය අපේ අඳ ගොවීන්ගේ අයිතිවාසිකම් සම්පූර්ණ කරන්ට අදහස් කරන්නෙ කියා. 1965 රාජාසන කථාවෙන් මේ රජය විශේෂ පොරොන්දුවක් දුන්න, 1966 රාජාසන කථාවෙදි නැවත වරක් කියා සිටිය, අඳ ගොවීන්ට දැන් තිබෙන්නෙ හතරෙන් තුන් පංගුවක අයිතියක් නම්, සම්පූර්ණ හතර පංගුවම මේ රජය අඳ ගොවීන්ට ලබා දෙනවා කියා. මා පෙන්නුම් කර දුන්න, 1965 අවුරුද්දෙදි ඒ අවසරය එකල පැවති නීති රීති යටතේම තිබෙනව කියා. ඇමතිතුමාට තිබෙන්නෙ ක්‍රමයක් ඉදිරිපත් කරන්ට විතරයි. නීතියක් සම්පාදනය කරන්ටවත් වුවමනාවක් නැහැ. එදා ඇමතිවරයා පිළිතුරු වශයෙන් කියා සිටියෙ, මා ඒ ගැන කල්පනා කරගෙන යනවා කියායි. මා අතුරු ප්‍රශ්නයක් මතු කරමින් ඇහුව, දැන් තමුන්නාන්සේට තිබෙන කරදරය අඳ ගොවි මහත්වරුන් සියලු දෙනාටම එක වගේ සලකන්ට තිබෙන අපහසුවද කියා. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. විහාරස්ථානවලට; දළදා මාළිගාවට අයිති කුඹුරු තිබෙන නිසා මල්වතු මහා නායක හාමුදුරුවන් වහන්සෙගෙ බලපෑම් උඩ ඒක ප්‍රමාද කරන්ට සිදු වී තිබෙනව. දැනට ආණ්ඩුව ව්‍යාපාරයක් ගෙන යනව, විරුද්ධ පාර්ශ්වයේ සහයෝගය නැතුව; පාර්ලිමේන්තුවේ තුනෙන් දෙපංගුවක ඡන්දයක් නැතිව මේ කට යුක්ත කරන්න බැහැ කියා. මල්වතු මහා නායක හිමියන් තමුන්නාන්සේලාට ඇනුම් දී තිබෙන නිසා තමුන්නාන්සේලායි, මේක ප්‍රමාද කරන්නෙ. අපි මේ සභාවෙදි ප්‍රසිද්ධියේ කියනව, රජය කරන ප්‍රචාරය බොරුවක් කියා. අඳ ගොවීන්ට සම්පූර්ණ අයිතියක් ලබා දෙන්න නීතියක්වත් අවශ්‍ය නැහැ. එය අද හෙටම කළ හැකි දෙයක්. එම නිසා ආහාර ඇමතිතුමාගෙන් ප්‍රසිද්ධියේ අහන්ට කැමතියි, මේ අදහස ඉෂ්ට කරනවාද, නැද්ද කියා. අඳ ගොවි මහත්වරුන් සියලු දෙනාටම එක හා සමානව අයිතිවාසිකම් දෙනවා ද? ඇයි, 1964 සිට පොරොන්දු වූ දේ ඉටු නොකරන්නෙ? මා රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ කාරණයත් ආහාර ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්ට කියා.

අ. භා. 7.13

**කේ. බී. රත්නායක මයා.** (අනුරාධපුර)
*(திரு. கே. பி. ரத்னாயக்க—அனுராதபுரம்)*
(Mr. K. B. Ratnayake—Anuradhapura)

ගරු කථානායකතුමනි, ගරු ඉඩම් ඇමතිතුමාගේ අවධානය යොමු කළයුතු ප්‍රශ්නයක් මතු කරන්ට තිබෙනව. පසුගිය අයවැය විවාදයේදී තමුන්නාන්සේට මා මතක් කළා, මහවිලච්චිය ජනපදයට යන පාර අබලන්ව තිබෙන නිසා බස් රථයකට ගොඩවන්ට හැතැප්ම 20 ක විතර දුරක් පයින් එන්න එහි ජනතාවට සිදුවී තිබෙන බව. විටින් විට මේ ගැන කරුණු ඉදිරිපත් කරමින් මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිය, මෙය පරීක්ෂා කරන්ට බැරි නම්, අඩු ගණනේ ඇමතිතුමා ජනපදයේ කටයුතු පරීක්ෂා කිරීමේ සංචාරයකට එනවාය කියා දැනුම් දෙන්නය, එවිට නිලධාරීන් ඒ කටයුත්ත ඉටු කරාවිය කියා. මේ වන තෙක් ඒක වෙලා නැහැ. තමුන්නාන්සෙට මහවිලච්චියට එන්ට බැරි නම්, උප ඇමතිතුමාවත් කරුණාකර ලබන මාසෙදිවත් එනවාද කියා දැනගන්ට සතුටුයි. ඒ වගේම, නාච්චදුව ජනපදයෙ හීන්ඇල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. බී. රත්නායක මයා.]

පාරත් අබලන්වෙල. මෑතකදී බස් රථ ධාවනයත් නැවැත්තුව.—[බාධා කිරීමක්] දොඩවන්නෙ නැතුව ඉන්නව. ඉස්සරත් ඔය ප්‍රදේශයට වැස්ස. නමුත් කවදාවත් ලංගමය බස් සේවය නතර කළේ නැහැ. මොනයම් හේතුවක් නිසා හෝ වේවා දැන් ක්‍රම-ක්‍රමයෙන් අනුරාධපුර ආසනයෙ බස් පාරවල් යම්තම් අබලන් වනකොට බස් රථ ධාවනය නවත්වනව, බස්රථ ධාවනයට පාරවල් හොඳ නැත කියල. ඒ නිසා මා ඇමතිතුමාගෙන් ඉල්ලනව, මහවිලච්චිය ජනපදයට යන පාරත් හීන්ඇල පාරත් ඉක්මණින්ම සකස් කර දෙන හැටියට. මහවිලච්චිය ජනපද වාසීන්ගෙ කුපන් හාල් පවා ලොරිවලින් ගෙන යන්න සුමාන දෙකකින් බැරි වී තිබෙනව. ඒ නිසා මේ ගැන ඉක්මණින්ම සහනයක් ලබා දෙන හැටියට ඉල්ලනව.

අ. භා. 7.15

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரீ. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

ගරු කථානායකතුමනි, පළාත් පාලන ඇමතිතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ප්‍රශ්නයක් අහන්ට කැමතියි. මාතර ගරු මන්ත්‍රීතුමාත් (බී. වයි. තුඩාවේ මයා.) එවැනි ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. මහනුවර නගර සභාවෙ මැතිවරණය කල් දමන්ට හේතුව කුමක්ද කියා දැන ගන්ට කැමතියි. මහනුවර නගර සභා මැතිවරණය කල් දැමීම ගැන මහනුවර වාසීන් විමතියට පත් වී සිටිනව. කාගෙ වුවමනාවටද, මැතිවරණය කල් දැම්මෙ? නගර සභාව එවැනි ඉල්ලීමක් කර නැහැ. මීට විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සඳහා මහනුවර අයබදු ගෙවන්නන්ගෙ සංගමය අද රැස්වෙනව. මට හමුවුණා, එක්සත් ජාතික පක්ෂයෙ තරුණ සංගමයෙ සභාපතිවරයා. අද රැස්වීමේදී ඔහුත් කථා කරනව. මහනුවර නගර සභාවෙයි, ඒ රැස්වීම තබන්නෙ. එම රැස්වීමට සෑම පාක්ෂිකයෙක්ම වාගෙ එකතු වී, මහනුවර නගර සභා මැතිවරණය කල් දැමීම ගැන විරුද්ධත්වය දක්වනව. තත්ත්වය එහෙම නම්, මා ඇමතිතුමාගෙන් අහන්ට කැමතියි, කාගෙ වුවමනාවටද මේ මැතිවරණය කල් දමන්ට සිදුවුණේ කියා. මහනුවර නගර සභාවත්, අයබදු ගෙවන්නනුත් එවැනි ඉල්ලීමක් කර නැත්නම්, එක්සත් ජාතික පක්ෂයෙ තරුණ සංගමයත් මේකට විරුද්ධ නම් කාගෙ වුවමනාවටද, මේ මැතිවරණය කල් දමන්ට සිද්ධ වුණේ ?

සෑහෙන කාරණා තිබෙනවා නම් නගර සභා මැතිවරණයක් කල් දැමුවාට කිසිම වරදක් නැහැ. දීර්ඝ කාලයක් මමත් මේ නගර සභාවෙ හිටිය. නමුත් ඒ කාලය තුළ දී මෙවැනි කල් දැමීම් නොතිබුණු නිසා වැඩිපුර කාලයක් නගර සභාවේ සිටින්නට අපට ලැබුණෙ නැහැ. මට මතකයි, එක වරක් අවුරුදු 2 1/2යි නගර සභාවෙ ඉන්ට සිද්ධ වුණෙ. මට පෙනෙන හැටියට මේ වගෙ නීති ඇති වුණොත් පාර්ලිමේන්තුවෙත් අවුරුදු 10 ක් ඉන්ට කැමති වෙයි. ඒ නිසා, මේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාව මහනුවර නගර සභාවට කළේ ඇයිදැයි උප ඇමතිතුමාගෙන් දැනගන්ට කැමතියි.

අ. භා. 7.18

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

මම බොහොම කණගාටුවෙනව, කම්කරු ඇමතිතුමාට මගේ ප්‍රශ්නය ගැන කලින් දැනුම් දීමට බැරිවීම ගැන. වෙළඳ සේවක සමිතිය ගෙන යන වැඩ වර්ජනය සම්බන්ධයෙන් අද තිබෙන තත්ත්වය මා උප ඇමතිතුමාගෙන් දැනගන්ට කැමතියි. ස්වාමි පක්ෂය ගෙන යන ප්‍රතිපත්තිය ගැන මා විශේෂයෙන් කණගාටුව ප්‍රකාශ කරනව. මේ වැඩ වර්ජනය නිසා, මීට පෙර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සාකච්ඡාවලදී පැමිණි යම්යම් එකඟත්ව පවා අද සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කර තිබෙනව. මේ වැඩ වර්ජනය නිසා, කලින් එකඟවුණු ඉල්ලීම් පවා දීමට සූදානම් නැතැයි කියන තත්ත්වයට ස්වාමි පක්ෂය වැටී තිබෙනව. මම හිතනව, කම්කරු දෙපාර්තමේන්තුවවත්, කිසිම කම්කරු සමිතියක්වත් පිළිගන්න ප්‍රතිපත්තියක් නොවෙයි, ඒක. මම සන්තෝෂ වෙනව, ඇමතිතුමා පැමිණීම ගැන. මම හිතනව, මේ වැඩ වර්ජනය සම්බන්ධයෙන් අද තිබෙන තත්ත්වය ගැන ඇමතිතුමා අපට ඇතුම් දේය කියා. මේ සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් සෑහෙන වැඩ කොටසක් ගෙන යා යුතුයි. මෙම වැඩ වර්ජනය නිසා මුළු ලංකාවටම සෑහෙන පාඩුවක් සිදු වී තිබෙනව. මෙය එසේ මෙසේ වර්ජනයක් නොවෙයි. මේ අනුව මුදල් අංශයෙන් රජයට විශාල පාඩුවක් විඳින්ට සිදු වී තිබෙනව. අද ඒ පිළිබඳව සාකච්ඡා කළා නම්, මුදල් ඇමතිතුමාගෙන් මා ප්‍රශ්න කරන්ට බලා සිටිය අද රටේ පවතින මුදල් තත්ත්වය ගැන. අතිකූත් අමාරුකම් මැද පවතින මෙම වැඩ වර්ජනය නිසා රටට විශාල හානියක් සිදු වෙනව.

ගාමිනී කොරෙයා මහතා ප්‍රකාශ කර තිබෙනව, අද පවතින මුදල් තත්ත්වයේ අමාරුකම නිසා විදේශ රටවලින් මෙරටට ගෙන්වන අවශ්‍ය බඩුවලින් පවා සෑහෙන ප්‍රමාණයක් සීමා කරන්ට සිදු වේවිය කියා. ඒ පිටම මෙම තත්ත්වයත් දිගටම පැවතුණොත් ඉතා භයානක තත්ත්වයකට මේ රටට මුහුණ පාන්ට සිදු වෙනව. එම කම්කරු සමිතිය, එම වෙළඳ සේවක සමිතිය, ඉල්ලන ඉල්ලීම් ඉටු කර දීම පිළිබඳව හැකි ඉක්මනින් සුදුසු සම්මුතියකට එළඹෙනව නම් හොඳයි. මෙම ප්‍රශ්නය ඉතා ඉක්මනින් නිරාකරණය කළයුතු බවයි අපි කියන්නෙ. රාජ්‍ය ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව, කරුණා කර මේ පිළිබඳව මැදිහත් වී ක්‍රියා කරන්ටය කියා.

ලංගමය ගෙන යන ක්‍රියා පිළිවෙළ කොයිම ප්‍රතිපත්තියකටවත් ගැළපෙන්නෙ නැති දෙයක්. තමුන්නාන්සෙල අපෙන් ඇසුව, "ඇයි පත්‍ර රජය සතු කරන්නෙ; ඇයි තමුන්නාන්සෙල ප්‍රජාතන්ත්‍රවාදයට අනුව පත්‍රයක් පටන් නොගන්නේ ?" කියා. අපි දැන් පත්‍රයක් පටන්ගෙන තියෙනවා. අපි ගෙන යන ප්‍රතිපත්ති තමුන්නාන්සෙල පිළිගන්නෙ නැහැ. මම ඒ බව දන්නව. ඒ වගේම අපිත් පිළිගන්නෙ නැහැ, ධනපති පත්‍ර ගෙනියන ප්‍රතිපත්ති. නමුත් ඇයි, එම පත්‍රවලට දෙන වරප්‍රසාද අපේ පත්‍රවලට දීම තහනම් කර තිබෙන්නෙ ? අපේ පත්‍ර ගෙන යාම පවා තහනම් කර තිබෙනව. පාර්සල් වශයෙන් වේවා යම් පුද්ගලයෙක් එම පත්‍රය ගෙනියනව නම් ඒකත් තහනම් කරන්නෙ මොන ප්‍රතිපත්තියක් උඩද ? මොන ප්‍රජාතන්ත්‍රවාදයක් උඩද ?

තමුන්නාන්සෙල හැමදාම ඔතන සිටින්නෙ නැහැ. [බාධාකිරීම්] සිතනව ඇති අවුරුදු 9ක් ඉන්න. නමුත් තමුන්නාන්සෙල 9 මාසයක් සිටියොත් ඇති. ඔහොම කතා කරන අය මම හුඟක් දැකල තියෙනව. ඔය වැරදි මතය උඩ ගමන් කරන්ට එපා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය උඩ ගෙනියන්න වුවමනා නම් කරුණා කර සෑම දෙනාටම පොදු වේ සාධාරණයක් ඉටු කරන ලෙස මා කියා සිටිනව.

අ. භා. 7.22

**ප්‍රේමදාස මයා.**

*(திரு. பிரேமதாச)*

(Mr. Premadasa)

දඹුල්ලෙ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) මගෙන් ප්‍රශ්නයක් ඇසුව. එතුමා දැන් මෙහි නැහැ. [බාධාකිරීමක්] නමුත් පිළිතුරු දෙනව. මහනුවර නගර සභා මැතිවරණය ගරු ඇමතිතුමා අවුරුද්දකින් කල් දමා තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

මහනුවර නගර සභා සීමාව පුළුල් කිරීමට අවුරුදු කීපයක් මුළල්ලේම ඉල්ලීම් කර තිබුණා. මහනුවර නගර සභාවම කියා තිබුණා, එය කරන්ට සුදුසු නැති බව. ඒ මන්ද, මහනුවර නගර සීමාවට ඇතුළත් කරන්ට තිබෙන පේරාදෙණිය වැනි ප්‍රදේශ වලට ජල පහසුකම වැනි පහසුකම් දෙන්ට නගර සභාවට පුළුවන්කමක් නැති නිසයි. නමුත් මහනුවර ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන නිසා දැන් පුළුවන් වී තිබෙනව ඒ නගර සීමාවට ඇතුළත් කළ යුතු ප්‍රදේශවලට ජල සම්පාදනය වැනි දේ කර දෙන්ට. එපමණක් නොවෙයි, මහ නුවර නගර සභාවට ආර්ථික ප්‍රශ්නවලටත් මුහුණ පාන්න වී තිබෙනව. අවුරුද්දකට රුපියල් ලක්ෂ 15ක් විතර ණය වෙනු වෙන් සහ පොලී වෙනුවෙන් එහෙම ගෙවන්න සිදු වෙනව. එම නිසා ඒ සඳහා වැඩිපුර ආදායම් උපයන්ටත් මහනුවර නගර සභාවට සිදු වී තිබෙනව. නගර සභාවට අයිති සීමාව——

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

නාම යෝජනා දින නියම කළේ ?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

එය මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් කරන දෙයක්. මෙය අමාත්‍යාංශයෙන් කරන දෙයක්. [බාධාකිරීම්] නාම යෝජනා දින නියම කිරීමත් මැතිවරණ කටයුතු කිරීමත් මැතිවරණ දෙපාර්තමේන්තුවෙන්—

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

දකුණු අතින් කළත් වම් අතින් කළත් වෙනසක් තියෙනවද ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

අපි බබ්බු නොවෙයි.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

කවුරුත් දන්නව බබ්බු නොවන වග.

ගරු කථානායකතුමනි, ඒ නිසා කොට්ඨාශ සීමාවල් නියම කිරීමේ කාරක සභාවක් පත් කර නැවත කොට්ඨාශ බෙදීම ආදී කටයුතු සඳහා ඒ මැතිවරණය කල් දමන්නට සිදු වුණා. මේ කරුණ ගැන නොදන්නා නිසා යම් යම් විරුද්ධතාවයන් ඇති වේය කියා දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාමත් කිව්ව. එය දේශපාලන හේතුවක් උඩ සිදු නොවන්නක් බව එයිනුත් පෙනෙනව. එක්සත් ජාතික පක්ෂයේ උදවියත් එයට විරුද්ධව සිටින බව එතුමා කිව්ව.

දෙවුන්දර සුළු නගර සභාව ගැන කියන්න තිබෙන්නෙත් එයයි. එහිත් සීමා වෙනස් කරන්නය කියා ඒ සුළු නගර සභාව කීප විටක්ම ඉල්ලා තිබෙනව. එහෙත්, එයට අවස්ථාවක් ලැබුණේ නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

එතනත් නාමයෝජනා දිනයෙන් පසු වයි.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඒ ගැන මා කිව්වනෙ. එය මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් කරන දෙයක්.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

පුදුමයි නේද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රේමදාස මයා.**

*(திரு. பிரேமதாச)*

(Mr. Premadasa)

ඒ කාරණය උඩම දෙවුන්දර සුළු නගර සභාවේ කාලයත් දික් කළ බව මා තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි.

**ගරු එම්. එච්. මොහමඩ් (කම්කරු, රැකී රක්ෂා හා නිවාස ඇමති)**

*(கௌரவ எம். எச். முகம்மது—தொழில், தொழில்வசதி, வீடமைப்பு அமைச்சர்)*

(The Hon. M. H. Mohamed—Minister of Labour, Employment and Housing)

With regard to the question of the strike by the C. M. U. raised by the hon. Member for Yatiyantota (Dr. N. M. Perera), I do not at this stage wish to make a long statement, while negotiation is already going on between the C.M.U. and the Federation. I can assure the House that I feel confident that the strike will be settled in a day or two.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

රජයේ නිලධාරියකුගේ වැඩ තහනම් කිරීමේ බලය තිබෙන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවටයි. ඒ ගැන වගකීමක් ඇමතිවරයකුට නැහැ. එහෙත්, තීරණයක් නැතිව මෙතරම් දීර්ඝ කාලයක් යම් පුද්ගලයකුගේ වැඩ තහනම් කර තිබීම යුතු නැත කියන එක මාත් පිළිගන්නවා. ඒ නිසා ඒ කරුණ ගැන හෙටම අගමැතිතුමාට දන්වන්නම්.

**අනිල් මුණසිංහ මයා.**

*(திரு. அனில் முனசிங்க)*

(Mr. Anil Moonesinghe)

පොලිසිය සහ ලංගමය ගැන තවත් ප්‍රශ්නයක් මා රාජ්‍ය ඇමතිතුමාගෙන් ඇහුව.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayewardene)

පොලිසිය එහෙම ක්‍රියාවක් කළාද කියා මා දන්නෙ නැහැ. ඒ ගැන විභාග කර බලන්නම්.

**අනිල් මුණසිංහ මයා.**

*(திரு. அனில் முனசிங்க)*

(Mr. Anil Moonesinghe)

ප්‍රශ්නය ඒක නොවෙයි. ගරු ඇමතිතුමා අහගෙන හිටියෙ නැහැනෙ. මා ඇසුවේ මෙන්න මේ විධියේ චක්‍ර ලේඛනයක් යවා තිබෙනවාය, ඒ ගැන වැඩ කරන්නය කියා පොලිසියට නියම කර තිබෙනවාද කියලයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayewardene)

ඒ ගැන පරීක්ෂා කර බලන්නම්.

**ඩී. බී. වෙලගෙදර මයා. (ජනසතු සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டி. பி. வெலகெதர—தேசியமய சேவை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. B. Welagedera—Parliamentary Secretary to the Minister of Nationalized Services)

ගරු අගලවත්තේ මන්ත්‍රීතුමා රහස් චක්‍ර ලේඛනයක් ගැන ප්‍රශ්න කළා. එය මටත් රහසක්. ඒ ගැන සොයා බලන්නම්. හැබැයි, මේ රහස් පිට වෙන්නෙ ඒ පැත්තටයි; අපට නැහැ. [බාධා කිරීමක්] ඒ චක්‍ර ලේඛනය කුමක්ද කියා බලන්න මා කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අනිල් මූණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

මේ තිබෙන්නෙ, කියවා බලන්න.

**වෙලගෙදර මයා.**
*(திரு. வெலகெதர)*
(Mr. Welagedera)

ඒ ගැන පරීක්ෂණයක් පවත්වා පසුව ඒ මන්ත්‍රීතුමාට දන්වන්නම්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I have got a report on the two matters raised by the hon. Member for Nikaweratiya (Mr. M. Tennakoon).

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

සිංහලෙන් කියන්න.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ස්ක්‍රාදර් මහත්මයා විසින් සින්නක්කර ඉඩම් අක්කර 7 ක් ගොවිතැන් කරනව. ඒ ගොවිතැන කිරීම සඳහා ඔහුගේ වියදමමින්ම වැවක් බැඳලා ඇළකුත් කපා තිබෙනව. ඒ ඇළෙන් වෙන කාටවත් ප්‍රයෝජනයක් නැහැ. ඒ ඇළට යාබදව අක්කර 8 ක ආණ්ඩුවේ ඉඩම් කෑල්ලක් තිබෙනව. ඒ ඉඩම් කෑල්ලත් ඒ මහත් මයා ඉල්ලුව. [බාධා කිරීමක්] ඒ ඇළ කපා හුඟ කාලයක් වෙනව. කොයි කාල යේ කැපූ ඇළක්ද කියා මා දන්නෙ නැහ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ඒ මහත්මයා වියදම් කර තිබෙන මුදල ගෙවා ඒ වැව ආණ්ඩුවට පවරා ගෙන ගම් මුන්ට ඉඩම් දෙන්න.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ මහත්මයා මේ ඇළ කපා හුඟ කාල යක් වෙනව. ඒ මහත්මයා පුත්තලමේ ඒජන්තවරයාගෙන් මේ ඉඩම් කෑල්ල ඉල්ලා තිබෙනව. මෑතක සිට ඒ මහතාගේ කලින් සිටි මුරකාරයකු මේ ඉඩමෙන් කොටසක් බලහත්කාරයෙන් බුත්ති විඳින අතර ඒ මහතාට ඇළ පාවිච්චි කිරී මට ඉඩ නොදෙන බවට තර්ජනය කර තිබෙනවා. මේ ප්‍රශ්නය නිරාකරණය වන තුරු ඒ මහතාට තාවකාලික බල පත්‍රයක් දෙන ලෙස ඒජන්තතුමාට උපදෙස් දී තිබෙනවා.

ගම්වාසීන්ගේ අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් ඉඩම් මේ ප්‍රදේශයේ තිබෙනවා. මේ අතර ඒ ප්‍රදේශයේ වැව් කීප යක් බඳින්නට කටයුතු කරගෙන යනවා. ඒ වැව් බැන්දාම සෑම දෙනාගේ ම අවශ්‍යතා ඉෂ්ට කරන්නට පුළුවන් වෙනවා ඇති.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ඉස්සෙල්ල ගැමියන්ගෙ අයිතිවාසිකම් ආරක්ෂා කරල ඊට පස්සෙ ඒ මහතාගෙ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ ගම්වල වැව් බඳිනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

කවදද ඒ වැඩ කෙරෙන්නෙ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

It will be quicker if I read the report.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

On the application for land by Mr. F. R. C. Schrader, the report states as follows :

"Mr. Schrader was cultivating an extent of 4 acres of private land in paddy. For irrigating this land he has repaired and maintained the tank as well as the channels which feed these fields. The channel does not serve the fields belonging to any other party. He has made an application for a preferential lease for an extent of 8 acres Crown land which includes the channel and the land alongside it, to the G. A., Puttalam. He has also been enjoying this right for a long time and improvements have been done at a heavy cost. The G. A. has confirmed it and also recommended the lease. An ex-watcher of Mr. Schrader has forcibly occupied a portion and threatened not to allow Mr. Schrader to use the channel. The G. A. has been instructed to issue an annual permit for the land pending ultimate disposal of this question as approved by the Hon. Minister.

There is sufficient land to meet the needs of the villagers of the area. Moreover, the restoration of breached tanks which are in the D. A. C. priority list will make available for alienation sufficient land, and priority in alienation will be given to the villagers of Pahala Kuraketiyawa and Murukkuwatawana. The decision to lease this land was taken as Mr. Schrader has spent a considerable amount of money for the restoration of the tank and the maintenance of the channel and that it would not be reasonable to refuse the grant of the lease, under these circumstances."

With regard to the question raised about the land leased in Nanneriya the position is as follows :

Messrs Emjay Estates Ltd., have been given an extent of 500 acres from Nanneriya area in the Rajawanni D. R. O's Division of Puttalam District under the Special Leases Board for the cultivation of subsidiary food crops. The land leased originally formed part of a forest reserve and was released by the Conservator of Forests for leasing under the Special Leases scheme. No land at all had been leased from any area under the control of the Government Agent. The 500 acres have been leased after very careful investigation as to whether any village interests are involved. There is more than enough Crown land left in this area for the needs of the villagers and for future village expansion.

Within the area leased to the company two extents of about 12 acres and 10 acres each have been cleared by some villagers. Of these the first 12 acres are a clearing for chena cultivation. Only some small trees and under-growth have been cleared and no big trees have been felled. This was only a preliminary clearing for a chena. The villagers concerned were more than willing to accept compensation for the jungle clearing at the rate of Rs. 100 per acre which is also the standard rate prevailing in the area for jungle clearing. Already four people have been paid by the company Rs. 400 for clearing 4 acres and arrangements have been made by the Government Agent, Puttalam, to pay the balance Rs. 700 to the others. Regarding the latter 10 acres the villagers have felled and cleared the area but no stumping or ridging has been done. They have admitted that they have done a rain-fed paddy chena once. These people too are prepared to accept Rs. 125 per acre for jungle clearing as compensation.

However, when this matter was brought to my notice, I not only instructed the Government Agent to look into the matter immediately, but also sent an officer from the Ministry to look into the circumstances under

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

which the land which had been ‘ chenared ’ by the villagers was given to this company. Action is being pursued. The Government Agent, Puttalam, has already been instructed to alienate extents of land to these villagers according to their needs.

The villagers have not suffered in any way. These very same villagers and the others from the surrounding villages have already found very gainful employment in this company which is doing its best to bring a fair extent of land under cultivation in subsidiary foodcrops.

**එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන්, කථානායක තුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

*அப்போது பி. ப. 7.30 மணியாகி விடவே சபா நாயகர் அவர்கள் வினா விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்கள்.*

*And it being 7.30* P.M., MR. SPEAKER *adjourned the House without Question put.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, 1966 නොවැම්බර් 7 වන සඳුදා අ. භා. 2 වන තෙක් කල් ගියේය.**

*அதன்படி சபை 1966 நவம்பர் 7 திங்கட்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப் பெற்றது.*

*Adjourned accordingly until 2* P.M. *on Monday, 7th November 1966.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

**Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500, Colombo 1.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org